| පටුන | පිටු අංකය |
| --- | --- |
| කොමිෂන් සභා තොරතුරු | 02 |
| දැක්ම හා මෙහෙවර | 03 |
| අධ්‍යක්ෂ ජනරාල්ගේ වාර්තාව | 04 |
| හැදින්වීම | 08 |
| තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ සංවිධාන ව්‍යුහය | 09 |
| කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය | 11 |
| පාලන හා මුදල් අංශය | 14 |
| සැලසුම් හා පර්යේෂණ අංශය | 24 |
| පාඨමාලා පිළිගැනීම් හා පුහුණු සම්මත අංශය | 44 |
| ජාතික වෘත්තීය සුදුසුකම් අංශය | 53 |
| තොරතුරු පද්ධති අංශය | 75 |
| ජාත්‍යන්තර සහයෝගීතාවය | 93 |
| විශේෂ වැඩසටහන් | 100 |
| මූල්‍ය ප්‍රකාශ | 103 - 138 |
| මූල්‍ය ක්‍රියාකාරීත්ව ප්‍රකාශය | 103 |
| මූල්‍ය තත්ව ප්‍රකාශය | 104 |
| ශුද්ධ වත්කම් වෙනස් වීම් පිළිබඳ ප්‍රකාශය | 105 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 106 |
| ශේෂ පත්‍රය සටහන් | 107 |
| මූල්‍ය ක්‍රියාකාරීත්ව ප්‍රකාශ සටහන් | 110 |
| මූල්‍ය තත්ව ප්‍රකාශ සටහන් | 114 |
| මූල්‍ය ක්‍රියාකාරීත්ව ප්‍රකාශ උප සටහන් | 116 |
| මූල්‍ය තත්ව ප්‍රකාශ උප සටහන් | 122 |
| මූල්‍ය තත්ව ප්‍රකාශ උප ලේඛණ | 125 |
| මූල්‍ය තොරතුරු උපුටා දැක්වීම | 133 |
| විගණකාධිපති වාර්තාව | 139 |
| විගණකාධිපති වාර්තාවේ පැහැදිලි කිරීම හා පිළිතුරු | 145 |

# කොමිෂන් සභා තොරතුරු

| | |
|---|---|
| ආයතනය | තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව |
| අමාත්‍යාංශය | යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය |
| ලිපිනය | තුන්වන මහල, නිපුණතා පියස,<br>354/2 ඇල්විටිගල මාවත,<br>කොළඹ - 05 |
| ඊමේල් ලිපිනය | info@tvec.gov.lk |
| වෙබ් අඩවිය | www.tvec.gov.lk |
| දුරකථන අංකය | 011 - 5849291 |
| ෆැක්ස් අංකය | 011 - 2555007 |
| විගණකවරු | විගණකාධිපති,<br>විගණකාධිපති දෙපාර්තමේන්තුව,<br>නිදහස් චතුරශ්‍රය,<br>කොළඹ - 07. |
| බැංකු කරුවන් | මහජන බැංකුව,<br>වයි.එම්.බී.ඒ. ශාඛාව,<br>බොරැල්ල. |

**දැක්ම**

රැකියා වෙළෙඳපොළට ගැළපෙන හා ගුණාත්මක තෘතීයික හා වෘත්තීය අධ්‍යාපනය අපේක්ෂා කරන සියළු දෙනාට ලැබීම අපගේ දැක්ම වේ.

**මෙහෙවර**

**අභියෝගාත්මක ලෝක වෙළඳ අවශ්‍යතා හා සමාජ- ආර්ථික අරමුණු ඉටුවන කාර්යක්ෂම,**
**ඵලදායී හා ගුණාත්වය සහතික කල තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන ක්‍රමයක් ස්ථාපිත කර පවත්වාගෙනයෑම අපගේ මෙහෙවර වේ.**

## අධ්‍යක්ෂ ජනරාල්ගේ වාර්තාව

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ කාර්යභාරය ඉටුකිරීමේදී පෙර වර්ෂ මෙන්ම 2013 වර්ෂයේද අභියෝග වලින් පිරි වර්ෂයක් ලෙස හැඳින්විය යුතුය. කොමිෂන් සභාව ක්‍රියාත්මක වන්නේ 1990 අංක 20 දරණ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පනතේ හා එහි සංශෝධිත පනත වන 1999 අංක 50 දරණ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන (සංශෝධිත) පනතේ අරමුණු ඉටුකර ගැනීම සඳහාය. කාර්මික අධාපන හා වෘත්තීය පුහුණු ක්ෂේත්‍රෙය් ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන්නාවූ නෛතික රාමුව සකස්කරගැනීම පිණිස පෙර වර්ෂයේ සිටම ක්‍රියාත්මකවූ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පනත සංශෝධනය කිරීමේ ක්‍රියාවලිය යම්දුරකට ඉටුකරගැනීමකට හැකියාවක් ලැබුණු අතර, ඒ අනුව කෙටුම්පත් කරන ලද සංශෝධිත පනත නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ සඳහා ඉදිරිපත් කිරීමට 2013 වර්ෂය තුළදී හැකිවිය. එම දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලද වහාම සංශෝධිත පනත පාර්ලිමේන්තු අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට නියමිතය.

කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රෙයේ ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂයෙන් ඉවහල්වූ නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය හා කාර්මික අධ්‍යාපන සංවර්ධන ව්‍යාපෘතිය මගින් ක්‍රියාත්මක කරන ලද කටයුතු තවදුරටත් ව්‍යාප්ත කරමින් පුළුල් ලෙස ඉටුකිරීම සඳහා ලෝක බැංකුව හා ආසියානු සංවර්ධන බැංකුව එක්ව මුල්‍යාධාර සැපයීමට නියමිත නව ව්‍යාපෘතියේ සැලසුම් කටයුතු වලට සක්‍රීය ලෙස දායකවීමට 2013 වර්ෂයේදී කොමිෂන් සභාවට හැකිවිය. මෙම නව ව්‍යාපෘතියේ සංවර්ධන කටයුතු 2014 වර්ෂයේ මැදභාගයේ සිට ක්‍රියාත්මක වීමට නියමිතය.
ශ්‍රී ලංකාවේ දියුණුවන ආර්ථිකයට අවශ්‍යවන නිපුණ ශ්‍රමිකයින් සැපයීමේ අභියෝගයට මුහුණදෙමින් නිෂ්පාදන හා සේවා අංශයේ ආයතන වල මධ්‍ය කළමණාකරන මට්ටමේ සේවානියුක්තිකයන් සැපයීම පිණිස අළුතින් ජාතික වෘත්තීය සුදුසුකම් 5 සහ 6 මට්ටමේ ඩිප්ලෝමා පාඨමාලා 22ක් සංවර්ධනය කිරීමේ කඩිනම් ව්‍යාපෘතියට කොමිෂන් සභාව සක්‍රීය ලෙස දායකවිය. ඒ යටතේ නව ඩිප්ලෝමා 8ක් සංවර්ධනය කිරීම මුළුමනින්ම කොමිෂන් සභාව වෙත අමාත්‍යාංශය විසින් පවරන ලදී . ඒයටතේ අදාළ ජාතික නිපුණතා සම්මත හා විෂයමාලා සංවර්ධනය කිරීම මාස 5ක් වැනි කෙටිකාලයක් තුළ ඉටුකිරීමට හැකියාව ලැබිණ. අනෙකුත් ආයතන මගින් සංවර්ධනය කරන ලද ඩිප්ලෝමා මට්ටමේ ජාතික නිපුණතා සම්මත හා විෂයමාලා නිරීක්ෂණයකර අනුමත කිරීමද මෙම වර්ෂය තුළදී සිදුවිය. මේ ආකාරයට සංවර්ධනය කරන ලද ඩිප්ලෝමා පාඨමාලා අළුතින් හඳුන්නාදෙන විශ්වවිද්‍යාල විද්‍යාතන(University Colleges ) තුළින් ක්‍රියාත්මක කිරීමට නියමිතය. මීට අමතරව, ජාතික වෘත්තීය සුදුසුකම් 1-4 මට්ටමේ නිපුණතා සම්මත 7ක් අනුමත කළ අතර, නිපුණතා සම්මත 5ක් සිංහල භාෂාවටද, නිපුණතා සම්මත 10ක් දෙමළ භාෂාවටද පරිවර්තනය කරන ලදී. වැඩලොව සඳහා ජාතික නිපුණතා සම්මත හා ජාතික නිපුණතා සුදුසුකම් හඳුන්වාදීමේ වැඩමුළු දෙකක්ද 2013 වර්ෂය තුළදී පැවැත්වීමට හැකිවිය. ජාතික වෘත්තීය සුදුසුකම් ලබාදීම පිළිබඳ අවශ්‍ය උපදෙස් හා විධිවිධාන ලබාදීම පිණිස නිර්දේශ ඇතුළත් චක්‍රලේකයක්ද 2013 වර්ෂය තුළදී නිකුත් කරන ලදී.

ජාතික වෘත්තීය සුදුසුකම් ලබාදීම පිණිස කරණු ලබන ඇගයීම් විධිමත් කිරීම සඳහා යෝජිත නව අංශයට අවශ්‍ය සේවකමණ්ඩල අවශ්‍යතාවය සඳහා අනුමැතිය ලබාගැනීමට 2013 වර්ෂය තුළදී හැකිවිය. අදාළ බඳවාගැනීම් සම්බන්ධව කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නිරීක්ෂණද ලබාගෙන එම බඳවාගැනීම් ඉටුකරගැනීම සඳහා අනුමැතිය ලබාගැනීමට කළමණාකරන සේවාදෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරනලදී. එම අනුමැතිය ලබාගැනීමෙන් පසුව අදාළ බඳවාගැනීම් සිදුකිරීමට කටයුතු කරනු ලැබේ. කොමිෂන් සභාවේ අනෙකුත් තනතුරු සඳහා බඳවාගැනීම් නිසි ලෙස සිදුකිරීමට 2013 වර්ෂය තුළදී කටයුතු කරනලදී.
ජාතික වෘත්තීය සුදුසුකම් සහතික නිකුත් කිරීමේ ඒකකය මගින් 2013 වර්ෂය තුළදී සහතික 22855ක් නිකුත් කිරීමට හැකිවිය. ඒයටතේ පෞද්ගලික අංශයේ පුහුණු ආයතන වලට වැඩිම සහතික සංඛ්‍යාවක් නිකුත්කරන ලදී. 2013 වර්ෂය අවසාන වනවිට ජාතික වෘත්තීය සුදුසුකම් සහතික 90958ක් නිකුත්කර තිබුණි.

සැලසුම් හා පර්යේෂණ අංශයේ කටයුතු අතරින් ලියාපදිංචි පුහුණු ආයතන සඳහා මූලාධාර සැපයීම මෙම වර්ශයේදී සිදුවිය. ඒ යටතේ රුපියල් මිලියන 4.1ක් රාජ්‍ය,පෞද්ගලික හා රාජය නොවන සංවිධාන අංශයේ ලියාපදිංචි පුහුණු ආයතන 21 ක් අතර බෙදාහරිනු ලැබීය. ඒ යටතේ අදාල පාඨමාලා ප්‍රතීතනය කර ජාතික වෘත්තීය සුදුසුතම් ලබා දීමට හැකියාව ලැබේ. පෙර වර්ෂවල ලබාදුන් මූල්‍යාධාර නිසිලෙස භාවිතාකර ඇත්දැයි විමර්ශනය කිරීමේ වැඩසටහන ද 2013 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලදී. වෘත්තීය පුහුණු සැලසුම් සකස්කිරීමේ වැඩසටහන යටතේ ප්‍රවාහන ක්ෂේත්‍රයේ සැලැස්ම සකස්කිරීම පිළිබඳව වැඩමුලු කිපයක්ද අදාළ වර්ෂයේදී පැවැත්විය. පෙර වර්ෂවල සකස්කරන ලද වෘත්තීය පුහුණු සැලසුම් යාවත්කාලීන කිරීමේ වැඩසටහන යටතේ කර්මාන්ත වෘත්තීය පුහුණු සැලසුම් 10 ක මානව සම්පත් අවශ්‍යතාවය ඇස්තමේන්තු තරන ලදී. පළාත් වෘත්තීය පුහුණු සැලසුම් පිළියෙල කිරීමේ වැඩසටහන් යටතේ වයඹ පළාත් සැලැස්ම අවසන් කරන ලද අතර ඒ සඳහා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගන්නා ලදී. එසේම නව පළාත් 3 ක් සඳහා පළාත් වෘත්තීය පුහුණු සැලසුම් සකස්කිරීම ආරම්භ කරන්නට යෙදුනී. ඒ යටතේ බස්නාහිර, ඌව හා මධ්‍යම පළාත් සැලසුම් සකස්කිරීම ආරම්භ විය. පර්යේෂන කවයේ කටයුතු 2013 වර්ෂයේදී ද ඉටු වූ අතර 2012 වර්ෂයේ ආරම්භ කරන ලද පර්යේෂණ අධ්‍යන 09 ක් 2013 වර්ෂයේ පවත්වන ලද පර්යේෂණ සමුළුව තුලින් එළිදක්වන ලදී. සුපුරුදු පරිදී කොමිෂන් සභාවේ සංයුක්ත සැලැස්ම යාවත්කාලීන කරනලද අතර ඒ අනුව 2014 වර්ෂයේ වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම සකස්කර අනුමැතිය ලබා ගන්නා ලදී.

වෘත්තීය පුහුණුවේ ගුණාත්මකභාවය ආරක්ෂාකිරීමේ වැඩසටහන යටතේ පුහුණු ආයතන 256 ක් ලියාපදිංචි කිරීමට 2013 වර්ෂයේදී හැකිවිය. 2013 වර්ෂයේ අපේක්ෂා කරන ඉලක්කය පුහුණු ආයතන 225 ක් ලියාපදිංචි කිරීමයි. ඒ අනුව, මෙම ප්‍රගතිය අදාල ඉලක්කය අභිබවා යාමක් විය.
ලියාපදිංචිය අලුත් කිරීම යටතේ පුහුණු ආයතන 250 ක ලියාපදිංචිය අලුත් කිරීමට අපේක්ෂා කළ අතර එම ඉලක්කය ඒ ආකාරයෙන්ම ඉටුකර ගැනීමට හැකි විය.

මේ සඳහා එම අංශයේ නිලධාරීන් වෙහෙස නොබලා කටයුතු කළ අතර ඒ සඳහා ඔවුන්ට මාගේ ප්‍රශංසාව හිමි වේ. පුහුණු ආයතන ලියාපදිංචිය ප්‍රවර්ධනය කිරීම සඳහා අදාල වැඩමුළු පැවත්වීම හා ජාතික පුවත්පත්වල දැන්වීම් පළකරමින් මහජනතාවට නිසි මග පෙන්වීම් ද 2013 වර්ෂයේදී සිදුකරන ලදී. පාඨමාලා ප්‍රතීතන වැඩසටහන් යටතේ පාඨමාලා 557 ක් ප්‍රතීතනය කිරීමට 2013 වර්ෂයේදී හැකිවූ අතර ඒ අනුව ප්‍රතීතනය කරනලද පාඨමාලා සංඛ්‍යාව 1601 දක්වා ඉහල යන ලදී. ඒ යටතේ පුද්ගලික අංශයේ පාඨමාලා 426 ක් විය. මෙම තත්වය අගය කළ යුතු අතර පෞද්ගලික අංශයේ පාඨමාලාවල ගුණාත්වය සහතික කිරීම අත්‍යවශ්‍ය හා ප්‍රමුඛ කාර්යක් ලෙස හැඳින්විය යුතුය. ඒ අතරම, පෙර වර්ෂ වලදී ප්‍රතීතනය කරන ලද පාඨමාලා 151 ක ප්‍රතීතනය අලුත්කරන ලදී. පුහුණු ආයතන වල තත්ව කළමනාකරන පද්ධති ස්ථාපිත කිරීම යටතේ තත්ව අත්පොත් 3 ක් අනුමැතිය සඳහා ලැබුණු අතර ඒ පිළිබඳ නිරීක්ෂණ අදාළ ආයතන වෙත ඉදිරිපත් කරන ලදී. විදේශරැකියා අවශ්‍යතා සඳහා පුහුණු ආයතන වල ලියාපදිංචිය සනාථ කිරීමේ ලිපි 425 ක් 2013 වර්ෂයේදි නිකුත් කරන ලදී. තනතුරු සඳහා බඳවා ගැනීමේදී අවශ්‍ය වන වෘත්තීය පුහුණු සහතික සනාථ කිරීමේ ලිපි 375 ක් ද 2013 වර්ෂයේදී නිකුත් කිරීමට හැකි විය. ආදායම් උත්පාදනය කිරීම යටතේ සමස්තයක් ලෙස පාඨමාලා ප්‍රතීතන හා ආයතන ලියාපදිංචිය තුළින් 2013 දී රුපියල් මිලියන 3.8 ක් උපයාගැනීමටද කොමිෂන් සභාවට හැකිවිය.

ප්‍රතිපත්ති හා සැලසුම් සකස්කිරීමට මෙන්ම තීරණගැනීම පහසුකිරීම පිණිස අවශ්‍ය වන ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු අඩංගු අර්ධ වාර්ෂික ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු ප්‍රකාශනය හා වාර්ෂිකව නිකුත්කරන වෘත්තීය පුහුණු පාඨමාලා පිළිබඳ තොරතුරු ඇතුලත් වෘත්තීය පුහුණුවට මග (TVET Guide 2014) ප්‍රකාශනය නිකුත් කිරීමට කොමිෂන් සභාවේ තොරතුරු පද්ධති අංශයට හැකිවිය. ඒ අතරම, කොමිෂන් සභාවේ පුවත් ලිපිය සකස් කිරීමටත් අනෙකුත් ශ්‍රම වෙළෙඳපොළ තොරතුරු ප්‍රකාශන සකස් කිරීමට 2013 වර්ෂයේදී හැකි විය. ඒ අතරම, කොමිෂන් සභාවේ වෙබ් අඩවිය යාවත්කාලීන කිරීමත් අනෙකුත් අංශවලට අවශ්‍ය පරිගණක පද්ධති සංවර්ධනය කිරීම හා පරිපාලනය කිරීමද කරන ලදී.

2013 වර්ෂයේදි කොමිෂන් සභාව අභියෝගාත්මකව ක්‍රියාත්මක කරන ලද තවත් වැඩසටහනක් වූයේ "Touch Your Future"ලෙස නම් කරන ලද ජාතික නිපුණතා හා නව නිර්මාණ තරගයයි. මේ යටතේ රාජ්‍ය අංශයේ ආයතන වල මූලික වටයේ තරග අධීක්ෂණය කිරීමත් පෞද්ගලික අංශයේ මූලික වටයේ තරග පැවත්වීමත් කොමිෂන් සභාවට පැවරින. එසේම තරගය සඳහා අවශ්‍ය මාධ්‍ය ව්‍යාපාරය මෙහෙයවීමද කොමිෂන් සභාව වෙත පවරන ලදී. අදාල අයදුම්පත් කැඳවා මූලික තරගවලින් සමත් වූ තරගකරුවන් පළාත් තරග වලට කැඳවා එම තරග සංවිධානය කර පැවැත්වීම කොමිෂන් සභාව මගින් ඉටු කෙරින. මේ සඳහා සැලකිය යුතු උත්සහයක් හා කැපවීමක් කොමිෂන් සභාවේ සියළුම නිලධාරීන් හා සහයක කාර්ය මණ්ඩලය විසින් ඉටුකරන ලදී. ඒ පිළිබඳව කොමිෂන් සභාවේ සියළු කාර්යමණ්ඩලයට මාගේ ප්‍රශංසාව හිමිවේ.

ශ්‍රී ලංකාවේ කාර්මික අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍ර යේ නියාමන ආයතන ලෙස කොමිෂන් සභාව ජාත්‍යන්තර නියෝජිත ආයතන ගණනාවක් සමග ඵලදායී සබඳතා පවත්වාගෙන යයි. මෙහිදී, 2013 වර්ෂයේදී යුනෙස්කෝ යුනිවොක් සම්බන්ධතා ජාලය සවිබල ගැන්වීමේ කාර්යන්හී නිරත විය. මේ සඳහා පහසුකම් සැපයීම පිණිස යුනෙස්කෝ යුනිවොක් ශාඛාවක් කොමිෂන් සභා කාර්යාලයේ ස්ථාපිත කරන ලදී. කාර්මික අධ්‍යාපන හා වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ දැනුම හුවමාරු කරගැනීම පිණිස පකිස්ථානයේ ඉහළ මට්ටමේ නිලධාරීන් කණ්ඩායමක් කොමිෂන් සභාවේ වැඩමුළු ගණනාවකට සහභාගී විය. කාර්මික අධ්‍යාපන හා වෘත්තීය පුහුණු ක්ෂේත්‍ර යේ දුරස්ථ හා මිශ්‍ර අධ්‍යාපනය සිසුන් අතර ප්‍රචලිත කිරීම සඳහා ඉලෙක්ටොනික් අධ්‍යාපනය (E-learning) මත පදනම් වූ පාඨමාලා සඳහා තත්ව සහතික ලබාදීමට ක්‍රමවේදයක් සකස්කරන්නට යෙදුණි. යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ උපදෙස් යටතේ විවෘත හා දුරස්ථ අධ්‍යාපන වැඩසටහනක් පොදු රාජ්‍ය මණ්ඩල රටවල් සඳහා සංවර්ධනය කිරීමට යුනිවොක් මධ්‍යස්ථානය හරහා කොමිෂන් සභාවට හැකි විය. සිංගප්පූරුවේ තෙමාසෙක් පදනමේ සහයෝගය ඇතිව ශ්‍රී ලංකාවේ කාර්මික අධ්‍යාපන හා වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයේ පුහුණුකරුවන් සඳහා හැකියා වර්ධන වැඩසටහනක් සංවිධානය කිරීමට හා ඒ සඳහා සහභාගී වීමට කොමිෂන් සභාවට 2013 වර්ෂයේදී හැකියාව ලැබුණි.

සමස්තයක් ලෙස 2013 වර්ෂය කොමිෂන් සභාවේ සියළුම කාර්යමණ්ඩල සමාජික සමාජිකාවන්ට කාර්යබහුල වර්ෂයක් වූ අතර, පවරන ලද සියළු වගකීම් සතුටුදායක ලෙස සපුරාලීමට ඔවුනට හැකියාව ලැබුණි. ඒ පිළිබඳව මාගේ අවංක ගෞරවාදරය ඔවුනට නිතැතින්ම හිමි වේ.



**ආචාර්ය එස්.ඩී.ආර්. පෙරේරා**
අධ්‍යක්ෂ ජනරාල්

## 1.0 හැඳින්වීම

1990 අංක 20 දරණ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනත යටතේ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව ස්ථාපනය කරන ලද අතර 1999 අංක 50 දරණ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන (සංශෝධන) පනත මඟින් 1999 දෙසැම්බර් 16 දින සිට ව්‍යවස්ථාපිත මණ්ඩලයක් ලෙස ක්‍රියාත්මක වේ.

කොමිෂන් සභාවේ පොදු අරමුණු පහත සඳහන් පරිදි වේ.

(අ) ආර්ථිකයේ මිනිස් සම්පත් අවශ්‍යතාවලට සරිලන අයුරින් සියලුම මට්ටම් වල තෘතීයික අධ්‍යාපනය හා වෘත්තීය අධ්‍යාපන ක්‍රමය සැලසුම් කිරීම, සම්බන්ධීකරණය සහ සංවර්ධනය කිරීම.

(ආ) සහතික පත්‍ර සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ඇතුළුව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන ප්‍රධානයන් පිරිනැමීම සඳහා ජාතික වශයෙන් පිළිගත් ක්‍රමයක් සංවර්ධනය කිරීම, සහ

(ඇ) තෘතීයික අධ්‍යාපනය හා වෘත්තීය අධ්‍යාපනය සලස්වන ශිල්පායතන, නියෝජ්‍ය ආයතන සහ වෙනත් සියලු ආයතනවල ශාස්ත්‍රීයය හා පුහුණුවීම් සම්මතයක් පවත්වාගෙන යාම.

## 2.0 තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ සංවිධාන ව්‍යුහය

යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන මෙම කොමිෂන් සභාව 1999 අංක 50 දරණ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන (සංශෝධන) පනතේ දැක්වෙන විධි විධාන අනුව පත්කරනු ලබන සභාපතිවරයෙකුගෙන් සහ සාමාජිකයන් 17 දෙනෙකුගෙන් සමන්විත වේ.

**2013 වසර තුල කොමිෂන් සභා සංයුතිය**

**පනතේ 6(1)(ඌ) වගන්තිය යටතේ කර ඇති පත්වීම්**

1) මහාචාර්ය දයන්ත එස්. විජයසේකර මහතා - සභාපති
තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව

2) නලින් ආටිගල මහතා
ශ්‍රී ලංකා වාණිජ හා කර්මාන්ත මණ්ඩල සම්මේලනයේ නියෝජිත - සාමාජික

3) ආචාර්ය කේ.එල්. චන්ද්‍රතිලක මහතා - සාමාජික
ශ්‍රී ලංකා සේවා යෝජක මණ්ඩලයේ නියෝජිත

4) නන්දදාස රාජපක්ෂ මහතා - සාමාජික
ශ්‍රී ලංකා කුඩා හා මධ්‍යම කර්මාන්ත මණ්ඩලයේ නියෝජිත

5) සී. ලාල් ද අල්විස් මහතා - සාමාජික
ජාතික වාණිජ මණ්ඩලයේ නියෝජිත

6) තිස්ස සෙනෙවිරත්න මහතා - සාමාජික
ලංකා ජාතික කර්මාන්ත මණ්ඩලයේ නියෝජිත

7) සී.ජේ. ගුණසීල මහතා - සාමාජික
සබරගමුව වාණිජ හා කර්මාන්ත මණ්ඩලයේ නියෝජිත

8) අයි.එස්. තිලකවර්ධන මහතා - සාමාජික
ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලයේ නියෝජිත

9) නීතීඥ සෙනරත් ජයසුන්දර මහතා - සාමාජික
ගරු ඇමතිතුමා පත් කරන ලද නියෝජිත

10) වෛද්‍ය ජී. විජේසූරිය මහතා - සාමාජික
ගරු ඇමතිතුමා පත් කරන ලද නියෝජිත
(වෛද්‍ය ජී. විජේසූරිය මහතා 2013.05.31 වන දින සිට මෙම කොමිෂන් සභාවේ සාමාජිකත්වයෙන් ඉල්ලා අස්විය.)

**පනතේ 6(1)(අ) සිට (උ) වගන්ති යටතේ කර ඇති පත්වීම්**

අ) බී.එච්.එස්.සුරවීර මහතා (2013 පෙබරවාරි 28 දක්වා) - සාමාජික
අධ්‍යක්ෂ ජනරාල් - වැ.බ.,
ආචාර්ය එස්.ඩී.ආර්.පෙරේරා මහතා (2013 මාර්තු මස 01 සිට )
අධ්‍යක්ෂ ජනරාල්

ආ) කේ.ඒ.සී.අරුණදේව සිල්වා මහතා - සාමාජික
සභාපති,
ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය

ඇ) කර්නල් එස්.පී.ආර්.රත්නායක මහතා - සාමාජික
සභාපති,
ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය

ඈ) ඩබ්.ඒ.ජයවික්‍රම මහතා (2013.06.30දක්වා) - සාමාජික
අධ්‍යක්ෂ ජනරාල්- වැ.බ.,
එස්. බාලසුබ්‍රමනියම් මහතා (2013.07.01 දින සිට)
අධ්‍යක්ෂ ජනරාල්
කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව

ඉ) මහාචාර්ය කේ.කපිල සී.කේ.පෙරේරා මහතා - සාමාජික
අධ්‍යක්ෂ ජනරාල්,
හිලරි ඊ සිල්වා මහතා (2013 පෙබරවාරි මස සිට)
අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය

ඊ) පී.එච්.ඒ.එස්.විජයරත්න මහතා - සාමාජික
අධ්‍යක්ෂ ජාතික අයවැය දෙපාර්තමේන්තුව,
මුදල් අමාත්‍යාංශය
මහා භාණ්ඩාගාර නියෝජිත

උ) ලෙස්ලි දේවේන්ද්‍ර මහතා - සාමාජික
වෘත්තීය සමිති නියෝජිත

## 3.0 කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය

කොමිෂන් සභාවේ ප්‍රධාන විධායක නිලධාරියා ලෙස අධ්‍යක්ෂ ජනරාල්වරයා කටයුතු කරන අතර ඔහුගේ සහාය සඳහා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු, අධ්‍යක්ෂවරුන් හතර දෙනෙකු සහ නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් හය දෙනෙකු ඇතුළු 70 දෙනෙකුගෙන් සමන්විත කාර්ය මණ්ඩලයක් මගින් 2013 වසර තුළදී කොමිෂන් සභාවේ කාර්යභාරය ඉටුකරන ලදී. ඒ අනුව කොමිෂන් සභාවේ අරමුණු හා පරමාර්ථ කාර්යක්ෂමව ඉටු කරගැනීම පිණිස පහත දැක්වෙන අංශ යටතේ කටයුතු සංවිධානය කරනු ලැබ ඇත.

- පාලන හා මුදල් අංශය
- සැලසුම් හා පර්යේෂණ අංශය
- පාඨමාලා පිළිගැනීම් හා පුහුණු සම්මත අංශය
- ජාතික වෘත්තීය සුදුසුකම් අංශය
- තොරතුරු පද්ධති අංශය

කොමිෂන් සභාව සඳහා 85 දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයක් අනුමතව ඇතත් කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදනයන්ට අනුව 2013.12.31 දිනට කාර්ය මණ්ඩලය 70 දෙනෙකුගෙන් සමන්විත විය. විස්තර පහත දක්වා ඇත.

වගුව **3.1: කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය - 2013**

| | තනතුරු නාමය | අනුමත සංඛ්‍යාව | 2013/12/31 දිනට සේවයේ යෙදී සිටි සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | අධ්‍යක්ෂ ජනරාල් | 01 | 01 |
| 2 | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් | 01 | 01 |
| 3 | අධ්‍යක්ෂ | 05 | 03 |
| 4 | අධ්‍යක්ෂ පාලන | 01 | 01 |
| 5 | ශ්‍රම වෙළෙඳපොළ විශ්ලේෂක | 01 | 01 |
| 6 | නියෝජ්‍ය / සහකාර අධ්‍යක්‍ෂ | 15 | 12 |
| 7 | අභ්‍යන්තර විගනක | 01 | 01 |
| 8 | සහකාර අධ්‍යක්ෂ - නීති /කොමිෂන් සභා ලේකම් | 01 | 01 |
| 9 | නියෝජ්‍ය අධ්‍යක්‍ෂ (මුදල්) | 01 | 01 |
| 10 | සංඛ්‍යාලේඛණඥ | 01 | 01 |
| 11 | පුස්තකාලයාධිපති / ප්‍රලේඛණ නිලධාරි | 01 | 01 |
| 12 | පරිපාලන නිළධාරි | 01 | - |
| 13 | භාෂා පරිවර්ථක (සිංහල,දෙමළ,ඉංග්‍රිසි ) | 01 | - |
| 14 | සංවර්ධන නිළධාරි | 12 | 08 |

| | | | |
|---|---|---|---|
| 15 | තොරතුරු තාක්ෂණ නිළධාරි | 01 | 01 |
| 16 | තොරතුරු තාක්ෂණ සහකාර | 02 | - |
| 17 | පරිගණක යෙදවුම් සහකාර | 04 | 04 |
| 18 | පුස්තකාල / ප්‍රලේඛණ සහකාර | 01 | - |
| 18 | කළමනාකරණ සහකාර (I ශ්‍රේණිය/II ශ්‍රේණිය / III ශ්‍රේණිය) | 15 | 15 |
| 19 | රියැදුරු (I ශ්‍රේණිය / II ශ්‍රේණිය /III ශ්‍රේණිය) | 12 | 11 |
| 20 | කාර්යාල සහායක | 07 | 07 |
| **එකතුව** | | **85** | **70** |

පුරප්පාඩුව පවතින රියදුරු තනතුරු 01 සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වා අයදුම්කරුවන් අතරින් තෝරාගත් අයදුම්කරු 2013.01.01 වන දින සිට සේවයට වාර්තා කර ඇති අතර ඔහුද 2013.11.20 දින සිට සේවය අතහැර ගොස් ඇත . මීට අමතරව 2013.12.27 දින සහකාර අධ්‍යක්ෂ සම්මුඛ පරීක්ෂණය පවත්වා සහකාර අධ්‍යක්ෂවරු තුන්දෙනෙකු තෝරාගෙන ඇති බැවින් මෙතෙක් තිබූ පුරප්පාඩු අවසන් වනු ඇත.එසේම 2013.12.31 දින සංවර්ධන නිළධාරි තනතුරු සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වා හතරදෙනෙකු තෝරා ගෙන ඇති බැවින් මෙතෙක් තිබූ පුරප්පාඩු අවසන් වනු ඇත.2014.01.07 වන දින පරිගණක සහායක තනතුරු 02 සඳහාද සම්මුඛ පරීක්ෂණය පවත්වා දෙදෙනෙකු තෝරාගෙන ඇති බැවින් එම පුරප්පාඩු දෙකද අවසන්වනු ඇත.

පරිපාලන නිළධාරි තනතුර සඳහා සම්මුඛ පරීක්ෂණ දෙකක් 2013.05.21 දින හා 2013.09.16 වන දින පවත්වන ලද අතර එම තනතුරට සුදුසු නිළධාරියකු තෝරා ගැනීමට නොහැකි වූ අතර මෙම හේතුව නිසා පරිපාලන නිළධාරි හා භාෂා පරිවර්ථකගේ බඳවා ගැනීමේ සුදුසුකම් නැවත වරක් සංශෝධනය කිරීම සඳහා කළමණාකරණ සේවා දෙපාර්තුමේන්තුවට 2013.12.05 ඉදිරිපත් කර ඇති අතර කළමණාකරණ සේවා දෙපාර්තුමේන්තුව එම සංශෝධනයන් 2014.01.22 අනුමත කර ඇති බැවින් ඉදිරියේදී පුවත්පත් දැන්වීම් පළකර බඳවා ගැනීමට කටයුතු කරනු ඇත.

පුරප්පාඩු අධ්‍යක්ෂ තනතුරු 02 සඳහා පුවත්පත් දැන්වීම් මගින් අයදුම්පත් කැඳවා ඇති අතර අධ්‍යක්ෂ තනතුරු සඳහාද සංශෝධනයන් කළමණාකරණ සේව දෙපාර්තුමේන්තුවට ඉදිරිපත් කර ඇති බැවින් එම සංශෝධනයන් අනුමත වනතෙක් එම තනතුරු සඳහා සම්මුඛ පරීක්ෂණ කල් තබන ලෙස කළමණාකරණය තීරණය කර ඇත.

භාෂා පරිවර්ථක හා පුස්ථකාල සහායක තනතුරු සඳහා  පුවත්පත් දැන්වීම් මගින් අයදුම්පත් කැඳවා ඇති අතර භාෂා පරිවර්ථක සඳහා සුදුසු අයදුම්පත් ලැබී නොමැති බැවින් කළමණාකරණ සේවා දෙපාර්තුමේන්තුවේ අනුමත සංශෝධනයන්ට අනුව පරිපාලන නිලධාරි සමඟ නැවතත් පුවත්පත් දැන්වීම් පළ කිරීමට ඉදිරියේදි කටයුතු කරනු ඇත. පුස්තකාල සහකාර තනතුරු සඳහා ලැබී ඇති අයදුම්පත් වලින් ඉදිරියේදි සම්මුඛ පරීක්‍ෂණයක් පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇත.

## 4.0 පාලන හා මුදල් අංශය

කොමිෂන් සභාවේ කාර්යභාරය කාර්යක්ෂමව හා සඵලදායීව ඉටුකරලීමට අවශ්‍යය වන මානව හා මූල්‍ය සම්පත් කළමනාකරණය ඇතුළු යටිතල පහසුකම් සැපයීමේ කාර්යයන් ඉටුකරනු ලබයි.

මානව සම්පත් කළමනාකරණයට අදාලව තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා පහත නම් සඳහන් නිළධාරීන් 2013 වසර තුලදී කොමිෂන් සභාවේ සේවයට බඳවා ගන්නා ලදී.

### 4.1 2013 වසරේ නව පත්වීම්

| නම | තනතුර | දිනය |
|---|---|---|
| ආචාර්ය එස්.ඩී.ආර්.පෙරේරා මහතා | අධ්‍යක්ෂ ජනරාල් | 2013.03.01 |
| එච්.ජී.කේ.එන්.බණ්ඩාර මහතා | සහකාර අධ්‍යක්ෂ | 2013.02.01 |
| දිමුතු ප්‍රදීප් විතානගේ මහතා | සංවර්ධන නිළධාරී | 2013.06.06 |
| වත්සලා මධුෂානි මෙනවිය | සංවර්ධන නිළධාරී | 2013.07.15 |
| කේ.ඩබ්.ඒ.අනුරුද්ධිකා මෙනවිය | පරිගණක යෙදවුම් සහායක | 2013.07.15 |
| සී.එච්.විමුක්ති දර්ශණිකා මෙනවිය | කළමණාකරන සහකාර | 2013.03.01 |
| ශෂිකා චතුරංගනී මෙනවිය | කළමණාකරන සහකාර | 2013.06.06 |
| ඒ.පී.සුපුන් තාරක මහතා | රියදුරු | 2013.01.01 |
| නිශාන්ත කමල්ප්‍රිය මහතා | රියදුරු | 2013.09.02 |
| ලසන්ත සදරුවන් මහතා | කාර්යාල කාර්ය සහායක | 2013.09.02 |

උපාධිධාරි වැඩසටහන යටතේ යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය මඟින් කොමිෂන් සභාවට පහත සඳහන් නිළධාරින් සංවර්ධන සහකාර තනතුරු යටතේ කොමිෂන් සභාවට අනුයුක්ත කර ඇත.

| නම | තනතුර | දිනය |
|---|---|---|
| එම්.එස්.එස්.මාරසිංහ මෙනවිය | සංවර්ධන නිළධාරී | 2013.05.06 |
| ආර්.ඩී.එස්.අමරසේන මෙනවිය | සංවර්ධන නිළධාරී | 2013.05.02 |
| මධූෂා අබේධීර මෙනවිය | සංවර්ධන නිළධාරී | 2013.05.06 |
| එම්.ආර්.එච්.සී.සූරියවංශ මෙනවිය | සංවර්ධන නිළධාරී | 2013.05.02 |
| ජී.ආර්.එස්.සෙනවිරත්න මෙනවිය | සංවර්ධන නිළධාරී | 2013.05.02 |
| එස්.වී.නිර්මලා රංජනී මෙනවිය | සංවර්ධන නිළධාරී | 2013.05.06 |

## 4.2 2013 වසරේ සේවයෙන් ඉල්ලා අස්වීම්

| **නම** | **තනතුර** | **දිනය** |
|---|---|---|
| ජේ.ඩී.එන්.පී.ජයකොඩි මිය | කණිෂ්ඨ වැඩසටහන් / වැඩසටහන් විශ්ලේෂක | 2013.01.31 |
| එච්.ජී.පියුමි දිල්හානි මිය | පරිගණක යෙදවුම් සහායක | 2013.02.28 |
| කේ.එම්.ජී.පී.එස්.කේ. ඩයස් මහතා | කළමණාකරන සහකාර | 2013.02.28 |
| ජේ.තිලක් ධම්මික මහතා | කාර්යාල කාර්ය සහායක | 2013.07.01 |
| දිමුතු ප්‍රදීප් විතානගේ මහතා | සංවර්ධන නිළධාරී | 2013.09.30 |
| සුපුන් රත්න තිලිණ මහතා | රියදුරු | 2013.11.20 |

## 4.3 2013 වර්ෂය තුළ ක්‍රියාත්මක වූ වැඩ බැලීමේ / වැඩ ආවරණය කිරිමේ තනතුරු සඳහා කොමිෂන් සභාව තුලින් තේරී පත් වූ නිළධාරීන්

| නම | තනතුර | දිනය |
|---|---|---|
| බී.එච්.එස්.සුරවීර මහතා | අධ්‍යක්‍ෂ ජනරාල් තනතුරෙහි වැඩ බැලීම සඳහා | 2013.02 .28 |
| එස්.යූ.කේ. රූබසිංහ මහතා | අධ්‍යක්ෂ (පාඨමාලා පිළිගැනීම් හා පුහුණු සම්මත) තනතුරෙහි වැඩබැලීම සඳහා | 2009.07.01 |

2006 වර්ෂයේදී බඳවා ගැනීමේ පරිපාටිය අලුතින් සකස් කිරීම වැටුප් සහ සංඛ්‍යා ලේඛන කොමිෂන් සභාවේ උපදෙස් හා අධීක්‍ෂණය යටතේ සිදුකිරීම ආරම්භ කරන ලද අතර එය සකස් කර අවසන් වී නව බඳවා ගැනීමේ පරිපාටිය කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කරගෙන නව සුදුසුකම් යටතේ අධ්‍යක්ෂ (පාඨමාලා පිළිගැනීම් හා පුහුණු සම්මත) තනතුර බඳවා ගැනීමට කටයුතු කිරීම අවශ්‍ය බැවින් මෙම තනතුරු බඳවා නොගන්නා ලදී. මේ වන විට බඳවා ගැනීමේ පරිපාටිය අනුමත වී ඇතත් එම බඳවා ගැනීමේ පරිපාටිය නැවත අධ්‍යක්‍ෂ මණ්ඩලය මඟින් සංශෝධනය කර කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇති බැවින් එය අනුමත වන තෙක් මෙම බඳවා ගැනීම කල්තබා ඇත.කෙසේ වෙතත් එම අනුමැතියෙන් පසු බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ.

### 4.4 දේශීය හා විදේශීය පුහුණුව

කොමිෂන් සභා කාර්ය මණ්ඩලයේ විෂය දැනුම වර්ධනය කිරීමේ අරමුණ පෙරදැරිව නිලධාරීන් දේශීය හා විදේශීය පුහුණුවීම් / සම්මන්ත්‍රණ වලට යොමු කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව 2013 ජනවාරි සිට දෙසැම්බර් දක්වා දේශීය හා විදේශීය පුහුණුවීම් / සම්මන්ත්‍රණ වලට සහභාගී වූ නිළධාරීන් පිළිබඳ විස්තර පහත දැක්වේ.

**දේශීය පුහුණු - 2013**

කාර්ය මණ්ඩලය වෙත දේශීය පුහුණු ලබාදීම පහත සඳහන් ආකාරයන්ට සිදු කරන ලදී.

වගුව 4.1 : **දේශීය පුහුණු**

| No | නම | තනතුර | Traning | Institute | Time |
|---|---|---|---|---|---|
| 1 | බී.එච්.එස්.සුරවීර | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් | SLITAD National Conference | SLITAD | 2013/05/08 |
| 2 | වත්සලා මධුෂාණි | සංවර්ධන නිළධාරි | Induction Training | SDFL | 2013/07/23-25 |
| 3 | බී.එස්.ජේ.විපුල්සි | සංවර්ධන නිළධාරි | | | |
| 4 | එච්.එම්.ඒ.ඩී.කේ.හේරත් | සංවර්ධන නිළධාරි | Project management | SDFL | 2013/0723-24 |
| 5 | ඩී.එන්.අයි.ඩී. ද සිල්වා | සංවර්ධන නිළධාරි | Project management | SDFL | 2013/0723-24 |
| 6 | ආර්.ඩී.එස් අමරසේන | සංවර්ධන නිළධාරි | Induction Training | SDFL | 2013/07/23-25 |
| 7 | එම්.එම්.එස්.මාරසිංහ | සංවර්ධන නිළධාරි | Induction Training | SDFL | 2013/07/23-25 |
| 8 | මධුෂා අබේධීර | සංවර්ධන නිළධාරි | Induction Training | SDFL | 2013/07/23-25 |
| 9 | එම්.අර්.එච්.සී.සූරියවංශ | සංවර්ධන නිළධාරි | Induction Training | SDFL | 2013/07/23-25 |
| 10 | එස්.වී.නිර්මලා රංජනි | සංවර්ධන නිළධාරි | | | |
| 11 | ජී.ආර්.එස්.සෙනෙවිරත්න | සංවර්ධන නිළධාරි | Induction Training | SDFL | 2013/07/23-25 |
| 12 | ඩබ්.ජී.සුමින්ද අරුණකිර්ති | කළමණාකරන සහකාර | One day workshop on stores management & Supply chain management | ICTAD | 21/2/2013 |
| | | | One day workshop on Transport management | SDFL | 20/06/2013 |
| | | | NVQ L3 Cleark | NAITA | 3/4/2013 |
| 13 | එච්.බී.ඉන්දික සම්පත් | කළමණාකරන සහකාර | BM-Bach.of management study 2013/2014 | open university | three years |
| 14 | ශෂිකා චතුරංගනි | කළමණාකරන සහකාර | Induction Training | SDFL | 2013/07/23-25 |
| 15 | විමුක්ති දර්ෂිකා | කළමණාකරන සහකාර | Induction Training | SDFL | 2013/07/23-25 |
| 16 | ආර්.ජී.අසංක තිස්ස කුමාර | කළමණාකරන සහකාර | NVQ L3 Cleark | NAITA | 3/4/2013 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 17 | නිසංසලා දිල්රුක්ෂි | කළමණාකරන සහකාර | NVQ L3 Cleark | NAITA | 3/4/2013 |
| 18 | ජී.සි.ජනක් ද සිල්වා | කළමණාකරන සහකාර | One day workshop on stores management & Supply chain management | ICTAD | 21/02/2013 |
| 19 | කේ.ඩබ්.ඒ.අනුරුද්ධිකා | පරිගණක යෙදවුම් සහායක | Induction Training | SDFL | 2013/07/23-25 |
| 20 | එස්.එස්.කල්පගේ | කා.කා.ස. | NVQ L3 computer A.A | NAITA | 3/4/3013 |

**විදේශ පුහුණු - 2013**

වගුව **4.2 :** **විදේශ පුහුණු**

| නම | තනතුර | Title of Traning | Country | Time Duration |
|---|---|---|---|---|
| ආචාර්ය.එස්.ඩී.ආර් පෙරේරා | අධ්‍යක්ෂ ජනරාල් | Asia pacific International Education Forum | Australia | 2013/08/28-30 |
| | | National Conference on technical Skill Engagement & its impact Employemnt | Iran | 2013/05/07 to 10 |
| ජේ.ඒ.ඩී.ජයලත් | අධ්‍යක්ෂ (තොරතුරු පද්ධති) | Participation in regional forum Asia & pacific on Advancing TVET For youth Empl. & Sus.Development | Korea | 2013/09/01-08 |
| පී.කේ.සුනිල් | නි.අධ්‍යක්ෂ (ශා.වෘ.සු) | Seminar on vocational education management of developing | China | 2013/04/08-04/30 |
| ඩබ්.ඒ.ඩබ්.සී.ප්‍රේමරත්න | නි.අධ්‍යක්ෂ (පා.පි හා පු.ස) | Unevoc consultant workshop on "Regional plan of Action 2013" | UN Campus-Bonn,Germany | 2013/03/17-3/20 |
| ලක්සරා එදිරිසූරිය | ශ්‍රම වෙළෙඳපොළ විශ්ලේෂක | Dujiangyan International Forum:Skills Development for Rural Youth Through ICT | China | 2013/10/24-2013/10/28 |
| පී.එම්.සී.පී ගුණතිලක | සහකාර අධ්‍යක්ෂ | Training of e tutors | Germany | 2013/04/21-04/26 |
| ඩබ්.ඒ.එල් දමයන්ති | සංඛ්‍යාලේඛණ | Research Workshop on Transferable Skills in TVET | China | 2013/10/22-2013/10/28 |

## 4.5 වාර්ෂික වෘත්තීය සාමාජික ගාස්තු ප්‍රතිපූර්ණය

කොමිෂන් සභා නිළධාරීන්ගේ වෘත්තීය ආයතනවල වාර්ෂික සාමාජික ගාස්තු ගෙවීමේදී පහත සඳහන් නිළධාරීන් සඳහා ඔවුන්ගේ සාමාජික ගාස්තු ප්‍රතිපූරණය කර ඇත.

1. මහාචාර්ය දයන්ත විජේසේකර මයා - වරලත් සැපයුම් හා ප්‍රවාහන ආයතනය
   සභාපති - වරලත් සිවිල් ඉංජිනේරු ආයතනය - එංගලන්තය

2. බී.එච්.එස්.සුරවීර මයා - ශ්‍රී ලංකා වරලත් ඉංජිනේරු ආයතනය
   අධ්‍යක්ෂ ජනරාල් වැ.බ. - ශ්‍රී ලංකා සංවර්ධන හා පුහුණු ආයතනය

3. ඩබ්.පී.එම්.පී. ප්‍රේමචන්ද්‍ර මයා - ශ්‍රී ලංකා ගණකශිල්පී ආයතනය
   අධ්‍යක්ෂ (පාලන)

4. ජේ.ඒ.ඩී.ජේ. ජයලත් මයා - වරලත් පරිගණක ආයතනය - බ්‍රිතාන්‍ය
   අධ්‍යක්ෂ (තොරතුරු පද්ධති) - ශ්‍රී ලංකා වරලත් පරිගණක ආයතනය

6. එස්.යු.කේ.රූබසිංහ මහතා - ශ්‍රී ලංකා වරලත් ඉංජිනේරු ආයතනය
   වැ.බ.අධ්‍යක්ෂ
   (පාඨමාලා ප්‍රතීතන හා පුහුණු සම්මත)

7. වජිර පෙරේරා මහතා - ශ්‍රී ලංකා කළමණාකරණ ආයතනය
   අධ්‍යක්‍ෂ (ජාතික වෘත්තීය සුදුසුකම්)

8. ඩබ්.එම්.ටී.අනුර වීරකෝන් මහතා - ශ්‍රී ලංකා පුස්තකාල මණ්ඩලය
   පුස්තකාලාධිපති

## 4.6 මූල්‍ය ප්‍රගතිය

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව සඳහා අවශ්‍ය ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරය මගින් ලබා දෙනු ඇත.

2013 වර්ෂය සඳහා කොමිෂන් සභාව සිය වියදම් සඳහා පහත පරිදි ඇස්තමේන්තු කරන ලදි.
පුනරාවර්තන වියදම සඳහා රුපියල් මිලියන 60.957 කි.
ප්‍රාග්ධන වියදම සඳහා රුපියල් මිලියන 15 කි.

මෙම වියදම් වලින් 2013 වර්ෂය සඳහා මහා භාණ්ඩාගාරය විසින් පුනරාවර්තන වියදම් සඳහා රුපියල් 53,640,700 ක්ද ප්‍රාග්ධන වියදම් සඳහා රුපියල් 10,060,000 ක්ද කොමිෂන් සභාව වෙත නිදහස් කරන ලදි.

2013 වර්ෂය සඳහා ඇස්තමේන්තු ගත වියදම් 2012 වර්ෂය සමග සැසඳීමේදී පුනරාවර්තන ඇස්තමේන්තුවෙහි 9.6% වැඩිවීමක්ද ප්‍රාග්ධන වියදම් ඇස්තමේන්තුවෙහි 18%ක වැඩිවීමක් දක්නට ලැබේ.

2013 වසර තුලදී 078-1001-1226834 ගිණුමෙහි අතිරික්තයෙන් රු. 2,500,000 තුන්මස් ඇමතුම් තැන්පතුවක ආයෝජනය කළ හැකි විය. කොමිෂන් සභාව 2013 වර්ෂයේ ඇස්තමේන්තු සකස් කිරීමේදී රුපියල් මිලියන 4.773 ක ආදායමක් අපේක්ෂා කල අතර ආදායම හා සත්‍ය ආදායම 4.459 ක් විය. මේ පිළිබඳ විස්තර පහත පරිදි වේ.

| | ඇස්තමේන්තු ගත ආදායම (රු.) | සත්‍ය ආදායම (රු.) |
|---|---|---|
| ශිෂ්‍ය වාර්තා පොත් විකුණුම් ශුද්ධ ආදායම | 1,500,000 | 1,372,385 |
| ආයතන ලියාපදිංචි කිරීමේ ගාස්තු | 550,000 | 1,048,500 |
| ආයතන ප්‍රතීතනය කිරීමේ ගාස්තු | 1,000,000 | 1,375,600 |
| වෙනත් | 2,115,000 | 1170,696 |
| **එකතුව** | 5,165,000 | 4,497,181 |

## 4.7 අභ්‍යන්තර විගණනය

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ කාර්යයන්ට අදාලව විගණන හා පරීක්ෂණ පැවැත්වීම අභ්‍යන්තර විගණන අංශය විසින් සිදු කරනු ඇත.පෙර වර්ෂ වලදී මෙන් අභ්‍යන්තර පාලන ක්‍රම වල ප්‍රමාණවත් බව, චක්‍රලේඛ උපදෙස් වලට, කොමිෂන් සභාව පනත, හා කොමිෂන් සභාවට අදාළ වන වෙනත් නීතිරීති වලට අනුකූල වීම විමසමින් අභ්‍යන්තර විගණන කටයුතු ඉදිරියට ගෙන යන ලදි. විගණන කටයුතු සහ නව ප්‍රතිපත්ති යෝජනා කිරීම හෝ වෙනස් කිරීම අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මෙන්ම විගණන හා කළමනාකරණ කමිටුව මඟින් කෙරුණු අතර කොමිෂන් සභාවේ දුර්වලතා හා ඌණතා අවම මට්ටමක පවත්වා ගැනීමට අවශ්‍ය යෝජනා අදාළ නිළධාරීන්ගේ අවධානයට යොමු කිරීම අවශ්‍ය කටයුතු අදාළ වර්ෂයේදී සිදු කරන ලදි.

1. විගණන හා කළමණාකරණ කමිටුව පහත නම් සඳහන් කොමිෂන් සභා සාමාජිකයන්ගෙන් යුක්ත විය.
   - පී.එච්.ජ්.එස්. විජේරත්න මයා - කමිටු සභාපති
   - චන්ද්‍රලාල් ද අල්විස් මයා - කමිටු සාමාජික
   - තිස්ස සෙනවිරත්න මයා - කමිටු සාමාජික

2. විගණන හා කලමනාකරණ කමිටුව නිසි පරිදි 2013 වර්ෂය තුළ අවස්ථා හතරකදී රැස් වන ලදි. එනම් 2013.03.18, 2013.06.04, 2013.08.15, සහ 2013.12.18 දිනයන්හිදී රැස්වන ලදි.

3. විගණන හා කලමනාකරණ කමිටුව පහත සඳහන් ප්‍රධාන කාර්යයන් පිළිබඳව අවධානය යොමු කරමින් සාකච්ඡා කරන ලද අතර අවශ්‍ය අදාල ක්‍රියාමාර්ග ගැනීමට උපෙදස් දෙන ලදි.
   i. අභ්‍යන්තර විගණන වැඩසටහන හා කාර්යයන් පිළිබඳව
   ii. කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තා හා වාර්ෂික වාර්තාව පිළිබඳව
   iii. කොමිෂන් සභාවේ වාර්ෂික කාර්යය සාධනය පිළිබඳව
   iv. කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලන හා විධි ක්‍රම පිලිබඳව

4. අභ්‍යන්තර විගණන වැඩසටහන අනුව සැළසුම් කරන ලද ප්‍රධාන විගණන ප්‍රදේශ 6 ක් ආවරණ කරන ලද අතර අභ්‍යන්තර විගණන වැඩසටහන අනුව සැළසුම් නොකරන ලද විගණන විමර්ෂණයන් ද අභ්‍යන්තර විගණනය විසින් අධ්‍යක්ෂක ජනරාල්ගේ හා විගණන හා කළමණාකරන කමිටුවේ උපදෙස් පරිදි ඉටු කරන ලදි.

## 4.8 නීති කටයුතු

i. පනත ප්‍රකාරව පුහුණු ආයතන ලියාපදිංචි කිරීම

1990 අංක 20 දරණ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනතේ 14(1) හා 15(1) වගන්තීන් ප්‍රකාරව රජයේ හෝ පෞද්ගලික/ රාජ්‍ය නොවන අංශයේ කිසියම් හෝ ආයතනයක් විසින් තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන ආයතනයන් හෝ පාඨමාලාවන් හෝ පවත්වාගෙන යාමට අවශ්‍ය නෛතික හැකියාව ලබා ගැනීම සඳහා තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි වීම සිදු කරගත යුතු වේ. ඒ අනුව ලියාපදිංචි නොවී ශ්‍රී ලංකාව තුළ පවත්වාගෙන යනු ලබන ආයතනයන්ට එරෙහිව කටයුතු කිරීම මෙම කොමිෂන් සභාව මගින් සිදුකරනු ලැබේ. දැනට ආයතන 94 කට පමණ ඉහත කී නෛතික අවශ්‍යතාවය පිළිබඳව දැනුවත් කර ඇති අතර අදාල ආයතනයන් වෙත ලියාපදිංචි වීමේ නෛතික අවශ්‍යතාවය දක්වා ලිපි මගින් දැනුම් දී ඇති අතර, ඉන් දැනට ආයතන 53 ක් පමණ එයට ප්‍රතිචාර දක්වා ඇත.

ii. පනත සංශෝධනය කිරීමේ ප්‍රගතිය

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනත වසර 1990 දී පමණ සම්මත වූ පනතක් වන අතර එහි ලියාපදිංචි නොවූ ආයතනයක් සම්බන්ධයෙන් ගනු ලබන නීතිමය පියවර කුමක්ද යන්න පිළිබඳව වගන්තියක් හෝ පියවර හෝ නිසි අධිකරණය දක්වා නොමැත. එසේ හෙයින් නීත්‍යානුකූල පියවර ගැනීමේ දැඩි අපහසුතාවක් පැනනැගී ඇත.

යෝජිත සංශෝධන මගින් අධිකරණ බලය පිළිබඳ වගන්තීන් ඇතුළත් කර මෙම පනත ශක්තිමත් කිරීමට පියවර ගෙන ඇත.

එසේම 2004 දී හඳුන්වා දුන් ජාතික වෘත්තීය සුදුසුකම් රාමුව ක්‍රියාත්මක කිරීම සඳහා පුහුණු ආයතන ලියාපදිංචි කිරීම සහ ප්‍රතීතනය කිරීම වඩාත් විධිමත් කිරීමට අවශ්‍ය විය. ඒ අනුව වෘත්තීය පුහුණුව සංශෝධනය කිරීමේදී ඇතිවන අභියෝගයන්ට වඩාත් ඵලදායි ලෙස මුහුණ දීම සඳහා පනත සංශෝධනය කිරීම අවශ්‍ය විය.

මෙහිදී කොමිෂන් සභාව විසින් නීති උපකමිටුවක් පත්කළ අතර කාර්ය මණ්ඩලය සහ අදාළ බාහිර පාර්ශවයන්ගේ අදහස් විමසා සංශෝධිත පනත කෙටුම්පත් කරන ලදී. එම කෙටුම්පත වෙබ් අඩවියේ එලකොට පුවත්පත් මගින් මහජන අදහස් විමසා නැවතත් බාහිර පාර්ශවයන්ගේ අදහස් විමසා සකස්කරන ලද අවසන් පනත් කෙටුම්පත අමාත්‍යාංශයට ඉදිරිපත් කරන ලදී.

මෙම පනත සංශෝධනය සඳහා කැබිනට් අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව ව්‍යවස්ථා කටයුතු පිළිබඳව අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවට සහය වන නිලධර කමිටු රැස්වීමක් වර්ෂ 2013.06.07 වන දින අධිකරණ අමාත්‍යාංශයේදී සහ ව්‍යවස්ථා කටයුතු පිළිබඳව අමාත්‍ය මණ්ඩල අනුකාරක සභා රැස්වීම වර්ෂ 2013.07.02 දින පැවැත්විණි. එහිදී යෝජිත සංශෝධන ඉදිරිපත් කරන ලද අතර ඒ අනුව සංශෝධිත පනතේ 6, 7 , සහ 11 වගන්තීන් සඳහා අමාත්‍ය මණ්ඩල අනුකාරක නිර්දේශයන් දක්වන ලදී. ඉන් අනතුරුව යෝජිත නිර්දේශයන් සමඟ පනත් කෙටුම්පත නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත 2013 අගෝස්තු මස දී පමණ යොමු කර ඇත.

<u>ආයතන සම්බන්ධයෙන් ගනු ලැබූ නීතිමය පියවර.</u>

1990 අංක 20 දරණ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනතේ 04 (ඊ) හා 04 (ඌ) වගන්ති යටතේ පෞද්ගලික අංශයේ / රාජ්‍ය නොවන අංශයේ ආයතනයන්ට දී ඇති මූල්‍ය ප්‍රදානයන් නිසිලෙස ක්‍රියාත්මක නොකර හා පාඨමාලා ප්‍රතීතනය නොවී පවත්වාගෙන යනු ලබන ආයතනයන් මගින් එම ණය මුදල් අයකර ගැනීමට අවශ්‍ය නීතිමය පියවර ගැනීමද සිදු කරන ලදී.

ඒ අනුව එම ආයතනයන් වෙත නඩු පැවරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීමට සහකාර අධ්‍යක්ෂ (නීති) විසින් සිය නිරීක්ෂණ සමඟ නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමෙන් අනතුරුව නීතිපති දෙපාර්තමේන්තුව සහ මෙම කොමිෂන් සභාවේ අධ්‍යක්ෂවරුන් සමඟ මේ සම්බන්ධයෙන් මූලික සාකච්ඡාවක්ද පවත්වන ලදී. ඉන් අනතුරුව දිසා අධිකරණයේ නඩු පැවරීමට ප්‍රථමයෙන් සමථ මණ්ඩලය වෙත මෙම ආයතනයන් යොමු කරන ලෙස නීතිපති දෙපාර්තමේන්තුව මඟින් උපදෙස් ලැබුණු අතර ඒ අනුව සහකාර අධ්‍යක්ෂ (නීති) විසින් සමථ මණ්ඩලය වෙත යොමු කරන ලදී. ඒ අනුව 2013.11.23 වන දින ඇති කරගත් සමථය පරිදි ATC පරිගණක ආයතනය විසින් රුපියල් 32,444.00 ක පමණ වන වාරික මඟින් රුපියල් 194,659.00 මුලු මුදල ගෙවීමට එකඟ වූ අතර දැනට වාරික දෙකක් පමණ ගෙවා ඇත. එසේම ශාන්ත ජෝන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය විසින් ලබා ගෙන ඇති මුලු මුදල වන රුපියල් 161,875.00 ක මුදල ගෙවා නිම කර ඇත. නිර්මාණී සංවර්ධන පදනම විසින් 2013.11.30 වන දින ඇති කර ගත් සමථය පරිදි රුපියල් 24708.00ක වාරික මඟින් රුපියල් 290,500.00 මුලු මුදල ගෙවීමට එකඟ වූ අතර දැනට වාරිකයක් පමණ ගෙවා ඇත.

iii. TVEC නාමය හා ලාංඡනය වැරදි ලෙස භාවිතා කිරීම වැලක්වීම.

බොහෝ පුහුණු ආයතන විසින් TVEC නාමය හා ලාංඡනය වැරදි ලෙස භාවිතා කරන බවට නිරන්තරයෙන් වාර්තා වේ. ඒ පිළිබඳව නීතිමය පියවර ගැනීමේදී, TVEC නම හා ලාංඡනයෙහි අයිතිය තහවුරු කිරීමට සිදුවේ. එම නිසා දැනටමත් කොමිෂන් සභාවේ TVEC නිල ලාංඡනය සහ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) යන තේමාව ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයෙහි ලියාපදිංචි කිරීමද සිදුකර ඇති අතර එමගින් මෙම ආයතනයේ අනන්‍යතාවය නීතිමය වශයෙන් ශක්තිමත් වේ. ඊට අමතරව 2013.05.30 දින තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව යන නාමය ද ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයෙහි ලියාපදිංචි කිරීමට පියවර ගන්නා ලදී.

iv. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වීම

සහකාර අධ්‍යක්ෂ (නීති) අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් ලෙස ද කටයුතු කරන අතර 2013 වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල රුැස්වීම් 10ක් පවත්වන ලදී.

## 5.0 සැලසුම් හා පර්යේෂණ අංශය

කොමිෂන් සභාවේ සැලසුම් හා පර්යේෂණ අංශයේ ප්‍රධාන කාර්යභාරය වනුයේ 1990 අංක 20 දරණ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනතෙහි පළමු අරමුණ වූ, "ශ්‍රී ලංකාවේ ආර්ථික හා මානව සම්පත් සංවර්ධන අවශ්‍යතාවන් අනුව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපනය සැලසුම් කිරීම, සම්බන්ධීකරණය සහ සංවර්ධනය කිරීම" සඳහා සක්‍රීය දායකත්වය ලබාදීමයි. සැලසුම් හා පර්යේෂණ අංශය පහත දැක්වෙන ප්‍රධාන කාර්යයන් ඉටුකිරීම සඳහා වගකීම දරයි.

- රාජ්‍ය, පෞද්ගලික හා රාජ්‍ය නොවන සංවිධානවල වෘත්තීය පුහුණු ආයතනවලට මූල්‍යාධාර සැපයීම හා විමර්ශනය කිරීම
- වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම් සකස්කිරීම හා යාවත්කාලීන කිරීම
- ශ්‍රී ලංකාවේ පළාත්බද වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම් පිළියෙල කිරීම හා ක්‍රියාත්මක කිරීම
- කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ප්‍රතිපත්ති සකස්කිරීම හා යාවත්කාලීන කිරීම
- කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂෙත්‍රයේ පර්යේෂණ අධ්‍යයන ක්‍රියාත්මක කිරීම
- තෘතීයික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාවේ සංයුක්ත සැලැස්ම යාවත්කාලීන කිරීම හා ඒ අනුව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම
- කොමිෂන් සභාවේ මාසික, කාර්තු හා වාර්ෂික ප්‍රගති වාර්ථා සකස්කිරීම

සැලසුම් හා පර්යේෂණ අංශය පහත දැක්වෙන වැඩසටහන් 2013 වසරේදී ක්‍රියාත්මක කරඇත.

## 5.1 රාජ්‍ය, පෞද්ගලික හා රාජ්‍ය නොවන සංවිධානවල වෘත්තීය පුහුණු ආයතනවලට මූල්‍යාධාර සැපයීම හා විමර්ශණය කිරීම

රාජ්‍ය, පුද්ගලික හා රාජ්‍ය නොවන සංවිධාන අංශයේ පුහුණු ආයතනයන් හි ක්‍රියාත්මක කරනු ලබන වෘත්තීය හා කාර්මික පුහුණු පාඨමාලාවල ගුණාත්මකභාවය හා ශ්‍රම වෙළෙඳපොල අදාලත්වය දියුණු කිරීම සඳහා අවශ්‍ය වන පුහුණු උපකරණ ලබාදීම පිණිස කොමිෂන් සභාව මෙම වැඩසටහන ක්‍රියාත්මක කරයි. මේ මගින් රාජ්‍ය හා පුද්ගලික අංශයේ පුහුණු පාඨමාලා ජාතික නිපුණතා සම්මත අනුව ප්‍රතීතනයකර ඒ තුළින් ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) සහතික ප්‍රදානය කිරීමට හැකියාව ලැබේ.


2013 මූලාධාර වැඩසටහන සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි පුහුණු ආයතන තුළින් අයදුම්පත්‍ර කැඳවන ලදී. ඒ අනුව, එවන ලද අයදුම්පත්‍ර අතුරින් තෝරාගන්නා ලද පුහුණු ආයතනයන් ඇගයීමට ලක්කර මූලාධාර ලබාදීමට කටයුතු කරනලදී. 2013 වර්ෂය තුලදී රාජ්‍ය, පෞද්ගලික යන අංශයන්ට මූලාධාර ලබාදීම පිළිබඳ විස්තර අංශ අනුව පහත වගු අංක 5.1 මගින් දැක්වේ.

**වගුව 5.1: ලබාදුන් මූලාධාර ආංශික ව්‍යාප්තිය - 2013**

| අංශය | 2013 වර්ෂය සඳහා වෙන්කරන ලද ප්‍රතිපාදන (රු. මිලියන) | | මූලාධාර ප්‍රදානය කිරීමට අපේක්ෂාකල පාඨමාලා ගණන | | සත්‍ය වියදමෙන් මූලාධාර ලබාදුන් පාඨමාලා සංඛ්‍යාව | ආයතන සංඛ්‍යාව | වැයවූ මුදල (රු. මිලියන) |
|---|---|---|---|---|---|---|---|
| | ආරම්භක | සංශෝධිත | ආරම්භක | සංශෝධිත | | | |
| රාජ්‍ය අංශය | 0.9 | 0.9 | 07 | 07 | 05 | 05 | 0.887 |
| පෞද්ගලික හා රාජ්‍ය නොවන සංවිධාන අංශය | 3.5 | 3.05 | 25 | 19 | 13 | 13 | *2.702 |
| පීඩාවට පත්වූ තරුණ තරුණියන්ට වෘත්තීය පුහුණුව සපයන ආයතන අංශය | 0.75 | 0.65 | 08 | 08 | 07 | 03 | 0.580 |
| **එකතුව** | **5.15** | **4.60** | **40** | **34** | **25** | **21** | **4.169** |

*රු. මිලියන 0.476 ක මුදලක් 2014 වර්ෂයේදී ගෙවීමට නියමිතය.

**ප්‍රස්ථාරය 5:1 අංශ අනුව මූලාධාර ලබාදීම**




2013 වර්ෂයේදී මූලාධාර ප්‍රදානයකිරීමේ වැඩසටහන 2013.11.27 වන දින යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍ය ගරු ඩලස් අලහප්පෙරුම මැතිතුමාගේ ප්‍රදානත්වයෙන් යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය තුළදී පවත්වන ලදී.







ඉහත ඡායාරූපයෙන් යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍ය ගරු ඩලස් අලහප්පෙරුම ඇමතිතුමා විසින් මූල්‍යාධාර ප්‍රදානය සිදුකරන අවස්ථාවන් දැක්වේ. අමාත්‍යාංශ ලේකම්, කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් තුමා හා සැලසුම් හා පර්යේෂණ අංශයේ අධ්‍යක්ෂතුමාද මෙම අවස්ථාවට සහභාගී විය.

මූල්‍යාධාර ප්‍රදානය පිළිබඳ විස්තර වෙන්වෙන් වශයෙන් පහත දක්වා ඇත

### 5.1.1 රාජ්‍ය අංශයේ වෘත්තීය පුහුණු ආයතන සඳහා මූල්‍යාධාර සැපයීම

රාජ්‍ය අංශයට මූල්‍යාධාර ලබාදීම 1999 වර්ෂයේ සිට වසර 14 ක් අඛණ්ඩව සිදුකරන ලදී. මෙම වැඩසටහනේ අරමුණ වන්නේ කොමිෂන් සභාව විසින් සකස්කරන වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම් මගින් හා ශ්‍රම වෙළෙඳපොළ විශ්ලේෂණ මඟින් හඳුනාගත් පුහුණු වැඩසටහන් රාජ්‍ය අංශයේ පුහුණු ආයතන තුළින් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය උපකරණ මිලට ගැනීමට මූල්‍යාධාර ලබාදීමයි. හඳුනාගත් පාඨමාලා ජාතික නිපුණතා සම්මත අනුව ප්‍රතීතනයකර ජාතික වෘත්තීය සුදුසුකම් ප්‍රදානය කිරීමට අවකාශ සැලසීම මෙහිදී සිදුවේ. මූල්‍යාධාර ලැබූ වෘත්තීය පුහුණු ආයතන රාශියක පාඨමාලාවන් ගුණාත්මකව පවත්වාගෙන යනු ලබයි.

2013 වර්ෂය සඳහා යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයෙන් පරිභාහිර රාජ්‍ය අංශයේ පුහුණු ආයතනවලට මූල්‍යාධාර ලබාදීමට සලකා බලන ලදී.

ඒ අනුව, අමාත්‍යාංශයෙන් පරිභාහිර තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි රාජ්‍ය අංශයේ පුහුණු ආයතනවලින් මූල්‍යාධාර ලබාදීමට අයදුම්පත්‍ර කැඳවන ලදී. ඒ සඳහා ලද ප්‍රතිචාර මත ලැබුණු අයදුම්පත්‍ර 22 අතුරින් තෝරාගන්නා ලද පළාත් සභා වෘත්තීය පුහුණු ආයතන සඳහා වැඩි ප්‍රමුඛත්වයක් ලබාදෙනලදී. එම වෘත්තීය පුහුණු ආයතනයන් නියෝජනයවන පළාත් 03ක උපදේශකවරුන් සඳහා ජාතික වෘත්තීය සුදුසුකම්

රාමුව, පුහුණු ආයතන ලියාපදිංචිය හා පාඨමාලා ප්‍රතීතනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් 03 ක් පවත්වන ලදී.


2013 වර්ෂයේ රාජ්‍ය අංශය සඳහා මූල්‍යාධාර ලබාදීමට රුපියල් මිලියන 0.9 ක් පාඨමාලා 17 ක් සඳහා වෙන්කර තිබුණි. එමගින් පළාත්සභා මගින් ක්‍රියාත්මක වන වෘත්තීය පුහුණු ආයතන 05 ක පාඨමාලා 05 ක් සඳහා රු. මිලියන 0.887 ක් ප්‍රදානය කරනලදී. එමඟින් 2013 වර්ෂයට අනුමත සංශෝධිත ප්‍රතිපාදන වලින් 98.5% ක් පමණ වැයකිරීමට හැකියාව ලැබුණි. රාජ්‍ය අංශයේ කර්මාන්ත ක්ෂේත්‍ර අනුව මූල්‍යාධාර ව්‍යාප්තිය පිළිබඳ විස්තර වගු අංක 5.2 හි සඳහන්වේ.

**වගුව 5.2: කර්මාන්ත ක්ෂේත්‍ර අනුව මූල්‍යාධාර ව්‍යාප්තිය - 2013**

| **අංකය** | **කර්මාන්ත ක්ෂේත්‍රය** | **පාඨමාලා ගණන** | **ප්‍රදානය කළ මුදල (රු.)** | **ප්‍රතිශතය ( %) (ප්‍රදානය කල මුළු මුදලින්)** |
|---|---|---|---|---|
| 1. | ගොඩනැගිලි ඉදිකිරීම් කර්මාන්තය | 04 | 480,603 | 54% |
| 2. | රෙදිපිළි හා ඇඟලුම් කර්මාන්තය | 01 | 406,640 | 46% |
| **එකතුව** | | **05** | **887,243** | **100%** |

ඉහත වගු අංක 5:2 අනුව, 2013 වර්ෂයේදී රාජ්‍ය අංශයේ ආයතන සඳහා ප්‍රධාන ක්ෂේත්‍ර 02 ක් ආවරණය වන පරිදි මූල්‍යාධාර ලබා දී ඇති අතර, එසේ ලබාදුන් මූල්‍යාධාර වලින් 54%ක් ලබාදී ඇත්තේ දේශීය හා විදේශීය ශ්‍රම වෙළෙඳපොළ තුළ ඉහළ ඉල්ලුමක් ඇති ගොඩනැගිලි ඉදිකිරීම් කර්මාන්ත ක්ෂේත්‍රයට අදාලව පුහුණුව ප්‍රවර්ධනය කිරීම සඳහාය. එමෙන්ම, 2013 වර්ෂය තුළදී රෙදිපිළි හා ඇඟලුම් කර්මාන්තය සඳහා 46% ක මූල්‍යාධාර ප්‍රමාණයක් ප්‍රදානයකර ඇත. ඒ පිළිබඳ විශ්ලේෂණය ප්‍රස්ථාර අංක 5.2 මඟින් දැක්වේ.

ප්‍රස්ථාරය 5:2 කර්මාන්ත ක්ෂේත්‍ර අනුව මූල්‍යාධාර ලබාදීම




රාජ්‍ය අංශය යටතේ ක්‍රියාත්මක වන එක් එක් ආයතන සඳහා 2013 වර්ෂයේදී ලබාදුන් මූල්‍යාධාර ප්‍රමාණයන් වෙන වෙනම වගු අංක 5.3 මගින් දැක්වේ.

වගුව 5.3: රාජ්‍ය අංශය සඳහා මූල්‍යාධාර ලබාදීම - 2013

| අංකය | ආයතනයේ නම | කර්මාන්ත ක්ෂේත්‍රය | පුහුණු පාඨමාලාව හා අපේක්ෂිත NVQ මට්ටම | ප්‍රදානය කරන ලද මුදල (රු.) |
|---|---|---|---|---|
| **දකුණු පළාත් සභාව** | | | | |
| 1. | කර්මාන්ත පුහුණු පාසල (වඩු කාර්මික) කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව කිතලගම බටහිර තිහගොඩ | ගොඩනැගිලි ඉදිකිරීම් කර්මාන්තය | දැව කාර්මික ශිල්පී 4 වන මට්ටම | 168,500 |
| | | | **උප එකතුව - දකුණු පළාත් සභාව** | **168,500** |
| **සබරගමුව පළාත් සභාව** | | | | |
| 2. | කාර්මික පුහුණු ආයතනය (වඩු කාර්මික) පිටිහුම කෑගල්ල | ගොඩනැගිලි ඉදිකිරීම් කර්මාන්තය | දැව කාර්මික ශිල්පී 4 වන මට්ටම | 122,063 |
| 3. | බල්ලපාන පුහුණු ආයතනය බල්ලපාන ගලිගමුව නගරය | රෙදිපිළි හා ඇඟලුම් | කර්මාන්ත මහන යන්ත්‍ර ක්‍රියාකරු 3 වන මට්ටම | 406,640 |
| **උප එකතුව - සබරගමුව පළාත් සභාව** | | | | **528,703** |
| **වයඹ පළාත් සභාව** | | | | |
| 4. | කාර්මික පුහුණු ආයතනය (වඩු කාර්මික) බූජ්ජෝගමුව | ගොඩනැගිලි ඉදිකිරීම් කර්මාන්තය | දැව කාර්මික ශිල්පී 4 වන මට්ටම | 89,120 |

| අංකය | ආයතනයේ නම | කර්මාන්ත ක්ෂෙත්‍රය | පුහුණු පාඨමාලාව හා අපේක්ෂිත NVQ මට්ටම | ප්‍රදානය කරන ලද මුදල (රු.) |
|---|---|---|---|---|
| 5. | කාර්මික පුහුණු ආයතනය (වඩු කාර්මික) මීගමුව පාර මල්කඩුවාව කුරුණෑගල | ගොඩනැගිලි ඉදිකිරීම් කර්මාන්තය | දැව කාර්මික ශිල්පී 4 වන මට්ටම | 100,920 |
| **උප එකතුව - වයඹ පළාත් සභාව** | | | | **190,040** |
| **එකතුව** | | | | **887,243** |

### 5.1.2 පුද්ගලික හා රාජ්‍ය නොවන සංවිධාන අංශයේ වෘත්තීය පුහුණු ආයතනවලට මූල්‍යාධාර සැපයීම

2013 වර්ෂයේදී පුද්ගලික හා රාජ්‍ය නොවන සංවිධාන අංශයේ පුහුණු මධ්‍යස්ථාන විසින් ක්‍රියාත්මක කරනු ලබන වෘත්තීය පුහුණු පාඨමාලාවල ගුණාත්මකභාවය හා අදාලත්වය ඉහළ නැංවීම පිණිස මූල්‍යාධාර ලබාදීම සඳහා රුපියල් මිලියන 3.05 ක ප්‍රතිපාදන පාඨමාලා 19 ක් සඳහා වෙන්වී තිබුණි (සංශෝධිත වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව). ඒ අනුව, ලැබුණු අයදුම්පත්‍ර 92 අතුරින් තෝරාගන්නා ලද ආයතනයන් 48 ක් භෞතික ඇගයීමට ලක්කිරීමෙන් අනතුරුව ආයතන 17 ක් මූල්‍යාධාර ලබාදීම සඳහා තෝරාගන්නා ලදී.

එසේ තෝරාගන්නාලද පුද්ගලික හා රාජ්‍ය නොවන සංවිධාන අංශයේ පුහුණු ආයතන 17 ක පාඨමාලා 19 ක් සඳහා රුපියල් මිලියන 3.05 ක මූල්‍යාධාර ලබාදීමට සැලසුම් කරනලදී. එහෙත් තෝරාගන්නා ලද ආයතන 03 ක පාඨමාලා 06 ක් සඳහා අවශ්‍ය පාඨමාලා ප්‍රතීතන අයදුම්පත්‍ර ඉදිරිපත් නොකරන ලද නිසා මූල්‍යාධාර ගිවිසුම් අත්සන්කිරීමට නොහැකිවිය. එමනිසා අපේක්ෂිත ඇස්තමේන්තුගත මුදලින් රු. 0.27 ක මුදලක් වැයකිරීමට නොහැකිවිය. ඒ අනුව, 2013 වර්ෂයේදී අනුමත ප්‍රතිපාදන වලින් 87.5% ක ප්‍රතිශතයක් වැයකිරීමට හැකියාව ලැබුණි.

පෞද්ගලික/රාජ්‍ය නොවන සංවිධාන අංශයේ එක් එක් වෘත්තීය පුහුණු ආයතන වෙත ලබාදුන් මූල්‍යාධාර ප්‍රමාණයන් පහත වගු අංක 5.4 මඟින් දක්වා ඇත.

**වගුව 5.4: පෞද්ගලික/රාජ්‍ය නොවන සංවිධාන අංශයේ වෘත්තීය පුහුණු ආයතනවලට මූල්‍යාධාර ලබාදීම - 2013**

**2013 වර්ෂයේදී මූල්‍යාධාර ප්‍රදානය අවසන් කරනලද ආයතන පිළිබඳ විස්තර**

| අංකය | පුහුණු ආයතනය හා ලිපිනය | කර්මාන්ත ක්ෂේත්‍රය | පුහුණු පාඨමාලාව හා අපේක්ෂිත NVQ මට්ටම | අනුමත කරනලද මුළු මුදල (රු.) | ප්‍රතිපූරණය කරනලද මුදල (රු.) |
|---|---|---|---|---|---|
| 1. | කින්නියා තාක්ෂණ ආයතනය<br>මුනායිචේච්නායි<br>කුට්ටතීව්<br>කින්නියා | විදුලි හා ඉලෙක්ට්‍රොනික් කර්මාන්තය | ශීතකරණ හා වායුසමීකරණ ශිල්පී<br>3 වන මට්ටම | **145,600** | 107,170 |
| 2. | ප්‍රිල්ස් බේකින්, කුකින් ඇන්ඩ් කන්ෆෙක්ෂනරි පුහුණු මධ්‍යස්ථානය<br>255/1, කිරුළ පාර<br>කොළඹ 05 | ආහාරපාන කර්මාන්තය | අහාර සැකසුම් ශිල්පී<br>4 වන මට්ටම | **116,326** | 93,170 |
| | ටැන්ගල් ලිවින් කෙයාර්<br>අංක 4<br>1වන දුම්රියපොළ පටුමග<br>උඩහමුල්ල<br>නුගේගොඩ | සෞඛ්‍ය ක්ෂේත්‍රය | හෙද සහයක ශිල්පී<br>3 වන මට්ටම | **222,530** | 219,030 |
| 3. | සණස තොරතුරු තාක්ෂණ හා කළමනාකරණ අධ්‍යාපන ආයතනය<br>437, මාදම්පේ පාර<br>කුලියාපිටිය | රෙදිපිළි සහ ඇඟලුම් ක්ෂේත්‍රය | කර්මාන්ත මහන යන්ත්‍ර ක්‍රියාකරු<br>3 වන මට්ටම | **404,950** | 404,950 |
| 4. | රියලේව් තොරතුරු තාක්ෂණ ආයතනය<br>අංක 152, නුවර පාර<br>පහළ ඉඹුලේගාඩ<br>ඉඹුලේගාඩ | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රය | පරිගණක දෘඩාංග ශිල්පී<br>4 වන මට්ටම | **63,280** | 62,825 |
| 5. | එම්. ඩී. පී. පරිගණක පුහුණු ආයතනය සහ තොරතුරු තාක්ෂණ වෘත්තීය ආයතනය<br>60 සී, දුම්රිය පොළ පාර<br>කඳාන | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රය | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශිල්පී<br>4 වන මට්ටම | **110,320** | 105,420 |

| අංකය | පුහුණු ආයතනය හා ලිපිනය | කර්මාන්ත ක්ෂෙත්‍රය | පුහුණු පාඨමාලාව හා අපේක්ෂිත NVQ මට්ටම | අනුමත කරනලද මුළු මුදල (රු.) | ප්‍රතිපූරණය කරනලද මුදල (රු.) |
|---|---|---|---|---|---|
| 6. | දොන් බොස්කෝ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය පුත්තලම පාර නොච්චියාගම | මෝටර් රථ අළුත්වැඩියාව හා නඩත්තු කර්මාන්තය | මෝටර් රථ කාර්මික ශිල්පී 4 වන මට්ටම | **737,443** | 688,402 |
| 7. | රෝයල් පරිගණක ආයතනය බවුන්ඩරි පාර කලුතාවලි 01 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂෙත්‍රය | පරිගණක දෘඩාංග ශිල්පී 4 වන මට්ටම | **33,915** | 9,310 |
| 8. | සර්වෝදය ශ්‍රමදාන සංගමය සතුරුකෝන් මඩකලපුව | මෝටර් රථ අළුත්වැඩියාව හා නඩත්තු කර්මාන්තය | යතුරුපැදි කාර්මික ශිල්පී 4 වන මට්ටම | **227,927** | 223,811 |
| 9. | ශාන්ත අන්තෝනි කාර්මික ආයතනය මොණරාගල | මෝටර් රථ අළුත්වැඩියාව හා නඩත්තු කර්මාන්තය | යතුරුපැදි කාර්මික ශිල්පී 4 වන මට්ටම | **233,730** | 233,730 |
| 10. | නිව් ඒ. සී. එස්. කාර්මික පුහුණු ආයතනය අංක 144, නැලිගම මීරිගම | විදුලි හා ඉලෙක්ට්‍රොනික් කර්මාන්තය | ශීතකරණ හා වායුසමීකරණ ශිල්පී 3 වන මට්ටම | **77,000** | 77,000 |
| **එකතුව** | | | | **3,125,723** | **2,224,818** |

ඉහත වගුව අනුව රු. මිලියන 2.2 ක මුදලක් ආයතන 11 ක පාඨමාලා 11 ක් වෙත 2013.12.31 දින වනවිට ප්‍රදානය කිරීමට හැකිවිය.

නමුත් පෞද්ගලික අංශයේ ආයතන 02 ක් මිලදී ගැනීම් 2013.12.31 වනවිට සම්පූර්ණ කිරීමට නොහැකිවීම නිසා 2014 වර්ෂයේදී මිලදී ගැනීම් සම්පූර්ණ කිරීමෙන් අනතුරුව එම මුදල් ගෙවීම සඳහා එම මුදල් ඉදිරියට ගෙනඑන ලදී. ඒ පිළිබඳ විස්තර පහත වගු අංක 5.5 මඟින් දැක්වේ.

**වගුව 5.5: 2014 වර්ෂයේදී මුදල් ගෙවීම සඳහා උපචිත කරනලද ආයතන**

| අංකය | පුහුණු ආයතනය හා ලිපිනය | කර්මාන්ත ක්ෂෙත්‍රය | පුහුණු පාඨමාලාව හා අපේක්ෂිත NVQ මට්ටම | අනුමත කරනලද මුළු මුදල (රු.) |
|---|---|---|---|---|
| 1. | ෆියුචර් ලින්ක් ඉන්ස්ටිටියුට් ටෙක්නාලොජිකල් ස්ටඩීස් අංක 122, ආර්නෝල්ඩ් රාමනායක මාවත කොළඹ 10 | මෝටර් රථ අළුත්වැඩියාව හා නඩත්තු කර්මාන්තය | මෝටර් රථ කාර්මික ශිල්පී 4 වන මට්ටම | **404,767** |
| 2. | වයි. එම්. සී. ජාත්‍යාන්තර පාසල අංක 11, දුම්රියපොළ පාර මාතර | ලෝහ සහ ලුහු ඉංජිනේරු කර්මාන්තය | ඇලුමිනියම් පිරිසැකසුම් ශිල්පී 3 වන මට්ටම | **72,065** |
| **2013 වර්ෂයේ ප්‍රතිපාදන තුලින් උපචිත කරනලද මුදල** | | | | **476,832** |

2013 වර්ෂයේදී, අමාත්‍යාතුමාගේ හා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා මූල්‍යාධාර ගිවිසුම් අත්සන් කිරීමට නොහැකි වූ ආයතන පිළිබඳ විස්තර වගු අංක 5.6 මඟින් දැක්වේ.

**වගුව 5.6: මූල්‍යාධාර ගිවිසුම් අත්සන් කිරීමට නොහැකි වූ ආයතන**


| අංකය | පුහුණු ආයතනය හා ලිපිනය | පුහුණු පාඨමාලාව හා අපේක්ෂිත NVQ මට්ටම | අනුමත කරනලද මුළු මුදල (රු.) | මූල්‍යාධාර ගිවිසුම් අත්සන් නොකිරීමට හේතුව |
|---|---|---|---|---|
| 1. | ජැෆ්නා කොලේජ් ඉන්ස්ටිටියුට් ඔෆ් ටෙක්නාලොජි වඩුක්කෝඩ් | යන්ත්‍ර ශිල්පී 3 වන මට්ටම | **68,810** | පාඨමාලා ප්‍රතීතන අයඳුම්පත්‍ර ඉදිරිපත් නොකරන ලදී |
| | | පරිගණක දෘඩාංග ශිල්පී 4 වන මට්ටම | **13,720** | |
| | | ඇලුමිනියම් පිරිසැකසුම් ශිල්පී 3 වන මට්ටම | **20,580** | |
| 2. | පාර්ටිසියන් ආයතනය 61, ශාන්ත පැට්රික්ස් පාර යාපනය | ශීතකරණ හා වායුසමීකරණ ශිල්පී 3 වන මට්ටම | **47,250** | මූල්‍යාධාර ගිවිසුම් අත්සන් කරන අවස්ථාව වනවිට පුහුණු ආයතනය නැවත ලියාපදිංචිවීම ප්‍රතික්ෂේප වී තිබීම |
| 3. | දොන් බොස්කෝ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය මන්නාරම | පෑස්සුම් ශිල්පී 3 වන මට්ටම | **17,150** | පාඨමාලා ප්‍රතීතන අයඳුම්පත්‍ර ඉදිරිපත් නොකරන ලදී |
| 4. | ලංකා හෙදි පාසල තැ. පෙ. 05 මල්ලිකා ගොඩනැගිල්ල වෙහැර කුරුණෑගල | හෙද සහයක ශිල්පී 3 වන මට්ටම | **108,360** | මූල්‍යාධාර ගිවිසුම් අත්සන් කිරීම සඳහා නොපැමිණෙන ලදී. |
| **ප්‍රතිපූරණය කිරීමට නොහැකි වූ මුළු මුදල (රු.)** | | | | **275,870** |

ඒ අනුව, රු. 752,702.30 ක මුදල් ප්‍රමාණයක් මෙම වර්ෂය තුලදී ගෙවීමට නොහැකිවිය.

**වගුව 5.7: කර්මාන්ත ක්ෂේත්‍ර අනුව මූල්‍යාධාර ලබාදීම (පෞද්ගලික හා රාජ්‍ය නොවන සංවිධාන අංශය)**

| කර්මාන්ත ක්ෂේත්‍රය | පාඨමාලා ගණන | ප්‍රදානය කළ මුදල (රු.) | ප්‍රතිශතය (%) |
|---|---|---|---|
| විදුලි හා ඉලෙක්ට්‍රොනික් කර්මාන්තය | 02 | 184170 | 07 |
| ලෝහ සහ ලුහු ඉංජිනේරු කර්මාන්තය | 01 | 72,065 | 03 |
| සෞඛ්‍ය ක්ෂෙත්‍රය | 01 | 219030 | 08 |
| මෝටර් රථ අළුත්වැඩියාව හා නඩත්තු කර්මාන්තය | 04 | 1,550,710 | 57 |
| රෙදිපිළි සහ ඇඟලුම් ක්ෂෙත්‍රය | 01 | 404,950 | 15 |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂෙත්‍රය | 03 | 177,555 | 07 |
| ආහාරපාන කර්මාන්තය | 01 | 93,170 | 03 |
| **එකතුව** | **13** | **2,701,650** | **100** |

**ප්‍රස්ථාරය 5:3 කර්මාන්ත ක්ෂේත්‍ර අනුව මූල්‍ය ප්‍රදානය - පෞද්ගලික හා රාජ්‍ය නොවන සංවිධාන අංශය**



පෞද්ගලික හා රාජ්‍ය නොවන සංවිධාන අංශය විසින් වෘත්තීය පුහුණුව සැපයීම සඳහා වැඩි නැඹුරුතාවයක් පෙන්නුම් කරන මෝටර් රථ අළුත්වැඩියාව හා නඩත්තු කර්මාන්තය සඳහා මූල්‍ය ප්‍රතිපාදන වලින් 57% ක මූල්‍යාධාර ප්‍රමාණයක් 2013 වර්ෂයේ දී ලබා දී ඇත. 2013 වර්ෂය තුලදී ලබාදුන් මූල්‍යාධාර එක් එක් ක්ෂේත්‍රය අනුව එම මුදල් බෙදීගොස් ඇති ආකාරය වගු අංක 5.7 මඟින් දැක්වෙන අතර ප්‍රස්ථාර අංක 5.3 මගින් එහි විශ්ලේෂණය දැක්වේ.

### 5.1.3 පීඩාවට පත්වූ තරුණ තරුණියන් සඳහා ක්‍රියාත්මක කරනු ලබන වෘත්තිය හා කාර්මික පුහුණු පාඨමාලා සඳහා මූල්‍යාධාර ප්‍රදානය

ශ්‍රී ලංකාව තුල සිටින පීඩාවට පත්වූ තරුණ තරුණියන්ගේ නිපුණතාවය ඉහළ නැංවීම පිණිස වෘත්තීය පුහුණුව සපයන ආයතනවලට අවශ්‍ය පුහුණු උපකරණ මිලදී ගැනීම සඳහා පාඨමාලා ප්‍රතීතන කොන්දේසියෙන් තොරව මූල්‍යාධාර ලබාදෙනු ලැබේ.

2013 වර්ෂය තුලදී මේ සඳහා රු. මි. 0.65ක් පාඨමාලා 08 ක් සඳහා (සංශෝධිත වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව) ලබාදීමට සැලසුම්කර තිබුණි. ඒ අනුව, තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි වී වෘත්තීය පුහුණුව සපයන ආයතන 03 ක පාඨමාලා 07ක් සඳහා රු. මිලියන 0.58 ක මූල්‍යාධාර ප්‍රමාණයක් ප්‍රදානය කරනලදී. එබැවින් මෙම වැඩසටහන සඳහා අනුමත ප්‍රතිපාදන වලින් 77% ක ප්‍රතිශතයක් වැයකිරීමට හැකියාව ලැබුණි. එය සමස්ත මුදලින් 77% ක ප්‍රතිශතයක් වීමට හේතුවූයේ අයඳුම්කල ආයතන 05 අතුරින් මූල්‍යාධාර ලබාදීමට සුදුසු පාඨමාලා නොතිබුණු බැවිනි. මූල්‍යාධාර ප්‍රදානය කරනලද ආයතන පිළිබඳ විස්තර වගු අංක 5.8 හි දැක්වේ.

**වගුව 5.8: පීඩාවට පත්වූ තරුණ තරුණියන් සඳහා ක්‍රියාත්මක කරනු ලබන වෘත්තිය හා කාර්මික පුහුණුව ප්‍රවර්ධනය සඳහා මූල්‍යාධාර ලබාදීම - 2013**

| අංකය | පුහුණු ආයතනයේ නම | හිමිකාරත්වය | කර්මාන්ත ක්ෂේත්‍රය | පුහුණු පාඨමාලා වේ නම | මුළු එකතුව |
|---|---|---|---|---|---|
| 1. | වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය සමාජ සේවා දෙපාර්තමේන්තුව කැටවල, ලෙවුල නුවර | සමාජ සේවා දෙපාර්තමේන්තුව | විදුලි හා ඉලෙක්ට්‍රොනික් කර්මාන්තය | විදුලි කාර්මික ශිල්පී | **60,700** |
| | | | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රය | පරිගණක දෘඩාංග ශිල්පී | **11,300** |

| අංකය | පුහුණු ආයතනයේ නම | හිමිකාරත්වය | කර්මාන්ත ක්ෂේත්‍රය | පුහුණු පාඨමාලා වේ නම | මුළු එකතුව |
|---|---|---|---|---|---|
| | | | මෝටර් රථ අළුත්වැඩියාව හා නඩත්තු කර්මාන්තය | යන්ත්‍ර ශිල්පී | **49,300** |
| | | | මෝටර් රථ අළුත්වැඩියාව හා නඩත්තු කර්මාන්තය | මෝටර්රථ කාර්මික ශිල්පී | **22,150** |
| 2. | වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය සමාජ සේවා දෙපාර්තමේන්තුව වැවින්න වත්තේගම | සමාජ සේවා දෙපාර්තමේන්තුව | මෝටර් රථ අළුත්වැඩියාව හා නඩත්තු කර්මාන්තය | මෝටර්රථ කාර්මික ශිල්පී | **43,450** |
| | | | සම්භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තය | සම්භාණ්ඩ නිෂ්පාදන ශිල්පී | **55,950** |
| 3. | සෙත්සෙවන වෘත්තීය සංවර්ධන මධ්‍යස්ථානය බෝලවලාන මීගමුව | රාජ්‍ය නොවන සංවිධාන | මුද්‍රණ කර්මාන්තය | පරිගණක චිත්‍රක ශිල්පී | **337,500** |
| | | | | **ප්‍රදානය කරනලද මුළු මුදල** | **580,350** |

### 5.1.4 මූල්‍යාධාර විමර්ශනය කිරීමේ වැඩසටහන

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව යටතේ ලියාපදිංචි වී ඇති රාජ්‍ය හා පෞද්ගලික අංශයේ පුහුණු ආයතනවලට ලබාදෙන මූල්‍යාධාර නිසිපරිදි භාවිතා කොට ඇත්දැයි විමර්ශනය කිරීම සඳහා වාර්ෂික විමර්ශන වැඩසටහනක් ක්‍රියාත්මක කරයි.

මෙම වැඩසටහන යටතේ 2012 වර්ෂයේදී කොමිෂන් සභාව මගින් මූල්‍යාධාර ලබාදුන් පුහුණු ආයතන වෙත ගොස් විමර්ශනයට ලක්කරන ලද අතර, ඒ යටතේ මූල්‍යාධාර ලබාදුන් පාඨමාලා 36 න් 34 ක් පිලිබඳව විමර්ශනය සිදුකරනු ලැබිය.

මෙම වැඩසටහන තුළින් හඳුනාගත් පරිදි මූල්‍යාධාර ලබාදුන් පෞද්ගලික අංශයේ පාඨමාලා 15 අතුරින් පාඨමාලා 07 ක් ප්‍රතීතනය වී ඇත. අනෙකුත් පාඨමාලාද ප්‍රතීතන ක්‍රියාවලියට ඇතුලත්ව අවශ්‍ය කටයුතු සිදුවෙමින් පැවැති බැව් නිරීක්ෂණය විය. රාජ්‍ය අංශයේ මූල්‍යාධාර ලබාදුන් පාඨමාලා 10 ක් ප්‍රතීතනයවී නොමැති බව නිරීක්ෂණය විය. එම අධ්‍යනයේදී හෙලිවූ තොරතුරු සාරාංශයක් වගු අංක 5.9 මගින් දැක්වේ.

වගු අංක 5.9: මූලාධාර විමර්ශනය තුළින් ලද තොරතුරු

| අංශය | මූලාධාර ලබාදුන් ආයතන සංඛ්‍යාව | මූලාධාර ලබාදුන් පාඨමාලා සංඛ්‍යාව | ඇගයීම් කරනලද පාඨමාලා සංඛ්‍යාව | ප්‍රදානය කරනලද මූලාධාර ප්‍රමාණය (රු.) | පුහුණුව ලද සිසුන් සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|---|
| | | | | | **2012** | **2013** |
| රාජ්‍ය | 10 | 10 | 10 | **1,446,652** | 122 | 87 |
| පෞද්ගලික | 10 | 15 | 15 | **2,137,258** | 437 | 384 |
| පීඩාවට පත්වූ තරුණ තරුණියන්ට පුහුණුව සපයන ආයතන | 06 | 11 | 09 | **857,555** | 137 | 113 |
| **එකතුව** | **26** | **36** | **34** | **4,441,465** | **696** | **584** |

### 5.2 වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම් සකස්කිරීම හා යාවත්කාලීන කිරීම

කොමිෂන් සභාව 1999 වසරේ සිට ප්‍රධාන කර්මාන්ත ක්ෂේත්‍ර සඳහා අවශ්‍ය වන නිපුණතා අවශ්‍යතා හඳුනාගැනීම සඳහා වෘත්තිය අධ්‍යාපන හා පුහුණු සැලසුම් සකස් කිරීමෙහි නිරතව සිටී. මෙම වැඩසටහන යටතේ නව වෘත්තීය අධ්‍යාපන පුහුණු සැලසුම් සකස් කිරීම මෙන්ම දැනට සකස්කර ඇති සැලසුම් යාවත්කාලීන කිරීම සිදුවේ. 2013 වර්ෂය වනවිට වෘත්තීය පුහුණු සැලසුම් 18 ක් සකස්කර ඇති අතර සැලසුම් 14 ක් යාවත්කාලීන කර ඇත.

#### 5.2.1 නව වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම් සකස්කිරීම

- **ප්‍රවාහන හා ගබඩාකරණ ක්ෂේත්‍රය**

මෙරට ආර්ථික සංවර්ධනයේ විප්ලවීය පෙරලියක් ඇතිකරන ප්‍රවාහන හා ගබඩාකරන ක්ෂේත්‍රය සඳහා නව වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලැස්මක් සකස්කිරීම 2012 වර්ෂයේ අවසන් කාර්තුවේ දී ආරම්භ කරනලදී. මෙම සැලසුමෙහි කෙටුම්පත් වාර්ථාව සකසා නිමකරන ලද අතර ඇගයීමේ කමිටු රැස්වීමක් 2014 ජනවාරි මාසයේදී පැවැත්වීමට නියමිතය. මෙම වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම මොරටුව විශ්ව විද්‍යාලයට අනුබද්ධ යුනි - කන්සල්ටන්සි සර්විසස් ආයතනය විසින් සිදුකරන ලදී. ඒ සඳහා 2013 වර්ෂය තුලදී රු. 740,480.00 ක වියදමක් දරනලදී. ඒ අනුව, 2013 වර්ෂයේදී අනුමත ප්‍රතිපාදන වලින් 54% ක ප්‍රතිශතයක් වැයකිරීමට හැකියාව ලැබුණි.

### 5.2.2 වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම් යාවත්කාලීන කිරීම


වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම් යාවත්කාලීන කිරීමේ වැඩසටහන යටතේ හඳුනාගත් කර්මාන්ත ක්ෂේත්‍ර 10ක් සඳහා මානව සම්පත් අවශ්‍යතා ඇස්තමේන්තු සකසා නිමකරන ලදී. මෙම ඇස්තමේන්තු සකස්කිරීම 2012 වර්ෂයේදී ආරම්භකරන ලද අතර, 2013 වර්ෂයේදී අපේක්ෂිත පරිදි නිමකිරීමට හැකියාව ලැබුණි.


එසේ සකස්කරන ලද මානව සම්පත් ඇස්තමේන්තු ක්ෂේත්‍ර පහත දැක්වේ.

1. ඉදිකිරීම්
2. මුද්‍රණ
3. මැණික් හා ස්වර්ණාභරණ
4. මෝටර්රථ අළුත්වැඩියාව හා නඩත්තුව
5. ආහාරපාන තාක්ෂණය
6. රූපලාවන්‍ය හා කේෂාලංකරණ
7. ලෝහ හා ලුහු ඉංජිනේරු
8. වැවිලි කර්මාන්තය
9. පරිපූරක වෛද්‍ය සේවා
10. නිම්ඇඳුම් හා ඇඟළුම්

### 5.3 ශ්‍රී ලංකාවේ පළාත්බද වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම් පිළියෙල කිරීම හා ක්‍රියාත්මක කිරීම

1990 අංක 20 දරණ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පනතින් පැවරී ඇති කාර්යභාරය ඉටුකරමින් ශ්‍රී ලංකාවේ පළාත් මට්ටමින් වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම් සකස්කිරීම 2009 වර්ෂයේදී ආරම්භ කරන ලදී. 2013 වර්ෂය වනවිට සබරගමුව, නැගෙනහිර, දකුණු හා වයඹ පළාත් සඳහා පළාත් වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම් සකස්කර අවසන්කර ඇත. උතුරු පළාත සඳහා සකස්කරන වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සුලැස්මේ කෙටුම්පත් වාර්ථාව 2013 වර්ෂයේදී අවසන් කරනලදී. මෙම කෙටුම්පත් වාර්ථාව 2014 වර්ෂයේදී ඇගයීමට නියමිතය. කාලීන අවශ්‍යතාවයක්ව තිබූ මෙම වෘත්තීය පුහුණු සැලසුම් සකස්කිරීම කොමිෂන් සභාව ඉටුකල මහඟු කර්තව්‍යයක් වනු ඇත.




2013 වර්ෂයේ 3 වන කාර්තුව වන විට තවත් පළාත්බද වෘත්තීය පුහුණු සැලසුම් 03 ක් සකස් කිරීමට පියවර ගනුලැබීය. එම වෘත්තීය අධ්‍යාපන පුහුණු සැලසුම්වල විස්තර පහත වගු අංක 5.10 මඟින් දැක්වේ.

**වගු අංක 5.10: වෘත්තීය අධ්‍යාපන පුහුණු සැලසුම්වල විස්තර**

| | පළාත | සැලැස්ම සකස්කිරීම සඳහා භාරදෙන ලද ආයතනය | 2013 වර්ෂයේ ප්‍රගතිය | 2013 වර්ෂය වන විට වියදම (රු.) |
|---|---|---|---|---|
| 1. | බස්නාහිර | කැළණිය විශ්වවිද්‍යාලය | ද්විතීක දත්ත හා ප්‍රාථමික දත්ත විශේල්ෂනය තුලින් පළාතේ ප්‍රධාන කර්මාන්ත ක්ෂේත්‍ර හඳුනාගැනීම සහ පළාත තුළ පාසල් අධ්‍යාපනය නිමකර අළුතින් රැකියා වෙළෙඳපොළට ඇතුලත්වන ශ්‍රම බලකාය පිළිබඳ ඉදිරි අවුරුදු 05 සඳහා පුරෝකථනය සකස්කිරීම ආරම්භකර ඇත. | 199,000 |
| 2. | මධ්‍යම | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | මහනුවර, මාතලේ හා නුවරඑළිය දිස්ත්‍රික්ක 03 සඳහා සැලසුම් වැඩසටහන් 03ක් (Planning Workshops) පවත්වන ලදී. එහිදී ප්‍රධාන කර්මාන්ත ක්ෂේත්‍ර හඳුනාගන්නා ලදී. ද්විතීක දත්ත හා ප්‍රාථමික දත්ත මත ආර්ථික විශේල්ෂනයක් එම පළාත තුල සිදුකරනලදී. එයට අමතරව පළාත තුළ පාසල් අධ්‍යාපනය නිමකර අළුතින් රැකියා වෙළෙඳපොළට ඇතුලත්වන ශ්‍රම බලකාය පිළිබඳ ඉදිරි අවුරුදු 05 සඳහා පුරෝකථනය කරඇත. | 505,325 |


| | පළාත | සැලැස්ම සකස්කිරීම සඳහා භාරදෙන ලද ආයතනය | 2013 වර්ෂයේ ප්‍රගතිය | 2013 වර්ෂය වන විට වියදම (රු.) |
|---|---|---|---|---|
| 3. | ඌව | ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය | බදුල්ල හා මොණරාගල දිස්ත්‍රික්ක 02 සඳහා සැලසුම් වැඩසටහන් 02ක් (Planning Workshops) පවත්වන ලදී. එහිදී ප්‍රධාන කර්මාන්ත ක්ෂේත්‍ර හඳුනාගන්නා ලදී. ද්විතීක දත්ත හා ප්‍රාථමික දත්තමත ආර්ථික විශ්ලේෂණයක් එම පළාත තුල සිදුකරනලදී. එයට අමතරව පළාත තුළ පාසල් අධ්‍යාපනය නිමකර අළුතින් රැකියා වෙළෙඳපොළට ඇතුලත්වන ශ්‍රම බලකාය පිළිබඳ ඉදිරි අවුරුදු 05 සඳහා පුරෝකථනය කරඇත. | 473,268 |

## 5.4 කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂෙත්‍රයේ පර්යේෂණ අධ්‍යයන ක්‍රියාත්මක කිරිම

සැලසුම් හා පර්යේෂණ අංශය මගින් තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ පර්යේෂණ කවය පවත්වාගෙන යනු ලබයි (Research Cell). 2005 වර්ෂයේ සිට ආරම්භ කරනලද පර්යේෂණ කවය මේවන විට කාර්මික හා වෘත්තීය ක්ෂේත්‍රයට වැදගත් පර්යේෂණ රාශියක් එළි දැක්වීම සඳහා මූල්‍යමය හා ශ්‍රම දායකත්වය ලබාදී ඇත. එමෙන්ම නිමකරන ලද පර්යේෂණ අපගේ වෙබ් අඩවිය තුල ඇතුලත්කර ඇත.

2013 වර්ෂයේදී පර්යේෂණ කවයේ ඇස නව මාවතකට යොමුවිය. ඒ අනුව, සැලසුම් හා පර්යේෂණ අංශයේ නිළධාරීන් විසින් 2011 වර්ෂයේ රාජ්‍ය අංශයේ පුහුණුලාභීන් රැකියාගත වීම පිළිබඳ පසුවිපරම් අධ්‍යනයක් සිදුකරන ලදී.

ඒ සඳහා, රු. මිලියන 0.67 ක මුදලක් ඇස්තමේන්තු කරන ලද අතර, එමගින් රු. මිලියන 0.547 කින් නිමකිරීමට හැකිවිය. එම පර්යේෂණ අධ්‍යයනය නියමිත කාලය තුල නිමකිරීමට හැකිවිය. එලෙස නිමකරන ලද පර්යේෂණ අධ්‍යයන වාර්ථාවේ ඡායාරූපයක් පහත දැක්වේ.




**4 වන පර්යේෂණ සමුළුව**


තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මඟින් 04 වන පර්යේෂණ සමුළුව 2013 ජුලි මස 15 වන දින පැවැත්වීමට කටයුතු කරනලදී. එහිදී පර්යේෂණ කවය විසින් 2012 වර්ෂයේදී ආරම්භ කරන ලද පර්යේෂණ අධ්‍යයන 09 ක් එළි දක්වන ලදී. ඒ සඳහා යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ අනුබද්ධ ආයතන රාශියක නිළධාරීන්ගේ සහභාගීත්වය ලැබුණි. එම පර්යේෂණ අධ්‍යානයන් පිළිබඳ විස්තර වගු අංක 5.11 මගින් දැක්වේ.





වගුව 5.11: පර්යේෂණ අධ්‍යයන - 2012

| අංකය | මාතෘකාව | පර්යේෂණ කණ්ඩායම | අනුමත මුදල (රු.) | 2012 වර්ෂය වනවිට වැයවූ මුදල (රු.) | 2013 වර්ෂයේදී වැයවූ මුදල (රු.) |
|---|---|---|---|---|---|
| 1. | කාර්මික අධ්‍යාපනයේ පවතින ශිණුම්කරණ පාඨමාලාවනේග් විෂයමාලාවන් නූතන වැඩලෝකය හා ගැලපීම පිළිබඳ අධ්‍යයනය | කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව | 66,500 | 56,500 | 10,000 |
| 2. | විදේශ රැකියා අපේක්ෂකයින් තම සහතික තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් සහතිකකර ගැනීම හා එමගින් විදේශ රැකියා ලැබීමේ හැකියාව සොයාබැලීමේ පර්යේෂණ අධ්‍යයනය | තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව | 94,750 | 63,490 | 18,000 |
| 3. | ශ්‍රී ලංකාවේ තාක්ෂණ විද්‍යාලතුල ආරම්භ කරනලද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය (NVQ 5) පාඨමාලාවේ ඵලදායීතාවය නංවාලීම සඳහා ගතහැකි ක්‍රියාමාර්ග පිළිබඳ අධ්‍යයනය | කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව | 78,500 | 68,500 | 10,000 |
| 4. | තාක්ෂණ විද්‍යාල තුල ස්ථාපිතකර ඇති තත්ත්ව කළමණාකරන පද්ධතියේ ඵලදායීතාවය සෙවීමේ අධ්‍යයනය | කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව | 120,000 | 15,000 | 105,000 |
| 5. | තාක්ෂණ විද්‍යාලවල පැවැත්වෙන ජාතික වෘත්තීය සුදුසුකම් NVQ 5 & 6 මට්ටම් පාඨමාලාවල ඵලදායීතාවය පිළිබඳ අධ්‍යනය | කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව | 64,000 | 56,000 | 8,000 |
| 6. | තාක්ෂණ විද්‍යාලවල පැවැත්වෙන ජාතික වෘත්තීය සුදුසුකම් පාඨමාලා වලින් සිසුන් අඩු ප්‍රතිශතයක් සමත්වීම පිළිබඳ හේතු සෙවීමේ අධ්‍යයනය | කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව | 99,000 | 20,000 | 79,000 |

| අංකය | මාතෘකාව | පර්යේෂණ කණ්ඩායම | අනුමත මුදල (රු.) | 2012 වර්ෂය වනවිට වැයවූ මුදල (රු.) | 2013 වර්ෂයේදී වැයවූ මුදල (රු.) |
|---|---|---|---|---|---|
| 7. | තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ ජා. වෘ. සු. මට්ටම් 5 හා 6 හදාරා පාඨමාලාව අවසන්කල සිසුන්ගේ පසුවිපරම් අධ්‍යයනය | තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව | 197,000 | 7,500 | 182,000 |
| 8. | NVQ ඇගයීම් ක්‍රමයේ සංගතභාවය පිළිබඳ අධ්‍යයනය | තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව | 141,750 | 120,050 | 10,000 |
| 9. | වෘත්තීය පුහුණුව තුලින් වෘත්තීය සාර්ථකත්වය ලැබූවන්ගේ ජීවන ගමන්මග පිළිබඳ අධ්‍යයනය | තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව | 165,000 | 65,000 | 45,700 |
| | වැඩමුළු හා අනෙකුත් වියදම් | | | | 78,980 |
| **මුළු වියදම** | | | **1,028,511** | **474,051** | **546,680** |



2013 වර්ෂයේදී ආරම්භකල ක්ෂේත්‍ර අධ්‍යයනය සඳහා රු. මිලියන 0.547 ක මුදලක් හා 2012 වර්ෂයේදී ආරම්භ කරනලද පර්යේෂණ අධ්‍යයන සඳහා රු. මිලියන 0.546 ක මුදලක් වැයවිය. ඒ අනුව, සමස්ත වියදම රු. මිලියන 1.093 ක් වේ. ඒ අනුව, 2013 වර්ෂයේදී අනුමත ප්‍රතිපාදන වලින් 91.1% ක ප්‍රතිශතයක් වැයකිරීමට හැකියාව ලැබුණි.

## 5.5 තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ සංයුක්ත සැලැස්ම යාවත්කාලීන කිරීම හා ඒ අනුව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම

කොමිෂන් සභාවේ සංයුක්ත සැලැස්ම අවුරුදු 05 ක කාල රාමුවක් සඳහා (2014-2018) යාවත්කාලීනකර සකස් කරන ලද අතර, මෙය "මහින්ද චින්තනය" මත පදනම් වූ දස අවුරුදු සංවර්ධන සැලැස්මෙහි අඩංගු නිපුණතා සංවර්ධන ප්‍රතිපත්ති හා අරමුණු ඉටුවන ආකාරයට හා යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ දස අවුරුදු සැලැස්මෙහි සඳහන් ඉලක්ක ඉටුවන ආකාරයට සකස් කරන ලදී. සංයුක්ත සැලැස්ම අනුව වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම සකස් කරන ලද අතර, එහිදී රාජ්‍ය අයවැය වෙන් කිරීම්ද, විදේශ නියෝජිතායතන මගින් ලැබෙන මූල්‍යාධාරද සැලකිල්ලට යොමුකරන ලදී. යාවත්කාලීන කරන ලද සංයුක්ත සැලැසුමේ මුල් කෘතියේ අනුරූපයක් පහත දැක්වේ.



## 6.0 පාඨමාලා ප්‍රතීතන හා පුහුණු සම්මත අංශය

1990 අංක 20 දරණ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනතට සහ අංක 887/8 දරන 1995 සැප්තැම්බර් මස 07 වන දින රජයේ ගැසට් පත්‍රයට (අතිවිශේෂ) අනුව කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රයෙහි පුහුණු ආයතනයන්හි තත්ත්ව ආරක්ෂණය ඇති කිරීම සහ පවත්වාගෙන යාම අරමුණු කර ගෙන පාඨමාලා ප්‍රතීතන හා පුහුණු සම්මත අංශය පහත සඳහන් කාර්යයන් ඉටු කරනු ලබයි.

1. පුහුණු ආයතන ලියාපදිංචි කිරීම
2. පුහුණු පාඨමාලා ප්‍රතීතනය කිරීම
3. තත්ත්ව කළමනාකරණ පද්ධති ස්ථාපනය කිරීම සඳහා මග පෙන්වීම හා විගණනය

ඉහත කාර්යයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා මෙම අංශයෙහි නිලධාරීන් දොළොස් දෙනෙකුගෙන් යුත් කාර්යමණ්ඩලයක් සිටින අතර එය එක් වැඩ බලන අධ්‍යක්ෂකවරයෙක්, නියෝජ්‍ය අධ්‍යක්ෂකවරියක්, සහකාර අධ්‍යක්ෂකවරු තිදෙනෙක්, සංවර්ධන නිලධාරින් තිදෙනෙක්, කළමනාකරණ සහකාර තිදෙනෙක් හා කාර්යාල කාර්ය සහායකවරයෙකුගෙන් සමන්විත විය. ඉහත දක්වා ඇති අරමුණු ඉටු කර ගැනීම සඳහා පාඨමාලා පිළිගැනීම් හා පුහුණු සම්මත අංශය මගින් 2013 වසර තුලදී ඉටු කරන ලද කාර්යභාරය පහත පරිදි වෙයි.

### 6.1 වෘත්තීය පුහුණු ආයතන ලියාපදිංචි කිරීම.

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපනය හා පුහුණුව සපයන ආයතන කොමිෂන් සභාවේ ලියාපදිංචි කිරීම නීතිමය අවශ්‍යතාවයකි. 1990 අංක 20 දරන තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පනතින් ආයතන ලියාපදිංචි කිරීම සඳහා විධි විධාන සපයා ඇති අතර 1995 සැප්තැම්බර් මස 07 වන දින අංක 887/8 දරන රජයේ ගැසට් පත්‍රයෙන් ආයතන ලියාපදිංචියට අදාළ නිර්නායක දක්වා ඇත. දිවයිනේ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ක්ෂේත්‍රයන්හි තත්ත්වය හා අදාලත්වය තහවුරු කිරීමේ අරමුණින් මෙම විධිවිධාන සහ නිර්නායක වලට අනුව ආයතන ලියාපදිංචිය කරනු ලබයි.

ආයතන සතු යටිතල පහසුකම්, පුහුණු උපකරණ, උපදේශකවරුන්ගේ සුදුසුකම්, පුහුණුව සැපයීම සහ ඇගයීම, විෂය නිර්දේශයන්ගේ ප්‍රමාණාත්මක බව, ශිෂ්‍ය සුභසාධනය හා පුහුණුවේ අදාළත්වය යන නිර්නායක ආයතන ලියාපදිංචි කිරීමේදී ඇගයීමට ලක් කෙරෙයි.

2013 වසරෙහි කොමිෂන් සභාවෙහි වාර්ෂික සැලසුමට අනුව අලුතින් ලියාපදිංචි කිරීම සඳහා ආයතන 225 ක් ඇගයීමට සැලසුම් කර තිබූ අතර මෙම වසර තුලදී ආයතන 256 ක් ඇගයීම් කරන ලදී. එය ඉලක්කගත ප්‍රමාණයට වඩා 31ක වැඩි වීමකි.

ඒ පිළිබඳ විස්තර වගු අංක 6.1 හි දැක්වේ.

**වගුව 6.1: අළුතින් ලියාපදිංචිය සඳහා පුහුණු ආයතන ඇගයීම**

| | ආයතන සංඛ්‍යාව |
|---|---|
| **ඉලක්කය** | 225 |
| **ප්‍රගතිය** | 256 |


ක්‍රියාකාරී සැලැස්මෙහි 2013 වසර සඳහා ඉලක්කයක් තබා ගත්තද ආයතන ලියාපදිංචිය සඳහා ලැබෙන සම්පූර්ණ කරන ලද සියලුම අයදුම්පත් ඇගයීමට ලක් කරන අතර සුදුසුකම් සපුරා ඇති ආයතන ලියාපදිංචි කරනු ලැබේ. පුවත්පත් දැන්වීම්, අත්පත්‍රිකා හා ප්‍රවර්ධන වැඩසටහන් මගින් අදාල පාර්ශවයන් දැනුවත් කිරීම සහ ලියාපදිංචි කිරීමේ අවශ්‍යතාවය සමාජගත වීම අයදුම්පත්‍ර වැඩි ප්‍රමාණයක් ලැබීමට හේතු විය හැක.

ඉහත සඳහන් අළුතින් ලියාපදිංචිය සඳහා ඇගයීම් කරන ලද ආයතන 256න් ආයතන 168ක් ලියාපදිංචි නිර්ණායක සපුරා තිබීම නිසා 2013 වසර තුළ අළුතින් ලියාපදිංචි කරන ලදී. අදාල ලියාපදිංචි නිර්ණායක සපුරා නොතිබීම නිසා අනෙකුත් ආයතන ලියාපදිංචිය සඳහා නිර්දේශ නොකරණ ලදී.

එම අළුතින් ලියාපදිංචි ආයතනයන්හි හිමිකාරත්වය අනුව විශ්ලේෂණය පහත දැක්වේ.

| | | |
|---|---|---|
| 1. | රාජ්‍ය අංශයට අයත් පුහුණු ආයතන | 12 |
| 2. | ව්‍යවස්ථාපිත මණ්ඩල/සංස්ථා යටතට අයත් පුහුණු ආයතන | 42 |
| 3. | රාජ්‍ය නොවන සංවිධාන මගින් ක්‍රියාත්මක පුහුණු ආයතන | 15 |
| 4. | පෞද්ගලික අංශයට අයත් පුහුණු ආයතන | 99 |
| | **එකතුව** | **168** |

**ප්‍රස්තාරය 6.1 - හිමිකාරත්වය අනුව ආයතන ලියාපදිංචිය 6.1**



## 6.2 පුහුණු මධ්‍යස්ථාන වල ලියාපදිංචිය අළුත් කිරීම

1995 සැප්තැම්බර් මස 07 වන දින පළ කෙරුණු අංක 887/8, දරන රජයේ ගැසට් පත්‍රයේ (අති විශේෂ) සඳහන් නිර්ණායක වලට අනුකූලව පුහුණු ආයතන ඇගයීම් කර, පුහුණු ආයතන වෙත ආයතන වර්ගීකරණ අනුව අවුරුදු 02 ක හෝ 03 ක කාලයට සීමාවූ තාවකාලික ලියාපදිංචියක් ලබා දෙනු ලැබේ. මෙම කාලය අවසන් වීමෙන් පසු පුහුණු ආයතන විසින් තම ලියාපදිංචිය අලුත් කිරීම සඳහා කොමිෂන් සභාව වෙත අයදුම් කළ යුතුයි.

2013 වසර තුළදී ආයතන 250 ක් ලියාපදිංචිය යාවත්කාලීන කිරීමට සැලසුම් කර තිබූ අතර ලියාපදිංචිය අලුත් කිරීම සඳහා ආයතන 264 ක් ඇගයීමට ලක්කර ඉන් ආයතන 250ක් ලියාපදිංචිය අලුත් කරන ලදී. ( 2012 වසරේ ලියාපදිංචිය අලුත් කිරීමට තිබූ ආයතන වලින් ලැබූ අයදුම්පත්‍ර ද සමඟ) 2013 වසර තුළ ලියාපදිංචිය යාවත්කාලීන කිරීම් ඇගයීම් 14 ක් ඉලක්ක ගත ප්‍රමාණයට වඩා වැඩියෙන් සිදුකොට ඇත.

පහත සඳහන් හේතූන් මත එම ආයතන 14ක ලියාපදිංචිය අළුත් නොකරන ලදි.

- පාඨමාලා කාලය ප්‍රමාණවත් නොවීම
- පාඨමාලා වලට අදාළ විෂය මාලාවන් සහ නව අධ්‍යයන කාර්යය මණ්ඩලයන්හි තොරතුරු ලබා නොදීම
- ඉදිරිපත් කර ඇති විෂය මාලා වලට අනුව පාඨමාලා නොපැවැත්වීම
- ලියාපදිංචි කර ඇති සහ අළුතින් ලියාපදිංචිය සඳහා ඉල්ලා ඇති පාඨමාලා පවත්වන බවට තොරතුරු නොතිබීම
- පාඨමාලාවට අදාළව වැඩහල් පහසුකම්, ඉඩකඩ සහ උපකරණ ප්‍රමාණවත් නොවීම

ලියාපදිංචිය අළුත් කිරීම පිළිබඳ විස්තර පහත වගුවෙදි දක්වා ඇත.

වගුව **6.2: පුහුණු ආයතන ඇඟයීම , ලියාපදිංචිය අළුත් කිරීම.**

| | ආයතන සංඛ්‍යාව |
|---|---|
| ඉලක්කය | 250 |
| ප්‍රගතිය | 264 |

2013 වසරේ ඔක්තෝබර් මාසය තෙක් කොමිෂන් සභාවේ ලියාපදිංචිය ලැබූ හා ලියාපදිංචිය අළුත් කරන ලද පුහුණු ආයතන වල ලැයිස්තුවක් 2014 පෙබරවාරි මස රජයේ ගැසට් පත්‍රයේ නිකුත් කිරීමට අපේක්ෂා කරන අතර, TVEC වෙබ් අඩවිය (www.tvec.gov.lk) මගින් ලියාපදිංචි කරන ලද ආයතන පිළිබඳ තොරතුරු ප්‍රසිද්ධ කර ඇත.

### 6.3 2013 වසරේදී වෘත්තීය පුහුණු ආයතන ලියාපදිංචිය ප්‍රවර්ධනය කිරීම සඳහා ක්‍රියාත්මක කළ වැඩසටහන්

මෙම කොමිෂන් සභාවේ ලියාපදිංචි නොකර සමහර පුහුණු ආයතන ව්‍යාජ ප්‍රචාර මගින් සිසුන් නොමග යැවීමේ විවිධ ව්‍යාපාර පවත්වාගෙන යනු ලැබේ. එම ප්‍රචාර වලට සිසුන් රැවටීම වැළැක්වීමටත්, පුහුණුවේ ගුණාත්මකභාවය වැඩි කිරීමටත් පුහුණු ආයතන ලියාපදිංචිය හා ලියාපදිංචිය අළුත් කිරීම පිළිබඳව මහජනතාව හා පුහුණුව සපයන්නන් දැනුවත් කිරීම පිණිස පහත සඳහන් වැඩසටහන් 2013 වසර තුළ සැලසුම් කොට ක්‍රියාත්මක කරන ලදී.

1. පුවත් පත් දැන්වීම් මගින් දැනුවත් කිරීම

- 2013 සැප්තැම්බර් 15 වන දින සිළුමිණ, ඉරිදා ලංකාදීප, වීරකේසරී, Sunday Observer පුවත්පත් වල,
- 2014 ජනවාරි 05 වන දින සිළුමිණ, ඉරිදා ලංකාදීප, වීරකේසරී, Sunday Observer පුවත්පත් වල,




2. අත්පත්‍රිකා මඟින් දැනුවත් කිරීම.

ආයතන ලියාපදිංචි කිරීම හා ලියාපදිංචිය අලුත් කිරීම පිළිබඳව සිංහල හා දෙමළ මාධ්‍යයෙන් අත්පත්‍රිකා මුද්‍රණය කර දැයට කිරුළ සහ අනෙකුත් වැඩසටහන් වල බෙදාහරින ලදී.

3. 2013 පෙබරවාරි 22 දින රජයේ ගැසට් පත්‍රය මඟින් දැනුවත් කිරීමට කටයුතු යොදා ඇත.

### 6.4 පාඨමාලා ප්‍රතීතනය

ශ්‍රී ලංකාවේ ජාතික වෘත්තීය සුදුසුකම් රාමුව 2004 වසරේ දී හඳුන්වා දෙන ලදි. ලියාපදිංචි පුහුණු ආයතන වල පවත්වන පාඨමාලා NVQ සුදුසුකම් ප්‍රධානය කිරීම සඳහා සකස් කිරීම ප්‍රතීතනය තුළින් අරමුණු කරයි. මෙහිදී ජාතික නිපුණතා සම්මතයන්හි හඳුනාගන්නා කර්මාන්තයට අවශය නිපුණතාවය පුහුණු වන්නන්ට ලබා දෙන පරිදි පුහුණු නිර්නායකයන් සකස් කරනු ලබයි. ලියාපදිංචි පුහුණු ආයතන තුළ පවත්නා පාඨමාලා ජාතික වෘත්තීය සුදුසුකම් ප්‍රදානය කිරීම සඳහා සකස් කිරීම පාටමාලා ප්‍රතීතනය තුළින් අරමුණු කරයි.

මෙහිදී ජාතික නිපුණතා සම්මතයන්හි හඳුනා ගත් කර්මාන්තයට අවශ්‍ය නිපුණතා පුහුණු වන සිසුන්ට ලබා දෙන පරිදි පාඨමාලා ප්‍රතීතන නිර්නායකයන් සකස් කරනු ඇත.

එම නිර්නායක සපුරන්නේ නම් පාඨමාලා ප්‍රතීතනය කර ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය පිරිනැමීම සඳහා අනුමැතිය දෙනු ලැබේ.

ඒ අනුව පාඨමාලා ප්‍රතීතනය පිළිබඳ 2013වසරේ ඉලක්කයන් හා ප්‍රගතිය පහත වගුවෙන් දක්වා ඇත.

**වගුව 6.3 - ප්‍රතිතනය සඳහාපාඨමාලා ඇගයීම් හා ප්‍රතීතනය කිරීමේ ඉලක්ක හා ප්‍රගතිය - 2012**

| පුහුණු ආයතන | ඇගයීම් කිරීම | |
|---|---|---|
| | ඉලක්කය | ප්‍රගතිය |
| රාජ්‍ය අංශය | 320 | 440 |
| පුද්ගලික හා රාජ්‍ය නොවන සංවිධාන | 75 | 117 |
| | 395 | 557 |

ඒ අනුව ජාතික නිපුණතා සම්මතයන්ට අනුකූලව පවත්වාගෙන යනු ලබන රාජ්‍ය අංශයට අයත් පුහුණු පාඨමාලා 440 ක් ප්‍රතීතනය සඳහා ඇගයීම් කර ඇති අතර මෙයින් පාඨමාලා 309 ක් ප්‍රතීතනය කර ඇත. 2013 වසර අවසාන වන විට කොමිෂන් සභාව විසින් ප්‍රතීතනය කර ඇති රාජ්‍ය අංශයට අයත් මුළු පුහුණු පාඨමාලා සංඛ්‍යාව 1175 ක් වේ.

2013වසරේ දී පෞද්ගලික හා රාජ්‍ය නොවන අංශයේ ක්‍රියාත්මක පුහුණු පාඨමාලා 117ක් ප්‍රතීතනය සඳහා ඇගයීම් කර ඇත. මෙයින් පාඨමාලා 67 ක් ප්‍රතීතනය කරන ලදී. ඒ අනුව 2013 වසර අවසාන වන විට පෞද්ගලික හා රාජ්‍ය නොවන අංශයේ ප්‍රතීතනය කරන ලද මුළු පාඨමාලා සංඛ්‍යාව 426 කි.

2013 වසර අවසාන වන විට ප්‍රතීතනය කර ඇති මුළු පාඨමාලා සංඛ්‍යාව 1601 කි.

වගුව 6.4 අනුව රාජ්‍ය අංශයේ ප්‍රතීතන ඇගයීම් කිරීම අපේක්ෂිත ඉලක්කයට වඩා 120 කින් සහ පුද්ගලික හා රාජ්‍ය නොවන අංශයේ අපේක්ෂිත ඉලක්කයට වඩා 42 කින් වැඩි වී ඇත.

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මඟින් බඳවා ගැනීමේ පටිපාටියට ජාතික වෘත්තීය සුදුසුකම් ක්‍රමය හඳුන්වා දීමත්, විදේශ සේවා නියුක්ති කාර්යාංශය මඟින් ගෘහස්ථ ගෘහ පාලන සහයකයින්ට NVQ සහතික අනිවාර්ය කිරීමත්, නව නිපුණතා සම්මත හඳුන්වා දීමත්,

ජාතික වෘත්තීය සුදුසුකම් ක්‍රමය ජනප්‍රිය වීමත් නිසා පාඨමාලා ප්‍රතීතන ඉල්ලුම්පත්‍ර ලැබීම හේතුවෙන් අදාල ඉලක්කයට වඩා පාඨමාලා 162 ක් ඇගයීම් කර ඇත.

ඇගයීම් කල සංඛ්‍යාව 440 වුවද රාජ්‍ය අංශයේ පාඨමාලා ප්‍රතීතනයවූ සංඛ්‍යාව 309කි. පුහුණු උපකරණ ප්‍රමාණවත් නොවීම, සුදුසුකම් ලත් උපදේශකවරු නොමැති වීම, සම්මතයන්ට අනුව පුහුණුව පවත්කවාගෙන නොයාම හා අඛන්ඩ ඇගයීම් නොපැවැත්වීම යන කරුණු නිසා පාඨමාලා ප්‍රතීතනය කිරීමට නොහැකි විය. පාඨමාලා ප්‍රතීතනය නොවීමට බලපෑ හේතු අදාළ ආයතන වලට දන්වා යවා ඇත. 2013 වසර තුළදී ඇගයීම් කළ මුළු පාඨමාලා සංඛ්‍යාව 557 ක් වන අතර ඉන් 376 ක් ප්‍රතීතනය කර ඇත.

**2013 වසර අවසන් වන විට ප්‍රතීතනය කරන ලද පුහුණු පාඨමාලා පිලිබඳ විස්තර ආයතන වශයෙන් පහත දැක්වේ.**

වගුව **6.4 - ප්‍රතීතනය කරන ලද පුහුණු පාඨමාලා**

| පුහුණුව සපයන ආයතන | ලද අයදුම්පත් සංඛ්‍යාව (2013 වසර තුළ) | ඇගයුම් කරන ලද පාඨමාලා සංඛ්‍යාව (2013)* | 2013 වසර තුළදී ප්‍රතීතනය කරන ලද පාඨමාලා | ප්‍රතීතනය කරනු ලැබූ මුළු පාඨමාලා සංඛ්‍යාව (2013 වසර අවසානයේ දී) |
|---|---|---|---|---|
| ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය | 20 | 33 | 33 | 99 |
| ජාතික තරුණ සේවා සභාව | 24 | 56 | 18 | 82 |
| කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව | 74 | 90 | 57 | 249 |
| ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය | 184 | 218 | 148 | 683 |
| වෙනත් රාජ්‍ය ආයතන | 67 | 43 | 53 | 62 |
| පෞද්ගලික හා රාජ්‍ය නොවන සංවිධාන | 107 | 117 | 67 | 426 |
| **එකතුව** | **476** | **557** | **376** | **1601** |

* පෙර වසරේ දී ලද අයදුම්පත් ද ඇගයීමට ලක්කර ඇත.
* දෙසැම්බර් මස භාරදුන් අයදුම්පත් ඇගයීමට ලක්කර නැත. .

## 6.5 ප්‍රතීතනය අලුත් කිරිම

ප්‍රතීතනය කරන ලද පාඨමාලාවක වලංගු කාලය වසර 03 ක් වන අතර එම වසර 03 අවසානයේ ප්‍රතීතනය අළුත් කල යුතුය. ඒ අනුව 2013 වසර තුල රාජ්‍ය අංශයේ පාඨමාලා 127 ක් සහ පෞද්ගලික අංශයේ සහ රාජ්‍ය නොවන සංවිධාන වල පාඨමාලා 50 ක් ප්‍රතීතනය අළුත් කිරිම සඳහා ඇගයීම් කල යුතුව තිබිණි. මෙම වසර තුලදී රාජ්‍ය අංශයේ පාඨමාලා 111 ක් ඇගයීම් කරන ලද අතර පාඨමාලා 117ක් ප්‍රතීතනය අළුත් කරන ලදි. මෙම රාජ්‍ය අංශයේ ඇගයීම් සඳහා පසුගිය වසරේ අයදුම්පත් ලැබූ සහ ඇගයුම් කරන ලද පාඨමාලාද ඇතුළත් වේ. එමෙන්ම පෞද්ගලික අංශයේ සහ රාජ්‍ය නොවන සංවිධාන වල පාඨමාලා 36 ක් ඇගයීම් කරන ලද අතර ඉන් පාඨමාලා 34 ක් ප්‍රතීතනය අලුත් කරන ලදි.

පුහුණු ආයතනවල පැවති පහත හේතු නිසා රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ සහ රාජ්‍ය නොවන සංවිධාන වල පාඨමාලා ප්‍රතීතනය අලුත් කිරීමට නොහැකි වූ අතර පාඨමාලා ප්‍රතීතනය අලුත් නොවීමට බලපෑ හේතු අදාළ ආයතන වලට දන්වා යවා ඇත.

- අදාළ සැලසුම් වලට අනුව පාඨමාලා නොපැවැත්වීම.
- අදාළ ජාතික නිපුණතා සම්මතයට සහ විෂය මාලාවට අන්තර්ගතය නොතිබීම.
- අඛණ්ඩ ඇගයීම නොපැවැත්වීම සහ වාර්තා තබා නොගැනීම.
- ශිෂ්‍ය ප්‍රගති වාර්තා පොත සහ අනෙකුත් අදාළ වාර්තා පවත්වාගෙන නොයෑම.
- පාඨමාලා ප්‍රතීතනයේදී ( මීට අවුරුදු 3 කට පෙර ) තිබූ යන්ත්‍ර සූත්‍ර , උපකරණ, ආවුද සහ පහසුකම් නොතිබීම.

**2013 වසර අවසන් වන විට ප්‍රතීතනය අලුත් කරන ලද පුහුණු පාඨමාලා පිලිබඳ විස්තර ආයතන වශයෙන් වගු අංක 6.5 හි දැක්වේ.**

**වගුව 6.5- ප්‍රතීතනය අලුත් කරන ලද පුහුණු පාඨමාලා**

| පුහුණුව සපයන ආයතන | ලද අයදුම්පත් සංඛ්‍යාව (2013වසර තුල) | ඇගයුම් කරන ලද පාඨමාලා සංඛ්‍යාව (2013)* | 2013 වසර තුලදී ප්‍රතීතනය අලුත් කරන ලද පාඨමාලා |
|---|---|---|---|
| ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය | 01 | 02 | 06 |
| ජාතික තරුණ සේවා සභාව | 04 | 06 | 07 |
| කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව | 12 | 22 | 20 |
| ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය | 89 | 78 | 81 |
| වෙනත් රාජ්‍ය ආයතන | 03 | 03 | 03 |
| පෞද්ගලික හා රාජ්‍ය නොවන සංවිධාන | 31 | 36 | 34 |
| **එකතුව** | **140** | **125** | **151** |

*පෙර වසරේ දී ලද අයදුම්පත් ද ඇගයීමට ලක්කර ඇත.

*දෙසැම්බර් මස භාරදුන් අයදුම්පත් ඇගයීමට ලක්කර නැත.

## 6.6 පාඨමාලා ප්‍රතීතනය ප්‍රවර්ධනය කිරීම සඳහා පවත්වන ලද වැඩසටහන්

විවිධ දිස්ත්‍රික්කයන්හි ලියාපදිංචිය ලත් පුහුණුව සපයන ආයතන වල උපදේශකවරුන්ට පාඨමාලා ප්‍රතීතනය සඳහා පුහුණු සැලසුම් හා ඇගයීම් ක්‍රම වේදයන් සකස් කිරීම පිළිබඳව වැඩමුළු7 ක් පවත්වා උපදේශකවරු 213 ක් පුහුණු කරන ලදී.

## 6.7 ISO 9001: 2008 තත්ත්ව කළමණාකරණ පද්ධතිය ස්ථාපිත කිරීම සඳහා ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්

ආයතන ලියාපදිංචිය සහ පාඨමාලා ප්‍රතීතනය මගින් පුහුණුවේ ගුණාත්මකභාවය දියුණු කිරීම සඳහා කටයුතු කරනු ලැබේ. නමුත් පුහුණුවේ ගුණාත්මකභාවය තවදුරටත් පවත්වා ගැනීම සඳහා පුහුණු ආයතන වල තත්ත්ව කළමණාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීමට තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව කටයුතු කරනු ලබයි.

ජාතික වෘත්තීය සුදුසුකම් මෙහෙයුම් අත්පොතට අනුව ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම් 5 සහ 6 පවත්වන පුහුණු ආයතන තත්ත්ව කළමණාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම අනිවාර්යය වේ.

තත්ත්ව කළමනාකරණ පද්ධතිය ස්ථාපිත කිරිමේ පියවර වනුයේ;

1. තත්ත්ව කළමනාකරණ අත්පොත ( Quality Manual ) පිළියෙල කිරීම.
2. හඳුනාගත් ක්‍රියාවලීන් සඳහා ක්‍රියාවලීන් (Processes) ගොඩනැඟීම.
3. ක්‍රියාමාර්ගඅත්පොත පිළියෙළ කිරීම.
4. තත්ත්ව කළමනාකරණ අත්පොත සහ ක්‍රියාමාර්ග අත්පොත තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවට භාරදුන් පසු ඒවා පරීක්ෂා කර අඩුපාඩු සකසා ගැනීම.
5. තත්ත්ව විගනන පැවැත්වීම සහ තත්ත්ව කළමනාකරණ පද්ධති අනුමත කිරීම.
6. තත්ත්ව කළමනාකරණ පද්ධතිය සඳහා සහතික නිකුත් කිරීම.

කාර්මික අධ්‍යාපන සංවර්ධන ව්‍යාපෘතිය මගින් ISO 9001: 2008 සහ IWA 2007 සම්මතයන්ට පදනම් කරගෙන තත්ත්ව කළමනාකරණ පද්ධතියක් හඳුන්වා දෙන ලදි.

පුහුණු ආයතනයෙහි තත්ත්ව කළමනාකරණ පද්ධතිය ස්ථාපිත කිරීම, අධීක්ෂණය කිරීම උදෙසා කාර්යක්ෂම ක්‍රියාපිළිවලක් සැකසීම ද මෙම අංශයෙහි වගකීමකි.
තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ආයතනයන්හි තත්ත්ව කළමණාකරණ පද්ධතිය ස්ථාපිත කිරීමට අදාල පහත සඳහන් වැඩසටහන් සහ ක්‍රියාවලීන් 2013 වසර තුලදී මෙම අංශය මගින් ක්‍රියාත්මක කරන ලදී.

- 2013 වසරේ දී තත්ත්ව සංග්‍රහයන් 03 ක් (Quality Manual) කොමිෂන් සභාව වෙත භාර දෙන ලදි. එම තත්ත්ව සංග්‍රහයන් පරික්ෂා කිරීමෙන් අනතුරුව එම ආයතන වෙත නැවත භාර දුන් අතර ඒවා නිවැරදි කර තත්ත්ව කළමනාකරණ අයදුම්පත සමග කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලෙස දැනුම් දෙන ලදී.
- පුද්ගලික සහ රාජ්‍ය නොවන අංශයේ තත්ත්ව කළමනාකරණ සහතිකය ප්‍රදානය කරන ලද ආයතන 02ක තත්ත්ව විගණන වාර්ථා ඉදිරිපත් කරන ලදී.
- දැනටමත් තත්ත්ව කළමණාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීමට අවශ්‍ය කටයුතු සංවිධානය කරමින් පවතින කාර්මික අධ්‍යාපන සහ වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයේ ආයතන සඳහා තත්ත්ව කළමනාකරණය සහ අභ්‍යන්තර විගනනය පිළිබඳ පුහුණු වැඩසටහන් 3 ක් පවත්වන ලදී.

## 6.8 පුහුණු ආයතන වල ලියාපදිංචිය සනාථ කිරීම.

වෘත්තීය පුහුණු ආයතන වලින් නිකුත් කරන ලද සහතික විදේශ රැකියා ලබා ගැනීම සඳහා ඉදිරිපත් කිරීමේදී ඒවායේ පිළිගැනීම තහවුරු කල යුතුය. විදේශ කටයුතු අමාත්‍යාංශය, තානාපති කාර්යාල හා සුදුසුකම් ඇගයීමේ මණ්ඩල (Qualification Verification Councils and Authorities ) විසින් එම සහතික කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබයි.

2013 වසර තුළදී විදේශ කටයුතු අමාත්‍යාංශයේ අවශ්‍යතාව මත විදේශ රැකියා ගත වන්නන්ගේ සහතික තහවුරු කිරීමේ ලිපි 425 ක් නිකුත් කරන ලදී.

එමෙන්ම, 2013 වසර තුළදී රාජ්‍ය ආයතන වල බඳවාගැනීම්, උසස් කිරීම් සඳහා සහතික තහවුරු කිරීමේ ලිපි 375 ක් නිකුත් කරන ලදී.

## 6.9 2013 වසර තුලදී පාඨමාලා ප්‍රතීතන හා පුහුණු සම්මත අංශය මගින් උපයාගනු ලැබූ ආදායම

| | |
|---|---|
| ශිෂ්‍ය ප්‍රගති වාර්ථා අලෙවියෙන් උපයාගත් ආදායම | - රු. 1,436,385 |
| ආයතන ලියාපදිංචි ගාස්තු | - රු 1,048,500 |
| පාඨමාලා ප්‍රතීතන ගාස්තු | - රු. 1,369,500 |
| තත්ව කළමණාකරණ පද්ධති විගණනය | |
| **2013 වසරේ දී පාඨමාලා ප්‍රතීතන සහ පුහුණු සම්මත අංශයේ** | - |
| **මුලු ආදායම** | රු. **3,854,385** |

## 7.0 ජාතික වෘත්තීය සුදුසුකම් අංශය

ජාතික වෘත්තීය සුදුසුකම් රාමුව ක්‍රියාත්මක කිරීමේ අරමුණින් ජාතික වෘත්තීය සුදුසුකම් අංශය එහි ඉලක්කගත අරමුණු කරා ලගා වීමේදී මෙම අංශය විසින් පස්වැදෑරුම් ක්‍රියාකාරකම් මාලාවක් 2013 වර්ෂය තුලදී ක්‍රියාවට නංවන ලදී.

1. ජාතික වෘත්තීය සුදුසුකම් ක්‍රමය මහජනතාව අතර ප්‍රචලිත කිරීම සඳහා රාජ්‍ය හා කර්මාන්ත ක්ෂේත්‍රයන් සඳහා දැනුවත් කිරීමේ ක්‍රියාකාරකම්,
2. ජාතික නිපුණතා සම්මත සහ ආශ්‍රිත ලේඛන සංවර්ධනය හා යාවත්කාලීන කිරීමේ ක්‍රියාකාරකම්,
3. ජාතික වෘත්තීය සුදුසුකම් ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ ඍජු හා වක්‍ර ක්‍රියාකාරකම්,
4. කොමිෂන් සභාව තුල තත්ත්ව කළමණාකරණ පද්ධතිය ස්ථාපනය කිරීම සඳහා වූ සහතිකකරණය යාවත්තාකාලීන කිරීමේ ක්‍රියාකාරකම්

සහ

5. 2013 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මට පරිබාහිරව පැවැත්වූ NVQ සහ වෙනත් ක්‍රියාකාරකම්.

ඉහත සඳහන් කළ පස්වැදෑරුම් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක වූ අයුරු පහත දැක්වේ,

### 7.1 ජාතික වෘත්තීය සුදුසුකම් ක්‍රමය ප්‍රචලිත කිරීම සඳහා රාජ්‍ය හා කර්මාන්ත ක්ෂේත්‍රයන් සඳහා දැනුවත් කිරීමේ ක්‍රියාකාරකම්,

i. 2013 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මට අනුව NVQ පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් 03ක් යෝජිත විය. ඒ අනුව ජලසම්පාදන මණ්ඩලයේ හා රජයේ කර්මාන්ත දෙපාර්තමේන්තුවේ සේවක මණ්ඩලය සඳහා වැඩසටහන් 02ක් ද සුළු ව්‍යාපාර සංවර්ධනය කිරීමේ අංශය යටතේ ලියාපදිංචි වී ඇති ව්‍යවසායකයන් සඳහා එක් වැඩසටහනක්ද පවත්වන ලදී. මෙම වැඩසටහන් සඳහා නිලධාරීන්, සේවක මහත්ම මහත්මීන් 180 ක් පමණ සහභාගී විය.

   මීට අමතරව පඩි පාලක සභාව සඳහා NVQ සුදුසුකම් ඇතුලත් කර පෞද්ගලික අංශයේ සේවක මණ්ඩල සඳහා NVQ සුදුසුකමට අනුව අවම වැටුපක් ලබා දීමට ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳව සාකච්ඡාවාර කිහිපයක්ම පවත්වන ලදී.

ii. 2013 වර්ෂය තුළදී දැයට කිරුළ ප්‍රදර්ශන කටයුතුවලට සමගාමීව අම්පාර දිස්ත්‍රික්කයේ නගරසභා හා ප්‍රාදේශීය සභාවන්හි සේවය නියුතු සන අපද්‍රව්‍ය මෙහෙයුම් සහකාර වෘත්තීයට අදාල සේවක මහත්ම මහත්මීන් සඳහා NVQ දැනුවත් කිරීමේ වැඩසටහන් සහ සහතික ලබා දීම සඳහා ඇගයීම් කටයුතු වලට යොමු කිරීම සිදුකරන ලදී. මෙහිදී සේවක මහත්ම මහත්මීන් 90 දෙනෙකු තම NVQ සහතිකපත් ලබා ගන්නා ලදී.

## 7.2 ජාතික නිපුණතා සම්මත සහ ආශ්‍රිත ලේඛන සංවර්ධනය හා යාවත්කාලීන කිරීමේ ක්‍රියාකාරකම්.

i. 2013 වසරේදී පහත සඳහන් නව ජාතික නිපුණතා සම්මත සංවර්ධනය කරන ලදුව ඒවා බලලත් කරන ලදී.

**සංවර්ධනය කරන ලද ජාතික නිපුණතා සම්මතයන්**

**a) NVQ මට්ටම් 1 – 4**

- දන්ත ශල්‍ය හෙද සහයක (Dental Surgery Nurse Assistant)
- මසුන් ඇල්ලීමේ තාක්ෂණ ශිල්පී ( Fish Harvesting Technician)
- ගොඩනැඟිලි සේවා තාක්ෂණ ශිල්පී (Building Service Technician)
- එලිවේටර් තාක්ෂණ ශිල්පී (Elevator Technician)
- ජීවිත ආරක්ෂක (Life Guard)
- කෘෂිකර්ම උපකරණ කාර්මික ශිල්පී (Agriculture Equipment Mechanic-සංශෝධිත)
- ඇඳුම් මෝස්තර නිර්මාණකරු (Outfit Designer - සංශෝධිත )
- කුරුඳු ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් (Cinnamon Field Operation)
- කුරුඳු කර්මාන්තශාලා ක්‍රියාකාරකම්(Cinnamon Factory Operation)
- කාර්යාල ඉදිරිපස කාර්යයන් (Front office Operation)
- ප්‍රජා පදනම් සංචාරක සහයක (Community Based Tourism Assistant)
- Housekeeping Supervisor
- ප්‍රථමාධාරකරු (First Aider)
- සංචාරක මගපෙන්වන්නා ( Tour Guiding)
- චාරිකා සහ සංචාරක ක්‍රියාකාරකම් (Travel & Tour Operation)
- නාගරික ඝන අපද්‍රව්‍ය මෙහෙයුම් පාලක (Solid Waste Work Supervisor )
- වෘත්තීය ආරක්ෂාව හා සෞඛ්‍ය (Occupation Safety and Health)
- සිද්ධි ක්‍රියාකාරකම් (Event Operation)
- රිගර් (Rigger)
- මසුන් ඇල්ලීමේ යාත්‍රා ශිල්පී ( Fishing Vessels Skipper)

**b) NVQ මට්ටම් 5/6**

- තේ තාක්ෂණය (Tea Technology)*
- විලේපන වේදය (Cosmetology)*
- රසායන හා ක්‍රියාවලි තාක්ෂණය (Chemical and Process Technology)*
- Renewable Energy Technology*
- පාවහන් නිශ්පාදන හා කලමණාකරණය (Footwear Production Technology)*
- නාවික ප්‍රවර්ධන කලමණාකරණය (Maritime and Logistic Management)*
- ජලචර සම්පත් තාක්ෂණය (Aquaculture and Aquatic Resource)*
- ගොඩනැඟිලි සේවා තාක්ෂණය (Building Service Technology)*
- වාරිමාර්ග තාක්ෂණය (Irrigation Technology)*
- වැවිලි භෝග තාක්ෂණය (Plantation Crop Technology)*

- අභ්‍යන්තර නිර්මාණකරණ තාක්ෂණය (Interior Design Technology)*
- පොලිමර් තාක්ෂණය (Polymer Technology)*
- බර වාහන නඩත්තු කිරීමේ තාක්ෂණය (Heavy Vehicle Maintain Technology)*
- පසු අස්වනු තාක්ෂණය (Post harvest Technology)*
- සත්කාරක සේවා කලමණාකරණය (Hospitality Management)*
- විලාසිතා නිර්මාණකරණ තාක්ෂණය ( Fashion Designing Technology)*
- රූපවාහිනි වැඩසටහන් නිශ්පාදන තාක්ෂණය (Television Programe Production Technology)*
- රූපවාහිනි පසු නිශ්පාදන තාක්ෂණය (Television Post Production Technology) *
- දෘශ්‍ය සන්නිවේදන හා කලමණාකරණය (Visual communication & Management)*
- පුවත්පත් කලාවේදී තාක්ෂණය ( Journalism And Technology)*
- මසුන් ඇල්ලීමේ තාක්ෂණය (Fishi
- ng Technology)*
- විදුලි තාක්ෂණය (Electrical Technology)*
- ඉලෙක්ට්‍රොනික් තාක්ෂණය (Electronic Technology)*
- මුද්‍රණ තාක්ෂණය සහ කළමනාකරණය (Printing Technology and Management)*
- සිද්ධි කළමනාකරණය (Event Management)*

✳ මෙම ජාතික නිපුණතා සම්මත යෝජිත තාක්ෂණ විශ්ව විද්‍යාල 20 සඳහා අමාත්‍යංශයේ උපදෙස් මත සංවර්ධනය කරන ලදී. ජාතික නිපුණතා සම්මත බලලත් කිරීම කොමිෂන් සභාව විසින් සිදුකරන ලදී.

**සංවර්ධනය කරන ලද විෂය මාලා**

**a) NVQ මට්ටම් 1 – 4**

- මල්කරු (Florist)
- දැව කාර්මික ශිල්පී (Wood Craftsman - සංශෝධිත)
- ජල නල කාර්මික ශිල්පී (Plumber- සංශෝධිත)
- කේෂාලංකරණ ශිල්පී (Hair Stylist - සංශෝධිත)
- මෙවලම් හා මුද්‍රා තැනුම්කරු (Tool & die Maker)
- Bar Bender
- ඇඳුම් මෝස්තර නිර්මාණකරු (Outfit Designer)

**b) NVQ මට්ටම් 5/6 -**

- තේ තාක්ෂණය (Tea Technology)*
- විලේපන වේදය (Cosmetology)*
- රසායන හා ක්‍රියාවලි තාක්ෂණය (Chemical and Process Technology)*
- Renewable Energy Technology*
- පාවහන් නිශ්පාදන හා කලමණාකරණය (Footwear Production Technology)*
- නාවික ප්‍රවර්ධන කලමණාකරණය (Maritime and Logistic Management)*
- ජලචර සම්පත් (Aquaculture and Aquatic Resource)*
- ගොඩනැඟිලි සේවා තාක්ෂණය (Building Service Technology)*

- වාරිමාර්ග තාක්ෂණය (Irrigation Technology)*
- වැවිලි භෝග තාක්ෂණය (Plantation Crop Technology)*
- අභ්‍යන්තර නිර්මාණකරණ තාක්ෂණය (Interior Design Technology)*
- පොලිමර් තාක්ෂණය (Polymer Technology)*
- බර වාහන නඩත්තු කිරීමේ තාක්ෂණය (Heavy Vehicle Maintain Technology)*
- පසු අස්වනු තාක්ෂණය (Post harvest Technology)*
- සත්කාරක සේවාකලමණාකරණය (Hospitality Management)*
- විලාසිතා නිර්මාණකරණ තාක්ෂණය ( Fashion Designing Technology)*
- දෘශ්‍ය සන්නිවේදන හා කලමණාකරණය (Visual communication & Management)*
- පුවත්පත් කලාවේදී තාක්ෂණය ( Journalism And Technology)*
- මසුන් ඇල්ලීමේ තාක්ෂණය (Fishing Technology)*
- විදුලි තාක්ෂණය (Electrical Technology)*
- විද්‍යුත් තාක්ෂණය (Electronic Technology)*
- සිද්ධි කළමනාකරණය (Event Management)*

✳ මෙම විෂයමාලා යෝජිත තාක්ෂණ විශ්ව විද්‍යාල 20 සඳහා අමාත්‍යාංශයේ උපදෙස් මත සංවර්ධනය කරන ලදී. විෂයමාලා බලලත් කිරීම කොමිෂන් සභාව විසින් සිදුකරන ලදී.

**ii. සිංහල හා දෙමළ භාෂාවන්ට පරිවර්තනය කරන ලද ජාතික නිපුණතා සම්මත,**

a) පහත සඳහන් නිපුණතා සම්මත සිංහල භාෂාවට පරිවර්තනය කරන ලදී. 2013 වර්ෂයේ ඉලක්ක ගත පරිවර්තන 05 කි.

- වැඩලොව සඳහා මූලික නිපුණතා
- පැල තවාන් සංවර්ධන සහකාර
- ක්ෂේත්‍ර සහායක (කෘෂිකර්ම)
- ගෘහස්ත පාලක සහායක
- කෘෂිකර්ම යන්ත්‍රසූත්‍ර සහ උපකරණ කාර්මික ශිල්පි

b) පහත සඳහන් නිපුණතා සම්මත දෙමළ භාෂාවට පරිවර්ථනය කරන ලදී. 2013 වර්ෂයේ ඉලක්ක ගත පරිවර්තන 10 කි.

- කිරි එකතු කිරීමේ මධ්‍යස්ථාන සහායක
- කිරි දෙවීමේ යන්ත්‍ර ක්‍රියාකරු
- සත්ව ආහාර නිෂ්පාදන කර්මාන්තශාලා සහායක
- ජලනල කාර්මික ශිල්පී (සංශෝධිත)
- විද්‍යුත් මෝටර් එතුම් ශිල්පී
- පැස්සුම් ශිල්පී (සංශෝධිත)
- ශීතකරණ හා වායු සමීකරණ කාර්මික ශිල්පී (සංශෝධිත)
- වාහන සේවාකරු
- දන්ත ශල්‍ය හෙද සහායක
- ජීවිත ආරක්ෂක
- මාර්ග ඉදිකිරීම් ශිල්පී
- මසුන් ඇල්ලීමේ යාත්‍රා ශිල්පී

## 7.3 ජාතික වෘත්තීය සුදුසුකම් ක්‍රමය ක්‍රියාත්මක කිරිමේ සෘජු හා වක්‍ර ක්‍රියාකාරකම්

i. 2013 වාර්ෂික ක්‍රියාකරකම් සැලැස්මට අනුව නව නිපුණතා සම්මත හඳුන්වා දීම හා ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා වූ වැඩමුළු 02ක් පැවැත්වීමට යෝජිත වූ අතර එම වැඩමුළු 02 ම පවත්වන ලදී.

**පළමු වැඩමුළුව - ඔක්තෝම්බර් 2013**

මෙම වැඩමුළුවේදී පහත සඳහන් නිපුණතා සම්මතයන් හඳුන්වා දෙන ලදී.

- සත්ත්ව ආහාර නිෂ්පාදන කර්මාන්තශාලා සහායක
- සත්ත්ව ආහාර නිෂ්පාදන සහායක
- කිරි නිෂ්පාදන ගොවිබිම් සහායක

මේ සඳහා නිලධාරීන් 28 දෙනෙකු සහභාගී වන ලදී.

**දෙවන වැඩමුළුව - දෙසැම්බර් 2013**

මෙම වැඩමුළුවේදී පහත සඳහන් නිපුණතා සම්මතයන් හඳුන්වා දෙන ලදී

- බිම් අලංකරණ ශිල්පී
- මුදල් අයකැමි
- වීඩියෝ පට සංස්කාරක
- Gaffer (Film and TV lighting person)

මේ සඳහා නිලධාරීන් 47 දෙනෙකු සහභාගී වන ලදී

ii. 2013 වර්ෂය තුළදී NVQ චක්‍ර ලේඛනයක් කොමිෂන් සභා වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරන ලදී.

**04/2013**

ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ජාතික ඩිප්ලෝමාවෙහි (NDES) විදුලි ඉංජිනේරු වැඩසටහන NVQ මට්ටම් 06ට සම කිරීම.

iii. NVQ නොවන පාඨමාලාවන් හදාරන ලද අයදුම්කරුවන් හට NVQ සම මට්ටම් නිර්ණය කිරීමේ ක්‍රියාවලිය තුලින් සහතික ලබා දීම

මේ සඳහා පැවැත්වූ පරික්ෂණයෙන් සමත් වූවන් සඳහා NVQ සම කිරීම් **සහතික පත්‍ර** පහත සඳහන් අයුරින් ලබා දෙන ලදී,

| **පාඨමාලාව** | **සහතික පත්‍ර** |
|---|---|
| කර්මාන්ත තාක්ෂණය සඳහා වූ ජාතික සහතිකය (සිවිල්) (NCIT) | 5 |
| ජාතික තාක්ෂණ සහතිකය (සිවිල්) | 4 |
| ජාතික තාක්ෂණ සහතිකය (යාන්ත්‍රික) | 7 |
| ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ජාතික ඩිප්ලෝමා (සිවිල්) | 6 |
| ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ජාතික ඩිප්ලෝමා (යාන්ත්‍රික) | 4 |

iv. NVQ මට්ටම් 5 සහ 6 පාඨමාලා පවත්වනු ලබන සියළුම වෘත්තීය පුහුණු ආයතන සම්බන්ධිකරණ හා උපදේශනය සැපයීම,

තෝරාගත් තාක්ෂණ විද්‍යාල 3ක (අනුරාධපුර, රත්නපුර, යාපනය) පවත්වාගෙන යනු ලබන NVQ මට්ටම් 5 සහ 6 පාඨමාලාවන්හි සමාසික ඇගයීම්, අවසාන ඇගයීම් සහ අඛණ්ඩ ඇගයීම් පිළිබඳව විගණනයන් සිදුකරන ලදී.

මෙහි විගණන විමසුම් හි පිටපත් අදාල තාක්ෂණ විද්‍යාලවලට, කාර්මික හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවට සහ අමාත්‍යාංශය වෙත ඉදිරි කටයුතු සඳහා යොමුකර ඇත.

NVQ මට්ටම් 5 සහ 6 පාඨමාලා පවත්වාගෙන යනු ලබන සියළුම වෘත්තීය පුහුණු ආයතන විසින් පවත්වනු ලබන සමාසික හා අවසාන ඇගයීම් සඳහා වූ ලබා දෙන ප්‍රශ්න පත්‍ර ප්‍රමිතිකරණය කිරීමට හා ඇගයීම් සඳහා අවශ්‍ය ඇගයුම්කරුවන් පත් කිරීමේ කාර්යයන්හි නිරත වීම. 2013 සඳහා පාඨමාලා 10ක් හි ඇගයීම් ප්‍රමිතිකරණය සහ ඇගයීම්කරුවන් පත්කිරීම සිදුකරන ලදී.

v. NVQ මට්ටම් 1 සඳහා වූ "වැඩලොව සඳහා මූලික නිපුණතාවය" යන නිපුණතා සම්මතය වෘත්තීය පුහුණු ක්ෂේත්‍රය තුල ප්‍රචලිත කිරීමේ වැඩසටහන,
NVQ පාඨමාලා පවත්වාගෙන යනු ලබන පුහුණු ආයතනයන්හි නියුතු දේශක, උපදේශක මහත්ම මහත්මීන් **30** දෙනෙකු සඳහා NVQ මට්ටම් 1 - "වැඩලොව සඳහා මූලික නිපුණතාව" යන ජාතික නිපුණතා සම්මතයෙහි අඩංගු නිපුණතාවයන් හඳුන්වා දීම හා එම නිපුණතා, දැනට පවත්වාගෙන යනු ලබන පාඨමාලාවන් සඳහා ඇතුලත් කර ගැනීම පිළිබඳව දැනුවත් කිරීම මෙහිදි සිදුකරන ලදී. මෙම වැඩසටහන් සඳහා ජාතික තරුණ සේවා සභාව, ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය, කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව, යොවුන් සේනාංකය හා ප්‍රතීතනය කරන ලද පෞද්ගලික පුහුණු ආයතන යන සියළුම ආයතනයන් නියෝජනය කරමින් උපදේශක මහත්ම මහත්මීන් සහභාගී වන ලදී. මෙය දින දෙකක නේවාසික වැඩසටහනක් වූ අතර UNIVOTEC ආයතනයේ අධීක්ෂණයෙන් යුතුව පවත්වන ලදී.

## 7.4 කොමිෂන් සභාව තුළ තත්ත්ව කලමණාකරණ පද්ධතිය ස්ථාපනය කිරිම සඳහා වූ සහතිකකරණය යාවත්කාලීන කිරීම,

**i.** මෙම ක්‍රියාවලියේදී 2013 වර්ෂය තුල සියළුම අංශ අභ්‍යන්තර විගණනයකට ලක් කර කලමණාකරණ සමාලෝචන රැස්වීමක් පවත්වා අභ්‍යන්තර විගණන වාර්ථා සමාලෝචනය කරන ලදී.

**ii**. කොමිෂන් සභාව වෙත ISO 9001:2008 තත්ත්ව කලමණාකරණ පද්ධතිය සඳහා ලබාගත් ප්‍රමිති සහතිකය 2013 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් විගණනය කර යාවත්කාලීන කිරීම සඳහා යොමු වීම සහ එම සහතික යාවත්කාලීන කර ගැනීම.

## 7.5 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට පරිභාහිරව පැවැත්වූ වෙනත් ක්‍රියාකාරකම්

**i.** දැනට සකස් කර ඇති නිපුණතා සම්මත හා විෂය මාලා ඇතුලත් කොට සකස් කරන ලද CD තැටි අලෙවි කිරීම සඳහා අවශ්‍ය පරිදි පුස්තකාලය වෙත නිකුත් කිරීම,

**ii.** රූපලාවන්‍ය ශිල්පී හා කොන්ඩා සැකසුම් ශිල්පී යන වෘත්තීන් සඳහා පළමු ලිඛිත ඇගයීම 2013 වර්ෂයේ ජූලි මාසයේදී දිවයින පුරා මධ්‍යස්ථාන 06කදි පැවැත්වීම සහ ඒවායේ ප්‍රථිපල නිකුත් කිරීම.මේ සඳහා සිසුන් 2803 දෙනෙකු විභාගයට පෙනී සිටින ලදී.

**iii.** දීර්ඝකාලීන පලපුරුද්දක් සහිත වෘත්තීය පුහුණු ක්ෂේත්‍රෙය් නියුතු නිලධාරින් සඳහා NVQ 5 මට්ටමට සමාන සහතිකයක් ලබා දීම වෙනුවෙන් අයදුම්පත් කැඳවා තිබූ අයදුම්කරුවන් හට 2013 දෙසැම්බර් 21 දින ලිඛිත පරික්ෂණය පැවැත්වීම. මෙම පරීක්ෂණය සඳහා අපේක්ෂකයින් 126 දෙනෙකු පෙනී සිටින ලදී.

**iv.** යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය විසින් අළුතින් නිම වීමට නියමිත තාක්ෂණික විශ්ව විද්‍යාල 20ක් සඳහා NVQ මට්ටම් 5 සහ 6 සඳහා නිපුණතා සම්මත 22 හා විෂයමාලා 22 සකස් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සංවිධානය හා Cosmetology හා Tea Technology යන නිපුණතා සම්මත විෂයමාලා සහ ඇගයීම් ලේඛන (NVQ මට්ටම් 5 සහ 6) සංවර්ධනය කිරීමේ කාර්යන්හි නිරත වීම.

**V.** ඉහත සඳහන් කරනු ලැබූ නිපුණතා සම්මත 22 සඳහා හේතුවාදී වාර්තාව (Rational) සටහන් සකස් කිරීම සහ නිපුණතා සම්මත හා විෂයමාලා සංස්කරණය කිරීම හා සම්බන්ධීකරණය කිරීම

**vi.** ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලට අනුබද්ධ වෘත්තීය පුහුණු ආයතනයේ ආරම්භ කරන ලද ජීව වෛද්‍ය උපකරණ තාක්ෂණය (Bio Medical Equipment – Technology) NVQ මට්ටම් 5/6 වෘත්තීය පුහුණු පාඨමාලාව සඳහා අවශ්‍ය කටයුතු සංවිධානය කිරීම සම්බන්ධීකරණය හා දැනුවත් කිරීමේ වැඩමුළුවක් පැවැත්වීම

## 7.6 ජාතික වෘත්තීය සුදුසුකම් ඇගයීම්

**ඇගයීම් ඒකකය.**

ජාතික වෘත්තීය සුදුසුකම් අංශය යටතේ පවතින ඇගයීම් ඒකකය විසින් 2013 වසර තුල වැඩ සටහන් කිහිපයක් ක්‍රියාත්මක කරන ලද අතර එම වැඩ සටහන් වල ප්‍රගතිය පහත සඳහන් අයුරු වේ.

i. අන්තර් ආයතනික මෙහෙයුම් කමිටු (ජාතික වෘත්තිය සුදුසුකම්) රැස්වීම් පැවැත්වීම.

ජාතික වෘත්තීය සුදුසුකම් ක්‍රමය ක්‍රියාත්මක කිරීමේදී මතුවන ගැටළු හඳුනා ඒවාට විසඳුම් සෙවීම අරමුණු කොට ගෙන යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයට අයත් රාජ්‍ය ආයතනවල ප්‍රධාන විධායක නිලධාරින්ගෙන් හා ජ්‍යේෂ්ඨ කලමනාකරුවන්ගෙන් මෙම කමිටුව සමන්විත වේ. ගත වූ වසර තුල මෙවන් කමිටු රැස්වීම් 6 ක් පැවැත්විමට සැලසුම් කර තිබූ අතර එම රැස්වීම් සියල්ලම පැවැත්වීමට හැකි විය.

ii. නිපුනතා පාදක ඇගයීම්කරුවන්ගේ අවශ්‍යතාවයන් හඳුනා ගැනීම.

ජාතික වෘත්තීය සුදුසුකම් ප්‍රදානය කිරීම සඳහා සිදු කෙරෙන ඇගයීම් පැවැත්වීම සඳහා යොදා ගනු ලබන්නේ අප කොමිෂන් සභාවේ ලියාපදිංචි සංචිතයේ සිටින නිපුනතා පාදක ඇගයීම් නිලධාරී / නිලධාරිනියන් වේ. 2013 වසර සඳහා ප්‍රගුන කල යුතු ක්ෂේත්‍ර හා ඇගයීම් නිලධාරී / නිලධාරිනියන්ගේ සංඛ්‍යාව සොයා ගැනීම සඳහා 2012 වසර අවසානය වන විට සංචිතයේ ලියාපදිංචි වී ඇති ඇගයීම් නිලධාරී / නිලධාරිනියන් පිළිබද විස්තර සොයා ගැනීම මෙම කාර්යයෙහි අරමුණ වේ. මෙම කාර්යය මගින් නිපුනතා පාදක ඇගයීම් නිලධාරී / නිලධාරිනියන්ගේ භූගෝලීය පිහිටීම පිළිබදවද අදහසක් ලබා ගැනීම තවත් මෙහි එක් අරමුණකි. මෙම අවශ්‍යතාවයන් එක් වාරයක් ලබා ගැනිමට සැලසුම් කර තිබූ අතර එය 2013 වර්ෂය ආරම්භක කාලයේ දීම ඉටු කර ගන්නා ලදී.

එම භූගෝලීය පිහිටීම පිළිබඳ කෙරෙන ලේඛනය වගු අංක 7.1 හි දක්වා ඇත.

වගුව 7.1 ඇගයීම්කරුවන්ගේ භූගෝලීය ව්‍යාප්තිය

| **දිස්ත්‍රික්කය** | **ඇගයීම්කරුවන් සංඛ්‍යාව** |
|---|---|
| Ampara | 64 |
| Anuradhapura | 35 |
| Badulla | 45 |
| Batticaloa | 35 |
| Colombo | 342 |
| Galle | 114 |
| Gampaha | 187 |
| Hambathota | 54 |
| Jaffna | 21 |
| Kalutara | 132 |
| Kandy | 96 |
| Kegalle | 42 |
| Kilinochchi | 0 |
| Kurunegala | 103 |
| Mannar | 0 |
| Matara | 77 |
| Mathale | 26 |
| Moneragala | 12 |
| Mullathivu | 0 |
| Nuwara Eliya | 14 |
| Polonnaruwa | 7 |
| Puttalam | 21 |
| Ratnapura | 30 |
| Trincomalee | 10 |
| Vauniya | 23 |
| **මුළු එකතුව** | **1490** |

iii. නිපුනතා පාදක ඇගයීම්කරුවන් ලෙස පුහුනු කිරීම සඳහා අයදුම්කරුවන් තෝරා ගැනීම සඳහා සම්මුඛ පරීක්‍ෂන පැවැත්වීම.

ඇගයීම්කරුවන් ලෙස පුහුණු වීමට කැමති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් ලබා ගැනීම අප කොමිෂන් සභාව විසින් සිදු කෙරේ.ඒ සඳහා විශේෂයෙන් සකසන ලද අයදුම්පතක් හා විස්තර අප ඒකකයෙහි පවතින අතර ඕනෑම අයෙකු හට එම ඉල්ලුම් පත් සම්පූර්ණ කොට අප හට භාරදිය හැක.එම විස්තර පරික්ෂා කොට පවත්වාගෙන යනු ලබන එම අයදුම්පත් ලේඛනයට ඇතුලත් කරනු ඇත.අවශ්‍යතාවයන් මත එම ඉල්ලුම් පත් පරික්ෂා කොට, ඔවුන් කැඳවා සම්මුඛ පරීක්ෂනයක් මගින් සුදුසු අයදුම්කරුවන් තෝරා ගැනේ. මේ සඳහා කැඳවීම් ලිපි සකස් කිරීම සම්මුඛ පරීක්ෂන මණ්ඩල පත් කිරීම හා අනෙකුත් අදාල කටයුතු අප ඒකකය විසින් සිදු කෙරෙන අතර පසුගිය වසර තුල පවත්වන ලද සම්මුඛ පරීක්ෂන වල විස්තර පහත වගු අංක 7.2 හි දැක්වේ.

වගුව 7.2 අයදුම්කරුවන්ගේ සම්මුඛ පරීක්‍ෂණ විස්තර

| සම්මුඛ පරීක්ෂන පැවති දිනය | කැඳවන ලද සංඛ්‍යාව | පැමිණි සංඛ්‍යාව | තෝරා ගත් සංඛ්‍යාව |
|---|---|---|---|
| 2013.01.23 | 38 | 31 | 30 |
| 2013.01.24 | 34 | 27 | 26 |
| 2013.01.29 | 40 | 32 | 28 |
| 2013.06.06 | 38 | 27 | 19 |
| 2013.08.02 | 32 | 24 | 14 |
| 2013.08.13 | 04 | 04 | 03 |
| 2013.10.22 | 07 | 06 | 05 |
| 2013.10.23 | 17 | 16 | 10 |
| 2013.10.29 | 61 | 52 | 39 |
| **එකතුව** | **271** | **219** | **174** |

iv. නිපුනතා පාදක අයදුම්කරුවන් ලෙස පුහුණු කෙරෙන පාඨමාලා පැවැත්වීම.

සම්මුඛ පරීක්ෂන වලින් තෝරා ගත් අයදුම්කරුවන්ගේ ලේඛනය වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලය වෙත අප කොමිෂන් සභාව යැවීමෙන් අනතුරුව කණ්ඩායම් වශයෙන් සිසුන් පුහුණු කිරීම තාක්ෂණ විශ්ව විද්‍යාලය විසින් සිදු කෙරේ.අදාල පාඨමාලාවන් සාර්ථකව අවසන් කරන අයදුම්කරුවන් වෙත පහත සඳහන් ලේඛන සකසා ඔවුන් වෙත භාර දීම අප කොමිෂන් සභාව විසින් සිදුකෙරේ.

1.අදාල ඇගයීමේ සම්පත් කට්ටලයන්.

2.ඇගයීම් සඳහා භාවිතා කරන ලේඛන හා ෆෝරම්

ඊට අමතරව ඔවුන් වෙත ලියාපදිංචි අංකයක් ලබා දෙන අතර එම අංකය යටතේ ඔවුන්ගේ අදාල විස්තර සමග අප කොමිෂන් සභාවේ වෙබ් අඩවියෙහි සඳහන් වන නිපුනතා අයදුම්කරුවන්ගේ සංචිතයට ඔවුන් ඇතුලත් කෙරේ.2013 වසර තුල පුහුණුව සාර්ථක ලෙස සම්පූර්ණ කරන ලද එවැනි නිපුනතා පාදක ඇගයීම්කරුවන් 146 ක් මෙම සංචිතයට ඇතුලත් කර ඇත.

v. පෞද්ගලික හා රාජ්‍ය අංශයේ පුහුනු ආයතනවල නිපුනතා පාදක ඇගයීම් පැවැත්වීම.

පෞද්ගලික අංශයේ පුහුනු මධ්‍යස්ථාන වල 2012 වසර දක්වා සහතික ප්‍රදානය සඳහා කෙරෙන ඇගයීම් කටයුතු සඳහා ඇගයීම් නිලධාරීන් පත්කරන ලද්දේ අප කොමිෂන් සභාව විසිනි. ඒ අනුව අදාල ඇගයීම් කටයුතු සඳහා ඇගයීම්කරුවන් තෝරා ගැනීම හා ඔවුන් පත් කිරීම සිදු කරන ලදී.එබැවින් 2013 වසර සඳහා ඒ සඳහා වු ඉලක්කය පාඨමාලා 408 කි.

රාජ්‍ය අංශයේ සිදු කෙරෙන ඇගයීම් කටයුතු නියාමනය කරන ලද්දේ ඒ ඒ ආයතන විසිනි.නමුත් එම ඇගයීම් කටයුතු සඳහා පත් කෙරෙන ඇගයීම්කරුවන් තෝරා ගැනීමේ පාරදෘශ්‍ය භාවය අඩු කම, ඇගයීම් කටයුතු නිසියාකාරව සියළුම ඇගයීම්කරුවන් අතර සමසේ බෙදී නොයෑම පිළිබඳ යම් යම් පැමිණිලි ලැබීම් හේතුවෙන් සියලුම රාජ්‍ය ආයතන වල සිදු වන ඇගයීම් කටයුතු නියාමනය කිරීම 2013 වසරේ අගෝස්තු මාසයේ සිට යෞවන කටයුතු හා නිපුනතා සංවර්ධන ආමාත්‍යාංශය විසින් අප කොමිෂන් සභාව වෙත භාර කරන ලදී.මෙම හේතුව නිසා එක් වරම අප ඒකකය විසින් කෙරෙන කාර්යය භාරයෙහි විශාල ලෙස වැඩි වීමක් සිදුවූ අතර ඒ අනුව 2013 වසර තුලදි අප විසින් සම්බන්ධීකරණය කරන ලද ඇගයීම් සංඛ්‍යාව 1034 ක් දක්වා ඉහල යන ලදී. අදාල අනුමැතිය ලබා ඇති පාඨමාලා සංඛ්‍යාවෙහි විස්තර පහත දැක්වේ.

- පෞද්ගලික ආයතන හා අප අමාත්‍යාංශයට අයත් නොවන රාජ්‍ය ආයතන - පාඨමාලා 390
- කාර්මික අධ්‍යාපන හා පුහුනු කිරීමේ දෙපාර්තුමේන්තුව - පාඨමාලා 99
- ශ්‍රී ලංකා වෘත්තීය පුහුනු කිරීමේ අධිකාරිය - පාඨමාලා 87
- ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුනු කිරිමේ අධිකාරිය -පාඨමාලා 36
- ජාතික තරුණ සේවා සභාව -පාඨමාලා 25
- ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යංශය -283

  ඒ යටතේ ලියාපදිංචි වී ඇති පෞද්ගලික ආයතන -75
- පෙර දැනුම හැදිනීමේ ක්‍රමය - ඉල්ලීම් 39

vi. ශ්‍රීලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මගින් NVQ සහතික ප්‍රදානය කිරීමේ කටයුතු සමාලෝචන කිරිමේ රැස්වීම් පැවැත්වීම.

ශ්‍රී ලාකිකයන් ගෘහ සේවිකා තනතුර සඳහා දිවයිනෙන් පිටත්ව යාමේදී ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය අනිවාර්යය කර ලීමේ යෝජනාවක් 2013 වසරේ මාර්තු මාසයේදී කැබිනට් මණ්ඩලය විසින් සම්මත කොට ගෙන තිබුනි. ඒ අනුව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යංශය මගින් පවත්වා ගෙන යනු ලබන පුහුනු මධ්‍යස්ථාන 23 ක් හා එම කාර්යංශය යටතේ ලියාපදිංචි දී ඇති පෞද්ගලික අංශයට අයත් ව්‍යාපෘති මධ්‍යස්ථාන 13 ක පාඨමාලා හදාරන ලද අය වෙත ජාතික වාත්තීය සුදුසු කම් ප්‍රදානය කර ලීමේ වගකීම 2013 මැද භාගයේදී සිට අප කොමිෂන් සභාව වෙත පැවරුනි. එම සහතික ප්‍රදානය කරලීමට පෙරාතුව එම වටපිටාව ඒ සඳහා සුදානම් කරලීමේ අභියෝගය අප ඉදිරියේ විය. ඒ අනුව පහත සඳහන් කටයුතු කිරිමට අප හට සිදු විය.

1.පුහුණු මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීම.

2.මධ්‍යස්ථාන වල පවත්වනු ලබන පාඨමාලා ප්‍රතීතනය කරලීම.

3.NVQ ක්‍රමය පිළිබඳ විදේශ සේවා නියුක්ති කාර්යංශයේ අදාල නිලධාරින් දැනුවත් කිරිම.

4.එම වෘත්තීය සඳහා නිපුනතා පාදක ඇගයීම්කරුවන් සැකසීම.

මෙම මධ්‍යස්ථානවල NVQ ක්‍රමයට අනුව පාඨමාලා පවත්වා ඇගයීම් සිදු කොට සහතික ලබා දීම 2013 වසරේ ජුනි මස සිට ආරම්භ වූ අතර මෙම කටයුතු සංවිධාන කර ගැනීම සඳහා රැස්වීම් සංවිධානය කර සාකච්චා කරන ලදි. එවැනි රැස්වීම් වාර 2 ක් පවත්වන ලදී.

vii. NVQ ඇගයීම් සඳහා ලැබෙන පැමිනිලි විභාග කිරිම.

පසුගිය වසර තුල නිපුනතා පාදක ඇගයීම් කටයුතු සම්බන්ධයෙන් පහත සඳහන් පැමිණිලි වාර්තා වී තිබුනි.

- එන්.අයි. සිරිමාන්න මහතා, ඇගයීම්කරු / බේකරි වෘත්තිය.

  ඇගයීම් කටයුතු කිරිම සඳහා පොරොන්දු වී අදාල දිනයේදී මධ්‍යස්ථානය වෙත එම කටයුතු සඳහා වාර්තා නොකිරිම.
- ඒ.ජේ.එන්.පී. සිරිවර්ධන මිය, ඇගයීම්කරු / රූපලාවන්‍යය ශිල්පය

  අදාල වාර්තා පොත් භාර නොදි තිබීම.
- කේ.ඩී.එච්. මනමේන්ද්‍ර ඇගයීම්ලාභී / දැව කාර්මික (ගෘහ භාණ්ඩ)

  අසමත් වී ඇති ඒකකයන් සඳහා අභියාචනා කිරීම.
- ඩී.එන්.කේ. ගුණවර්ධන හා කේ.ඒ.ඩී.එන්.වීරසිංහ මහත්මීන් ඇගයීම්ලාභිනියන් / ඇඳුම් මැසීම

අසමත් වි ඇති ඒකකයන් සඳහා අභියාචනා කිරීම.

මෙම පැමිණිලි සම්බන්ධව අදාල පාර්ශවයන්ගෙන් කරුනු විමසීමෙන් අනතුරුව අදාල ක්‍රියාමාර්ග ගන්නා ලදී. මීට අමතරව විනය විරෝධී කටයුතු කිරිම සම්බන්ධව ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු කිරීමේ අධිකාරියෙහි සභාපතිතුමා විසින් අදාල එහි නිළධාරියාට හා විදේශ සේවා නියුක්ති කාර්යංශයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී විසින් අදාල එහි නිළධාරියාට විරුද්ධව පැමිණිලි කල අතර ඔවුන්ගේ ඇගයීම් නිළධාරිභාවය එම පරීක්ෂන අවසන් වන තෙක් තාවකාලිකව මේ වන විට අත්හිටුවා ඇත.

viii. ඇගයීම් පිළිබඳ සංගතභාවය ඇති කිරිම සඳහා වූ වැඩ මුළු පැවැත්වීම.

ජාතික වෘත්තීය සුදුසුකම් ප්‍රදානය කිරීම සඳහා කෙරෙන ඇගයීම් කටයුතු සිදුකරනු ලබන්නේ ඇගයීම් සංචිතයේ ඒ ඒ වෘත්තීන් සඳහා ලියාපදිංචි වී ඇති නිපුනතා පාදක ඇගයීම්කරුවන් දෙදෙනෙකු විසිනි.මෙහිදි එම ඇගයීම් කටයුතු සිදු කිරීමේදී සිදුවිය හැකි තමන්ගේ අදහස් අනුව තීරණ ගැනීම (Subjectivity) අවම තත්වයකට පත් කර ගත යුතු වේ.මේ සඳහා භාවිතා කරන උපක්‍රමය වනුයේ අදාල ක්ෂෙත්‍රයෙහි ලියාපදිංචි වී ඇති දිවයින පුරා සිටින සියළුම ඇගයීම්කරුවන් එකට රැස්කොට එම වෘත්තීය කාර්යයන් ඇගයීම් කල යුතු ආකාරය පිළිබඳ පොදු එකගතාවයකට පත් වීමයි. මෙම වැඩමුළු හදුන්වනු ලබන්නේ සංගතභාවය තහවුරු කෙරෙන වැඩ මුළු ලෙසයි.

වැඩ මුළුවෙන් පසු ගන්නා ලද හා එකග වූ සියලුම තීරන එම වෘත්තියෙහි ලියාපදිංචි වී ඇති සියළුම අයදුම්කරුවන් අතරෙහි චක්‍රලේඛනය කරන අතර ඊට පසු ඇගයීම් කටයුතු සිදුවනුයේ එම තීරණවලට අනුකූල වේ.

| **23.1 මහාභාණ්ඩාගාරය වෙත ගෙවීම්** | | | |
| රාජ්‍ය භාග ගෙවීම් | 43,345 | 78,023 | 93,690 |
| ප්‍රාග්ධන ප්‍රදාන ඉතිරිය | | - | 889,659 |
| වැටුප් රහිත අයකරගැනීම් | 12,546 | 9,294 | |
| | **55,891** | **87,317** | **983,349** |
| **23.2 ආදායම් බදු දෙපාර්තුමේන්තුවට ගෙවීම්** | | | |
| රඳවා ගැනීම් බදු | 1,300 | 16,800 | 20,016 |
| මුද්දර බදු | 5,545 | 4,440 | 7,442 |
| වැටුප් මත බදු | | | 1,460 |
| | **6,845** | **21,240** | **28,918** |
| **23.3 ගෙවිය යුතු ව්‍යාපෘති ලැබීම්** | | | |
| ජර්මානු තාක්ෂණ ආයතනය | - | 30 | 30 |
| රුහුණු ආර්ථික සංවර්ධන අධිකාරිය | 48,923 | 48,923 | - |
| ජාත්‍යන්තර කම්කරු සංවිධානය | 3,196,076 | 1,697,301 | 877,751 |
| කෙටිකාලින වැඩසටහන් (විදේශිය) | 520,813 | 474,563 | 155,174 |
| කා.අ.සං.ව්‍යාපෘතිය | 3,492 | 3,492 | 3,492 |
| ජාතික ආධුනිකත්ව ආයතනය සඳහා ලද ප්‍රදාන | 14,550 | 14,550 | |
| යෞවන කටයුතු අමාත්‍යාංශය | 2,536,625 | | |
| | **6,320,479** | **2,238,859** | **1,036,447** |

**23.4 ගෙවිය යුතු පෞද්ගලික පඩිනඩි**

| | | | |
|---|---|---|---|
| අතිකාල සහ නිවාඩු දින දීමනා | | 20,985 | 2,975 |
| පුහුණු දීමනා | | - | 6,800 |
| සේවක භාරකාර අරමුදල | 129,100 | 58,678 | |
| සේවක අර්ථසාධක අරමුදල | 335,881 | 391,118 | |
| වැටුප් හා වේතන | | 19,746 | |
| | **464,981** | **490,527** | **9,775** |

## තෘතීයික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව
## 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශ උප ලේඛන

### උප ලේඛන 01 - පාරිතෝෂික වෙන්කිරීම්

| නම | සේවා අංකය | පත්වීම් දිනය | වසර ගණන | දළ වැටුප | පාරිතෝෂික වෙන්කිරීම් |
|---|---|---|---|---|---|
| ඩබ්ලිව්.පී.එම්.පී.ප්‍රේමචන්ද්‍ර | 2 | 2001.07.15 | 12 | 64,716.00 | 388,296 |
| සුරංග ධම්මික | 4 | 2001.02.01 | 5 | 12,550.00 | 31,375 |
| ඩබ්.පී.එස්.ඒ.කීර්ති | 5 | 2001.02.01 | 12 | 25,500.00 | 153,000 |
| එන්.ඩබ්..ජී.එන්.ජීවන්ත | 6 | 2001.02.01 | 12 | 25,296.00 | 151,776 |
| ඩී.ඩබ්.එන්.ගුණසිරි | 7 | 2001.02.01 | 12 | 22,824.00 | 136,944 |
| එන්.සී.ඒ.කුමාර | 8 | 2001.02.02 | 12 | 23,886.00 | 143,316 |
| කේ.සිරිසේන | 9 | 2001.02.05 | 12 | 23,886.00 | 143,316 |
| ආර්.එන්.පී.සිල්වා | 10 | 2001.03.01 | 12 | 25,500.00 | 153,000 |
| ඩී.බී.ආර්.මංජුලා | 11 | 2001.03.01 | 12 | 25,296.00 | 151,776 |
| වයි.පී.එස්.උදයකාන්ති | 12 | 2001.02.01 | 12 | 29,520.00 | 177,120 |
| එම්.එන්.අසංක රංගන | 15 | 2001.09.03 | 12 | 22,356.00 | 134,136 |
| ජී.කේ.හැගොඩආරච්චි | 20 | 2001.11.01 | 12 | 26,112.00 | 156,672 |
| එම්.එල්.එන්.එස්.එදිරිසූරිය | 22 | 2001.11.02 | 12 | 47,700.00 | 286,200 |
| එච්.බී.ඉන්දික සම්පත් | 24 | 2001.11.16 | 12 | 24,888.00 | 149,328 |
| පී.එස්.අමරසේකර | 25 | 2001.11.15 | 12 | 23,052.00 | 138,312 |
| බී.කේ.එස්.දිනේෂ් | 26 | 2001.11.16 | 12 | 23,052.00 | 138,312 |
| ජී.ජී.අජිත් කුසුම් | 28 | 2001.12.03 | 12 | 46,818.00 | 280,908 |
| පී.කේ.සුනිල් | 29 | 2001.12.18 | 12 | 53,706.00 | 322,236 |
| ඩබ්.එන්.ටී.අනුර වීරකෝන් | 31 | 2002.07.01 | 11 | 47,046.00 | 258,753 |
| පී.සී.පී.ජයතිලක | 32 | 2002.08.01 | 11 | 65,796.00 | 361,878 |
| බී.එච්.එස්.සුරවීර | 39 | 2005.01.03 | 9 | 76,728.00 | 345,276 |
| එස්.විජේසේකර | 40 | 2005.04.20 | 8 | 22,896.00 | 91,584 |
| ඩබ්.වී.පී.සී.ජගත් කුමාර | 41 | 2005.05.16 | 8 | 22,068.00 | 88,272 |
| වජිර පෙරේරා | 43 | 2005.06.15 | 8 | 60,756.00 | 243,024 |
| පී.ඩී.එන්.එම්.පෙරේරා | 44 | 2005.01.13 | 8 | 37,368.00 | 149,472 |
| ටී.සෙන්තුරන් | 46 | 2005.01.04 | 8 | 41,460.00 | 165,840 |
| පී.එම්.සී.පී.ගුණතිලක | 47 | 2005.01.18 | 8 | 37,368.00 | 149,472 |
| ඩබ්.කේ.ඩී.හරිස්චන්ද්‍ර | 48 | 2005.01.03 | 9 | 40,020.00 | 180,090 |
| පී.ඒ.එම්.යූ.ගනේපොළ | 49 | 2005.01.02 | 9 | 38,964.00 | 175,338 |
| යූ.ඒ.පී.ධර්මසේන | 51 | 2005.01.03 | 9 | 27,642.00 | 124,389 |
| එම්.ඩී.චාමලී ද සිල්වා | 56 | 2005.10.06 | 8 | 25,704.00 | 102,816 |

| | | | | | |
|---|---|---|---|---|---|
| ආර්.ජේ.සමරවීර | 57 | 2005.11.21 | 8 | 42,408.00 | 169,632 |
| පී.බන්දුල | 58 | 2006.02.20 | 7 | 22,584.00 | 79,044 |
| ඒ.එස්.අමරසිංහ | 60 | 2006.05.16 | 7 | 49,266.00 | 172,431 |
| ජී.ජී.එස්.කුමාර | 62 | 2006.07.14 | 7 | 22,068.00 | 77,238 |
| එස්.යූ.කේ රූබසිංහ | 65 | 2007.02.02 | 6 | 47,046.00 | 141,138 |
| එම්.විදානපතිරණ | 66 | 2007.02.02 | 6 | 41,460.00 | 124,380 |
| ජේ.ඒ.ඩී.ජේ.ජයලත් | 68 | 2007.08.01 | 6 | 59,436.00 | 178,308 |
| **පහළට ගෙන යන ශේෂය** | | | | | **6,614,398.00** |

තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව

**2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශ උප ලේඛන**

**උප ලේඛන 01 - පාරිතෝෂික වෙන් කිරීම්**

| නම | සේවා අංකය | පත්වීම් දිනය | වසර ගණන | දළ වැටුප | පාරිතෝෂික වෙන්කිරීම් |
|---|---|---|---|---|---|
| ඉදිරියට ගෙන ආ ශේෂය | | | | | **6,614,398** |
| ජී.ජී.ජී.නානායක්කාර | 70 | 2007.10.15 | 6 | 40,740.00 | 122,220 |
| ඩබ්.ඒ.ඩබ්.සී.ප්‍රේමරත්න | 71 | 2007.11.01 | 6 | 47,046.00 | 141,138 |
| ඩබ්.ජේ.එල්.ඒ.දමයන්ති | 72 | 2007.12.12 | 6 | 40,740.00 | 122,220 |
| සද්ධා මංගල | 73 | 2008.02.01 | 5 | 22,584.00 | 56,460 |
| ආර්.ජී.ඒ.ටී.කුමාර | 74 | 2008.11.03 | 5 | 23,610.00 | 59,025 |
| එන්.ඩී.විජේසේකර | 75 | 2008.11.03 | 5 | 23,610.00 | 59,025 |
| එස්.එස්.කල්පගේ | 76 | 2008.11.03 | 5 | 21,636.00 | 54,090 |
| බී.එල්.එම්.මදුසංකා | 77 | 2009.09.01 | 4 | 23,436.00 | 46,872 |
| පී.සී.ජේ.ද සිල්වා | 78 | 2009.09.01 | 4 | 23,262.00 | 46,524 |
| කේ.ටී.අමරසිංහ | 80 | 2009.11.30 | 4 | 23,262.00 | 46,524 |
| ඩී.එම්.එස්.ජේ.සිරිපාල | 81 | 2009.11.30 | 4 | 23,262.00 | 46,524 |
| එම්එස් එම් ටී එන් ඩී සමරකෝන් | 82 | 2011.02.01 | 2 | 38,964.00 | 38,964 |
| වින්දායා හංසිනි | 83 | 2011.04.05 | 2 | 23,088.00 | 23,088 |
| කේ එස් සමීර | 84 | 2011.08.01 | 2 | 22,116.00 | 22,116 |
| ජී සී එස් එම් නානායක්කාර | 85 | 2011.08.01 | 2 | 22,116.00 | 22,116 |
| බී එස් ජේ විපුල්සි | 86 | 2012.01.02 | 2 | 25,578.00 | 25,578 |
| එච් එම් ඒ ඩී කේ හේරත් | 87 | 2012.01.02 | 2 | 25,578.00 | 25,578 |
| එච් එස් අබේගුණතිලක | 89 | 2012.01.02 | 2 | 25,578.00 | 25,578 |
| ඩී එන් අයි ඩී ද සිල්වා | 90 | 2012.01.02 | 2 | 25,578.00 | 25,578 |
| චන්දි මේනකා | 91 | 2012.03.01 | 1 | 22,914.00 | 11,457 |
| ඒ.පී.ඉන්ද්‍රානි | 92 | 2012.03.01 | 1 | 22,916.00 | 11,458 |
| අයි.ජී.කල්ප උදාර | 93 | 2012.07.10 | 1 | 25,320.00 | 12,660 |
| පී.මුතුකුමාරණ | 94 | 2012.11.03 | 1 | 25,578.00 | 12,789 |
| | | | | | **7,671,980** |

## උපලේඛන 02 - උත්සව අත්තිකාරම්

| නම | ශේෂය |
|---|---|
| ඩබ්.පී.එම්.පී.ප්‍රේමචන්ද්‍ර | 1,000 |
| ඩබ්.ඒ.ඩබ්.සී.ප්‍රේමරත්න | 1,000 |
| කේ.සිරිසේන | 1,000 |
| ආර්.එන්.පී.සිල්වා | 1,000 |
| එන්.සී.ඒ.කුමාර | 1,000 |
| වයි.පී.එස්.උදයකාන්ති | 1,000 |
| සී.ඩබ්..එන්.ගුණසිරි | 1,000 |
| එන්.ඩබ්.පී.එන්.ජීවන්ත | 1,000 |
| ඩී.බී.ආර්.මංජුලා | 1,000 |
| ජී.කේ.සුනිල් | 1,000 |
| පහළට ගෙන යන ශේෂය | 10,000 |

### තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව
### 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශ උප ලේඛන

| | |
|---|---|
| ඉදිරියට ගෙන ගිය ශේෂය | 10,000 |
| ඩී.ඩබ්.සුරංග | 300 |
| එන්.ඩී.විජේසේකර | 1,000 |
| බී.කේ.එස්.දිනේෂ් | 1,000 |
| පී.එස්.අමරසේකර | 1,000 |
| බී.එච්.එස්.සුරවීර | 1,000 |
| අසංක රංගන | 1,000 |
| අනුර වීරකෝන් | 1,000 |
| ටී.සෙන්තුරන් | 1,000 |
| යූ.ඒ.පී.ධර්මසේන | 1,000 |
| එම්.බී.චාමලී ද සිල්වා | 1,000 |
| ජී.ජී.අජිත් කුසුම් | 1,000 |
| එස්.වි◌ේජ්සේකර | 1,000 |
| ඩබ්.බී.පී.සී.ජගත් කුමාර | 1,000 |
| ඩබ්.කේ.ඩී.හරිස්චන්ද්‍ර | 1,000 |
| එම්.විදානපතිරණ | 1,000 |
| ජී.ජී.එස්.කුමාර | 1,000 |
| ඒ.එස්.අමරසිංහ | 1,000 |
| එස්.යූ.කේ.රූබසිංහ | 1,000 |
| එස්.එස්.කල්පගේ | 1,000 |
| ආර්.පී.ඒ.ටී.කුමාර | 1,000 |

| | | |
|---|---|---|
| පී.පී.පී.නානායක්කාර | ……………………………………………………………………………… | 1,000 |
| එස්.ජේ.සිරිපාල | ……………………………………………………………………………… | 1,000 |
| නෙලුම් සමරකෝන් | ……………………………………………………………………………… | 1,000 |
| පී.ඒ.එම්.යූ.ගනේපොළ | ……………………………………………………………………………… | 1,000 |
| බී.එල්.එම්.මදුසංකා | ……………………………………………………………………………… | 1,000 |
| සුමින්ද අරුණ කීර්ති | ……………………………………………………………………………… | 1,000 |
| පී.බී.එන්.එම්.පෙරේරා | ……………………………………………………………………………… | 1,000 |
| කේ.ටී.අමරසිංහ | ……………………………………………………………………………… | 1,000 |
| වින්දායා හංසිනි | ……………………………………………………………………………… | 1,000 |
| කේ එස් සමීර | ……………………………………………………………………………… | 1,000 |
| බී එස් ජේ විපුල්සි | ……………………………………………………………………………… | 1,000 |
| එච් එම් ඒ ඩී කේ හේරත් | ……………………………………………………………………………… | 1,000 |
| එච්.බී.ඉන්දික සම්පත් | ……………………………………………………………………………… | 1,000 |
| වජිර පෙරේරා | ……………………………………………………………………………… | 1,000 |
| යූ පී සී මේනකා | ……………………………………………………………………………… | 1,000 |
| ජේ.ඒ.ඩී.ජේ.ජයලත් | ……………………………………………………………………………… | 1,000 |
| ඩී එන් අයි ඩී ද සිල්වා | ……………………………………………………………………………… | 1,000 |
| එම්.එල්.එන්.එස්.එදිරිසූරිය | ……………………………………………………………………………… | 1,000 |
| පී.එම්.සී.පී.ගුණතිලක | ……………………………………………………………………………… | 1,000 |
| ඒ.පී.තාරක | ……………………………………………………………………………… | 2,000 |
| අයි.ජී.කල්ප උදාර | ……………………………………………………………………………… | 1,000 |
| පී.සී.ජේ.ද සිල්වා | ……………………………………………………………………………… | 1,000 |
| ජී සී එස් එම් නානායක්කාර | ……………………………………………………………………………… | 1,000 |
| ඒ.පී.ඉන්ද්‍රානි | ……………………………………………………………………………… | 1,000 |
| ඒන් බන්ඩාර | ……………………………………………………………………………… | 1,000 |
| සද්ධා මංගල | ……………………………………………………………………………… | 1,000 |
| | | **56,300** |

## උප ලේඛන 03 කාර්ය මණ්ඩලයට දුන් ණය

| නම | ශේෂය |
|---|---|
| බී.කේ.එස්.දිනේෂ් | 37,476 |
| ඩී.ඩබ්.එන්.ගුණසිරි | 18,044 |
| සුරංග ධම්මික | 19,445 |
| පී.ඒ.එම්.යූ.ගනේපොළ | 37,476 |
| එච්.බී.ඉන්දික සම්පත් | 33,312 |
| කේ.එම්.පී.එස් කේ.ඩයස් | 20,820 |
| කේ.සිරිසේන | 36,488 |
| එන්.ඩබ්.ජී.එන්.ජීවන්ත | 2,776 |
| පී.බන්දුල | 47,192 |
| පී.පී.එස්.කුමාර | 30,536 |
| පී.එස්.අමරසේකර | 41,640 |
| ආර්.එන්.පී.සිල්වා | 27,760 |
| ආර්.සෝමසිංහ | 147 |
| එස්.එස්.කල්පගේ | 24,984 |
| ඩබ්.පී.එස්.ඒ.කීර්ති | 34,700 |
| ඩබ්.පී.එම්.පී.ප්‍රේමචන්ද්‍ර | 30,536 |
| වයි.පී.එස්.උදයකාන්ති | 23,596 |
| එස්.විජේසේකර | 29,148 |
| ඩී.බී.ආර්.මංජුලා | 27,760 |
| ඩබ්.වී.ජී.සී.ජගත් කුමාර | 47,192 |
| ඒ.එස්.අමරසිංහ | 49,968 |
| ඩබ්.ජේ.එල්.ඒ.දමයන්ති | 47,192 |
| එම්.විදානපතිරණ | 33,312 |
| බී.එච්.එස්.සුරවිර | 2,801 |
| පී.ඩී.එන්.එම්.පෙරේරා | 12,492 |
| එම්.ඩී.චාමලී ද සිල්වා | 12,492 |
| එන්.සී.ඒ.කුමාර | 15,268 |
| අසංක රංගන | 31,924 |
| ජී.කේ.හෑගොඩආරච්චි | 9,913 |
| යූ.ඒ.ජී.ධර්මසේන | 18,900 |
| බී.එල්.එම්.මදූසංකා | 12,484 |
| පී.පී.පී නානායක්කාර | 18,044 |
| එන්.ඩී.විජේසේකර | 48,580 |
| ආර්.පී.ඒ.ටී.කුමාර | 1,388 |

| | | |
|---|---|---|
| සද්ධා මංගල | ………………………………………………………………………. | 19,432 |
| එස්.යූ.කේ.රූබසිංහ | ………………………………………………………………………. | 38,864 |
| ඩී.එම්.එස්.ජේ.සිරිපාල | ………………………………………………………………………. | 23,596 |
| කේ.ටී.අමරසිංහ | ………………………………………………………………………. | 40,252 |
| බී එස් ජේ විපුල්සි | ………………………………………………………………………. | 43,028 |
| එච් එම් ඒ ඩී කේ හේරත් | ………………………………………………………………………. | 45,804 |
| එම්.එල්.එන්.එස්.එදිරිසූරිය | ………………………………………………………………………. | 45,804 |
| ජී.ජී.අජිත් කුසුම් | ………………………………………………………………………. | 23,596 |
| පී.සී.ජේ.ද සිල්වා | ………………………………………………………………………. | 43,028 |
| ආර්.ජේ.සමරවීර | ………………………………………………………………………. | 37,476 |
| අනුර වීරකෝන් | ………………………………………………………………………. | 36,088 |
| | | **1,282,754** |

**උපලේඛන 04- සුනාමි ණය**

| | | **ශේෂය** |
|---|---|---|
| සුරංග ධම්මික | ………………………………………………………………………. | 39,000.00 |
| | | **39,000.00** |

## තෘතීයික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව
## 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශ උප ලේඛන

### උප ලේඛන 05 - ආපදා ණය

| නම | ශේෂය |
|---|---|
| ජී.ජී.අජිත් කුසුම් | 233,354 |
| බී.කේ.එස් දිනේෂ් | 116,535 |
| අසංක රංගන | 101,896 |
| පී.ඒ.එම්.යූ ගනේපොල | 179,138 |
| එච්.බී ඉන්දික සම්පත් | 102,828 |
| කේ.එම්.පී.එස්.කේ ඩයස් | 77,102 |
| කේ.සිරිසේන | 137,257 |
| එන්.ඩබ්.පී.එන් ජීවන්ත | 16,442 |
| පී.බන්දුල | 106,560 |
| පී.එස් අමරසේකර | 6,495 |
| ආර්.එන්.පී සිල්වා | 113,584 |
| එන්.සී.ඒ කුමාර | 111,672 |
| යූ.පී පාලිත | 70,702 |
| ඩබ්.පී.එම්.පී.ප්‍රේමචන්ද්‍ර | 241,628 |
| එස්.යූ.කේ රූබසිංහ | 191,636 |
| ආර්.පී.ඒ.ටී.කුමාර | 97,188 |
| හයි.පී.එස්.උදයකාන්ති | 184,724 |
| බී.එච්.එස්.සුරවීර | 131,422 |
| එස්.විජේසේකර | 103,178 |
| බර්නාඩ්.ඩබ්ලිව්.කේ | 52,536 |
| එම්.ඩී.චාමලීද සිල්වා | 132,300 |
| ඩබ්.වී.පී.සී.ජගත් කුමාර | 99,546 |
| ඒ.එස්.අමරසිංහ | 241,628 |
| පී.පී.පී.නානායක්කාර | 174,972 |
| එම්.විදානපතිරණ | 179,357 |
| ජී.ජී.අආනන්ද | 1,297 |
| ජී.ඩී.එන්.එම්.පෙරේරා | 143,640 |
| සද්ධා මංගල | 4,198 |
| ආර්.ජේ.සමරවීර | 208,300 |
| ඩබ්.එම්.ටී.අනුර වීරකෝන් | 87,486 |
| ටී.සෙන්තුරන් | 70,822 |
| ජේ.ඒ.ඩී.ජේ.ජයලත් | 95,818 |
| ඩබ්.පී.එස්.ඒ.කීර්ති | 81,939 |
| ඩී.බී.ආර්.මංජුලා | 79,456 |
| ජී.කේ.හැගොඩආරච්චි | 29,813 |
| වජිර පෙරේරා | 104,150 |
| පී.පී.එස්.කුමාර | 130,684 |
| ඩබ්.ජේ.එල්.ඒ.දමයන්ති | 112,482 |
| එන්.ඩී.විජේසේකර | 85,618 |
| යූ.ඒ.පී.ධර්මසේන | 115,440 |
| එස්.එස්.කල්පගේ | 72,722 |
| එම්.එල්.එන්.එස්.එදිරිසූරිය | 137,478 |
| කේ.ටී.අමරසිංහ | 120,328 |
| සී.ඩබ්..එන්.ගුණසිරි | 103,193 |
| පී.සී.පී.ජයතිලක | 229,130 |
| ඩී.එම්.එස්.ජේ.සිරිපාල | 122,642 |
| | **5,340,316.00** |

තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව
මූල්‍ය තොරතුරු උපුටා දැක්වීම - 2013


| වැය විෂය | ඇස්තමේන්තුව | සංශෝධිත ඇස්තමේන්තුව | සත්‍ය වියදම | රු.000 වියදම රු.1/- ඇස්තමේන්තු % |
|---|---|---|---|---|
| **ප්‍රාග්ධන වියදම්** | | | | |
| **ස්ථාවර වත්කම් අත්පත් කරගැනීම්** | | | | |
| ලිබඩු හා කාර්යාල උපකරණ | 240 | 500 | 511 | **102** |
| පිරියත හා උපකරණ | 240 | 1,578 | 1,101 | **70** |
| පුස්තකාල පොත් | 40 | 40 | 42 | **105** |
| | **520** | **2,118** | **1,654** | |
| **පුනරුත්තාපන හා වැඩිදියුණු කිරිම්** | | | | |
| ගොඩනැගිලි | 80 | 670 | 334 | **50** |
| පිරියත හා උපකරණ | 100 | 100 | 13 | **13** |
| වාහන | | 600 | 571 | **95** |
| | **180** | **1,370** | **918** | |
| **ප්‍රාග්ධන වියදම්(සංවර්ධන)** | | | | |
| වෘත්තිය අධ්‍යාපන පුහුණු සැලසුම් ක්‍රියාත්මක කිරිම | 900 | 888 | 1,572 | **177** |
| ජාතික වෘත්තිය සුදුසුකම් | 2,250 | 1,649 | 1,656 | **100** |
| පුද්ගලික ආයතන සඳහා මූල්‍ය ප්‍රදාන | 3,500 | 2,706 | 2,702 | **100** |
| පර්යේෂණ පැවැත්විම | 1,000 | 1,294 | 1,185 | **92** |
| පීඩාවට පත්වූවන් සඳහා මූල්‍ය ප්‍රදාන | 750 | 580 | | **-** |
| පලාත් වෘත්තිය අධ්‍යාපන පුහුණු සැලසුම් සංවර්ධනය | 4,000 | 2,900 | 2,813 | **97** |
| මෘදුකාංග | 650 | 1,005 | 999 | **99** |
| දැයට කිරුළ | 300 | | | |
| GIS මෘදුකාංගය | 300 | 45 | | |
| දෘඩාංග | 650 | 445 | 216 | **49** |
| | 14,300 | 11,512 | 11,143 | |
| **මුලු ප්‍රාග්ධන වියදම්** | **15,000** | **15,000** | **13,715** | **91** |
| **පුනරාවර්ථන වියදම්** | | | | |
| **පෞද්ගලික පඩි නඩි** | | | | |
| වැටුප් හා වේතන | 24,000 | 26,308 | 26,489 | **101** |
| සභාපති දීමනා | 600 | 600 | 600 | **100** |
| පුහුණු දීමනා | 1,000 | 1,088 | 1,159 | **107** |
| අතිකාල හා නිවාඩු දින දීමනා | 750 | 985 | 888 | **90** |


| | | | | |
|---|---|---|---|---|
| සේවක අර්ථ සාධක අරමුදල | 2,880 | 3,277 | 3,019 | **92** |
| සේවක භාර කාර අරමුදල | 720 | 814 | 755 | **93** |
| පාරිතෝෂික දීමනා | | 231 | 503 | **218** |
| | **29,950** | **33,303** | **33,413** | **100** |
| **ගමන් වියදම්** | | | | |
| දේශීය | 350 | 390 | 320 | **82** |
| විදේශීය | 400 | 450 | 419 | **93** |
| | 750 | 840 | 739 | **88** |
| **සැපයුම් හා පරිභෝජන** | | | | |
| ලිපි ද්‍රව්‍ය මුද්‍රණ හා දැන්වීම් | 2,300 | 2,928 | 2,988 | **102** |
| ඉන්ධන - ලිහිසි තෙල් | 2,300 | 2,715 | 2,933 | **108** |
| ප්‍රවාහන වියදම් | 17 | 10 | 3 | **30** |
| නිළ ඇඳුම් | 125 | 80 | 80 | **100** |
| පුවත්පත් | 80 | 93 | 93 | **100** |
| වෙනත් සේවා ගාස්තු | 150 | 225 | 226 | **100** |
| සංග්‍රහ වියදම් | 150 | 189 | 189 | **100** |
| ඡායා පිටපත් දීමනා | 10 | 13 | 13 | **100** |
| | **5,132** | **6,253** | **6,525** | |
| **නඩත්තු වියදම්** | | | | |
| වාහන නඩත්තු වියදම් | 1,350 | 2,335 | 2,330 | **100** |
| යන්ත්‍ර සූත්‍ර නඩත්තු වියදම් | 125 | 225 | 233 | **104** |
| ගොඩනැගිලි නඩත්තු වියදම් | 70 | 110 | 118 | **107** |
| පරිගණක සේවා | 250 | 200 | 173 | **87** |
| යාන්ත්‍රික - විදුලි උපකරණ | 20 | 100 | 65 | **65** |
| පොදු නඩත්තු වියදම් | 50 | 125 | 126 | **101** |
| | **1,865** | **3,095** | **3,045** | **98** |
| **ගිවිසුම් ගත සේවා** | | | | |
| දුරකථන ගාස්තු | 1,400 | 1,570 | 1,569 | **100** |
| තැපැල් වියදම් | 150 | 122 | 131 | **107** |
| විදුලි ගාස්තු | 2,850 | 3,000 | 2,728 | **91** |
| ජල ගාස්තු | 150 | 230 | 154 | **67** |
| වරිපනම් සහ කාර්යාල කුලී | 150 | 128 | 127 | **99** |

| | | | | |
|---|---|---|---|---|
| ආරක්ෂක සේවා | 643 | 819 | 819 | **100** |
| පවිත්‍රතා සේවා | 575 | 750 | 750 | **100** |
| විගණන ගාස්තු | 75 | 225 | 225 | **100** |
| නීති හා මුද්දර ගාස්තු | 50 | 40 | 45 | **113** |
| වාර සගරා සාමාජික ගාස්තු | 30 | 30 | 27 | **90** |
| සාමාජික ගාස්තු - ෙද්ශය හා විදේශිය | 70 | 70 | 52 | **74** |
| කාර්යය මණ්ඩල පුහුණුව හා සංවර්ධන | 350 | 350 | 183 | **52** |
| මාර්ගස්ථ මුදල් රක්ෂණ වාරික | 15 | 14 | 14 | **100** |
| සේවා ගිවිසුම් | 300 | 760 | 766 | **101** |
| | **6,808** | **8,108** | **7,590** | **94** |


| **වැය විෂය** | **ඇස්තමේන්තුව** | **සංශෝධිත ඇස්තමේන්තුව** | **සත්‍ය වියදම** | **රු.000 වියදම රු.1/- ඇස්තමේන්තු %** |
|---|---|---|---|---|
| **මෙහෙයුම් වියදම්** | | | | |
| ඇගයීම් හා ලියාපදිංචිය | 800 | 1,000 | 666 | **67** |
| ප්‍රතීතන වැඩසටහන් | 1,750 | 1,750 | 1,686 | **96** |
| ජාතික වෘත්තිය සුදුසුකම් වැඩසටහන් | 2,900 | 1,702 | 1,321 | **78** |
| වෘත්තීය අධ්‍යාපන පුහුණු සැලසුම් ක්‍රියාත්මක කිරීම | 1,700 | 1,470 | 1,470 | **100** |
| ශ්‍රම වෙළඳ පොළ ප්‍රකාශය පිළියෙළ කිරිම | 2,500 | 1,884 | 1,652 | **88** |
| තත්ව කළමණාකරණ පද්ධති | 250 | 30 | 5 | **17** |
| මූල්‍ය ප්‍රදාන නැවත ඇගයීම | 90 | 228 | 238 | **104** |
| පලාත් වෘත්තිය අධ්‍යාපන පුහුණු සැලසුම් සම්බන්ධීකරණය | 75 | | | |
| ප්‍රතිපත්ති ලියවිලි සකස්කිරීම | 80 | | | |
| දැයට කිරුළ | 500 | 704 | 704 | |
| භාෂා පරිවර්ථන ගාස්තු | 60 | 78 | 78 | **100** |
| පාලක මණ්ඩල සහ කළමණාකරන කමිටු දිමනා | 675 | 512 | 489 | **96** |
| | 11,380 | 9,358 | 8,309 | **89** |
| **මුලු පුනරාවර්ථන වියදම්** | **55,885** | **60,957** | **59,621** | **98** |

| මූල්‍ය තොරතුරු උපුටා දැක්වීම | | | | |
|---|---|---|---|---|
| **පුනරාවර්ථන වියදම්** | | | **ප්‍රාග්ධන වියදම්** | |
| පෞද්ගලික පඩි නඩි | 32,910,021 | | යන්ත්‍ර හා උපකරණ මිලදී ගැනීම | 2,869,579 |
| පාරිතෝෂික ගෙවීම් | 502,685 | | පලාත් වෘත්තිය අධ්‍යාපන පුහුණු සැලසුම් සංවර්ධනය | 3,997,981 |
| ගමන් වියදම් | 738,843 | | පුනරුත්තාපන වියදම් | 919,215 |
| සැපයුම් සහ පාරිභෝජන ද්‍රව්‍ය | 6,526,279 | | රාජ්‍ය හා පෞද්ගලික මූල්‍ය ප්‍රදාන පර්යේෂණ සහ ජාතික වෘත්තිය සුදුසුකම්වියදම | 5,928,741 |
| නඩත්තු වියදම් | 3,044,833 | | | |
| ගිවිසුම් ගත සේවා | 7,591,039 | | | |
| පාලක මණ්ඩල සහ කළමණාකරන කමිටු දීමනා | 489,068 | | | |
| මෙහෙයුම් වියදම් | 7,818,613 | | | |
| **එකතුව (රු.)** | **59,621,381** | | **එකතුව (රු.)** | **13,715,516** |
| | | | | |








| මූල්‍ය තොරතුරු උපුටා දැක්වීම | | | | | |
|---|---|---|---|---|---|
| රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන සඳහා මූල්‍ය ප්‍රදාන | | | | | |
| | **2009** | **2010** | **2011** | **2012** | **2013** |
| රාජ්‍ය ආයතන සඳහා මූල්‍ය ප්‍රදාන (ප්‍රාග්ධන) | 5,565,474 | 6,938,571 | 16,988,909 | 1,446,652 | 2,252,249 |
| පෞද්ගලික ආයතන සඳහා මූල්‍ය ප්‍රදාන (ප්‍රාග්ධන) | 1,647,699 | 806,144 | 4,886,224 | 2,196,298 | 2,701,650 |
| පීඩාවට පත් අය සඳහා මූල්‍ය ප්‍රදාන | | 858,164 | 1,990,345 | 798,515 | 661,995 |
| **එකතුව** | **7,213,173** | **8,602,879** | **23,865,478** | **4,441,465** | **5,615,894** |



| අයවැය ඇස්තමේන්තු සහ මහා භාණ්ඩාගාර ප්‍රදාන | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2010 | | 2011 | | 2012 | | 2013 | |
| | ඇස්තමේන්තු | සත්‍ය | ඇස්තමේන්තු | සත්‍ය | ඇස්තමේන්තු | සත්‍ය | ඇස්තමේන්තු | සත්‍ය |
| පුනරාවර්ථන ප්‍රදාන | 42,200,000 | 38,523,832 | 47,370,000 | 46,571,924 | 55,073,712 | 54,761,014 | 60,957,000 | 59,621,381 |
| ප්‍රාග්ධන ප්‍රදාන | 18,000,000 | 12,978,832 | 33,000,000 | 31,292,303 | 12,239,500 | 10,819,565 | 15,000,000 | 13,715,516 |
| මූල්‍ය ප්‍රදාන ආපසු ලැබීම් | | 6,865 | | 253,465 | | 224,617 | | 401,908 |
| **එකතුව** | **60,200,000** | **51,509,529** | **80,370,000** | **78,117,692** | **67,313,212** | **65,805,196** | **75,957,000** | **73,738,805** |
| | | | | | | | | |



මගේ අංකය / எனது இல. / My No. } ජේපී/ඊ/ටීවීඊසී/1/13/225

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2015 පෙබරවාරි 9 දින

අධ්‍යක්ෂ ජනරාල්,

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව

**තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1999 අංක 50 දරන තෘතියික හා වෘත්තීය අධ්‍යාපන (සංශෝධන පනතේ) 10(ඇ)(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත 2014 අගෝස්තු 15 දින නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පාරිතෝෂික වියදම් ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් රු.142,883 ක් වැඩියෙන් වෙන් කිරීම සිදු කර තිබුණි.

#### 2.2.2 පැහැදිලි නොකළ වෙනස්කම්

පරිගණක හා උපාංග ලෙජර් ගිණුමේ ශේෂය රු.15,309,664 ක් වුවද අවසන් ගිණුම්වල රු.15,359,464 ක් ලෙස දැක්වීම නිසා රු.49,800 ක වෙනසක් නිරීක්ෂණය විය.

## 2.3 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා නිරීක්ෂණය විය.

| නීති,රීති, රෙගුලාසි වලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වන වගන්තිය හා 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/ 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.2 වගන්තිය | මුදල් ඇමතිවරයාගේ අනුමැතිය ලබාගැනීමෙන් තොරව රු.3,448,406 ක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. |
| (ආ) | 1994 අගෝස්තු 3 දිනැති අංක 26/92 (1) හා 2002 පෙබරවාරි 25 දිනැති අංක 01/2002 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | වෙන්කල වාහන හැර ඉතිරි සියලුම වාහනවල රාජ්‍ය ලාංඡනය සහ ආයතනයේ නම පින්තාරු කළ යුතු වුවත් ඊට අනුකූලව කටයුතු නොකළ අවස්ථා නිරීක්ෂණය විය. |

## 2.4 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.5(අ) වගන්තිය ප්‍රකාරව "සී" ශ්‍රේණියේ සංස්ථාවක නිල වාහන වෙන්කළ හැක්කේ සභාපති, ප්‍රධාන විධායක නිලධාරී හා විධායක අධ්‍යක්ෂකවරයන් සඳහා පමණි. එම විධිවිධානවලට පටහැනිව සභාවේ නියෝජ්‍ය අධ්‍යක්ෂක ජනරාල්වරයාට සහ අධ්‍යක්ෂකවරුන් 05 දෙනෙකුට අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතියෙන් පමණක් වෙන්කල වාහන ලබාදී සමාලෝචිත වර්ෂයේදි රු.1,241,100 ක ඉන්ධන දීමනාවක් ගෙවා තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කොමිෂන් සභාවේ මෙහෙයුම් කටයුතු වලින් රු.3,229,145 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.1,495,496 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.4,724,641 ක පිරිහීමක් පෙන්නුම් කෙරිණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

සමාලෝචිත වර්ෂය සඳහා වූ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්ක කර තිබූ පහත කාර්යයන් ඉටු කර ගැනීමට නොහැකි වී තිබුණි.

(අ) තෘතියික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ප්‍රතිපත්තීන්, උපක්‍රමයන් ක්‍රමවත්ව සැකසීම විමර්ශනය කිරීම හා යාවත්කාලීන කිරීම සඳහා අංශ 04 ක් යටතේ වැඩසටහන් 44 ක් කිරීමට සැලසුම් කර තිබුණු අතර තථ්‍ය වශයෙන් සිදුකළ ප්‍රමාණය 32 ක් විය. ඒ අනුව ඉලක්කයට ලඟා නොවූ වැඩසටහන් ප්‍රමාණය 12 ක් විය.

(ආ) කර්මාන්ත අංශය සංවර්ධනය කිරීම සඳහා ප්‍රවාහන අංශයේ වෘත්තීය අධ්‍යාපනය හා පුහුණු සැලසුමක් සකස් කිරීමට සැලසුම් කර තිබුණු නමුත් එය සම්පූර්ණ කර නොතිබුණි.

(ඇ) පළාත් වෘත්තීය අධ්‍යාපනය සංවර්ධනය කිරීමට වැඩමුළු 02 ක් පැවැත්වීමට සැලසුම් කර තිබුණද එය සිදුකර නොතිබුණි.

(ඈ) ජාතික වෘත්තීය සුදුසුකම් පද්ධතිය ව්‍යාප්ත කිරීම හා පවත්වා ගෙන යාම සඳහා අංශ 05 ක් යටතේ වැඩසටහන් 748 ක් කිරීමට සැලසුම් කර තිබුණ ද සත්‍ය වශයෙන් සිදු කර තිබුණේ 156 ක් පමණි. වැඩසටහන් 592 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

4.2 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

---------------------------

පහත දැක්වෙන නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රාජ්‍ය අංශය, පෞද්ගලික අංශය හා ආපදාවන්ට ලක්වූවන්ට උපකරණ මිලදී ගැනිම සඳහා සමාලෝචිත වර්ෂයේදී ලබාදී තිබූ රු.12,467,374 ක මූල්‍යාධාර ලබාදුන් අවස්ථාවේදීම වියදමක් ලෙස ගිණුම්ගතකර ඇතත් සත්‍ය වශයෙන්ම වැයකර තිබුණේද යන්න තහවුරු කරගෙන නොතිබුණි.

(ආ) තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පනත ප්‍රකාරව කොමිෂන් සභාව කටයුතු නොකළ අවස්ථා පහත දැක්වේ.

(i) තෘතියික හා වෘත්තීය අධ්‍යාපන ආයතන කොමිෂන් සභාවේ ලියාපදිංචි වියයුතු වුවත්, එසේ ලියාපදිංචි විය යුතු ආයතන හඳුනාගෙන ලියාපදිංචි කර ගැනීම සඳහා සභාව සතුව ප්‍රමාණවත්වූ වැඩ පිළිවෙලක් නොමැති වීම.

(ii) ලියාපදිංචි කාලය අවසන් වූ ආයතනවල ලියාපදිංචිය නැවත අලුත් කිරීම සඳහා කටයුතු නොකිරීම.

(iii) තෘතියික හා වෘත්තීය අධ්‍යාපන ආයතන පිළිබඳව අධීක්ෂණය නොකිරීම හා ලියාපදිංචි නොවූ ආයතන 44 ක් පිළිබඳව පනතේ විධිවිධාන අනුව කටයුතු නොකිරීම.

(ඇ) ජාතික නිපුණතා ප්‍රමිති (NCS) සකස් කිරීමට අමාත්‍යාංශයෙන් ලබාදී තිබූ ප්‍රතිපාදන යටතේ තේ නිෂ්පාදන තාක්ෂණය සහ විලේපන වේදය (Cosmetology)) යන පාඨමාලා සඳහා ජාතික නිපුණතා ප්‍රමිති, 2013 මැයි 30 දිනට ප්‍රථම සකස් කර ඉදිරිපත් කළ යුතු වුවත් මාස 2 කට වඩා ප්‍රමාද වී ඉදිරිපත් කර තිබුණි. මේ සඳහා රු.487,073 ක් වැය කර වැඩමුළු 26 ක් පවත්වා තිබුණු අතර මෙම කාර්යය මාස 03 කින් අවසන් කිරීමට සැලසුම් කර තිබුණද මාස 08 ක් ගතවී තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය සඳහා පර්යේෂණ කටයුතු සඳහා වැයකළ රු.1,184,760 ක් සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2012 වර්ෂයේ ආරම්භ කරන ලද පර්යේෂණ 09 ක් සමාලෝචිත වර්ෂයේ නිමකර තිබුණු අතර එක් පර්යේෂණයක් අත්හැර දමා තිබුණි. පර්යේෂණ යෝජනා ඉදිරිපත් කිරීමේදී ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමේ හැකියාව පිළිබඳව අධ්‍යනය කර නොතිබුණි.

(ii) කොමිෂන් සභාවේ නිලධාරීන් 05 කු පර්යේෂණ කිරීමට එකග වී තිබුණද ඔවුන් සමග ගිවිසුමකට එළඹ නොතිබුණි.

(iii) පර්යේෂණ සඳහා ඒ පිළිබඳව නිපුණත්වයක් ඇති විශේෂඥයන් මගින් සිදුකළ යුතු වුවත්, පර්යේෂණ කටයුතුවලට සහභාගී කර ගෙන තිබුණේ අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල කාර්ය මණ්ඩලය පමණි.

(ඉ) අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද නිපුණතා තරඟාවලියේ සංවිධාන කටයුතු කොමිෂන් සභාව විසින් සිදුකර තිබුණු අතර ඒ සඳහා රු.4,127,802 ක්වූ වියදම් දරා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) තරඟාවලියේ කටයුතු සඳහා එක් ආයතනයකට රුපියල් මිලියනය බැගින් ආයතන හතරක් වෙත අත්තිකාරම් මුදල් ලබාදී තිබුණද, අත්තිකාරම් ලබාදීමේ කොන්දේසි අනුව එකී ආයතන කටයුතු කර නොතිබුණි.

(ii) එක් ආයතනයක් වෙත ලබාදුන් අත්තිකාරම් මුදල 2014 නොවැම්බර් 30 දින වන විටත් පියවීමට කටයුතු කර නොතිබුණි.

(iii) ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියට ලබාදුන් මුදලින් රු.275,574 ක ඉතිරි මුදල කොමිෂන් සභාවට නැවත ලබාදී නොතිබුණි.

(iv) උපකරණ හා පුහුණු ද්‍රව්‍ය මිලදී ගැනීම් අධීක්ෂණයට කොමිෂන් සභාවේ නිලධාරීන් පත්කර තිබුණද, අධීක්ෂණයන් සිදු කළ බවට තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි.

## 4.3 නිෂ්කාර්ය වත්කම්

බැංකු ජංගම ගිණුමක රු.2,000,000 කට ආසන්න ශේෂයක් වර්ෂය පුරා පැවති අතර එම ශේෂය සමහර අවස්ථාවල රු.5,000,000 දක්වා ඉහළයාමෙන් මූල්‍යය කළමනාකරණයේ දුර්වලතා පෙන්නුම් කෙරුණි.

4.4 කාර්යය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා සභාවේ අනුමත කාර්යය මණ්ඩලය 85 ක් වුවද තථ්‍ය සේවක සංඛ්‍යාව 70 ක් වුයෙන් පුරප්පාඩු සංඛ්‍යාව 16 ක් සහ අතිරික්ත සංඛ්‍යාව 1 ක් විය.

(ආ) 2012 වර්ෂයේ විභාග ඇගයීම් ඒකකයක් ස්ථාපිත කිරීම සඳහා කාර්යය මණ්ඩලයට 05 දෙනෙකු බඳවා ගැනීමට අනුමත කර තිබුණද ඔවුන් බඳවාගෙන එම අංශය ස්ථාපිත කර නොතිබුණි.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

5.1 සංයුක්ත සැලැස්ම

සංයුක්ත සැලැස්මේ සඳහන් ඉලක්කයන් ලඟා කර ගැනීම සඳහා එක් එක් අංශ අතර උප ඉලක්කයන් නියමිතව දක්වා නොතිබුණු අතර දක්වා ඇති උපාය මාර්ග සම්පූර්ණ කළ යුතු කාල පරිච්ඡේදය සහ ඒ සඳහා වූ වියදම් හා ආදායම් දක්වා නොතිබුණි.

5.2 අයවැය ලේඛන පාලනය

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනය සංශෝධනය කර තිබුණු අතර, එකී සංශෝධිත අයවැය ලේඛනයේ ඇතුළත් සංඛ්‍යාවන් සහ තථ්‍ය සංඛ්‍යාවන් අතර, විචලනය සියයට 5 සිට සියයට 117 ක පරාසයක වූයෙන් අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය පාලන කාරකයක් වශයෙන් උපයෝගී කර ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

(අ) ගිණුම්කරණය
(ආ) මූල්‍ය කළමණාකරණය
(ඇ) අයවැය පාලනය
(ඈ) සේවක මණ්ඩල කලමනාකරණය

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)

විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
බත්තරමුල්ල.

**<u>තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාවේ පැහැදිලි කිරීම් හා පිළිතුරු</u>**

ඔබගේ අංක JP/E/TVEC/1/13/225 හා 2014.08.28 දිනැති උක්ත මාතෘකාව සම්බන්ධයෙන් මා වෙත ලැබී ඇති විගණන විමසුම් සඳහා පැහැදිලි කිරීම් හා පිළිතුරු මේ සමඟ ඉදිරිපත් කරන අතර මෙම පිළිතුරු සලකා බලා අවසාන වාර්තාව නිකුත් කරන ලෙස කාරුණිකව ඉල්ලමි.

2.2.1 **ගිණුම් කරණ අඩුපාඩු**

ගණනය කිරීම් නිවැරදියි.

2.2.2 **පැහැදිලි නොකළ වෙනස්කම්**

මෙයට අදාල ජර්නල් සටහන් නිකුත් කිරීමට පියවර ගනිමි.

**<u>2.3 නීති,රීති රෙගුලාසි හා කළමණාකරන තිරණවලට අනුකූල නොවීම.</u>**

(අ) 2012.08.14 වන දින Cope කමිටුවෙන් මෙන්ම 2014.03.07 වන දින පවත්වනු ලැබූ Cope රැස්වීමෙන් ද පෙන්වා දුන් පරිදි කෙටිකාලීනව ව්‍යාපෘති සඳහා ලැබෙන මුදල් නිශ්ක්‍රීයව පැවතීම වැළැක්වීම සඳහා කෙටිකාලීන ස්ථාවර තැන්පතුවල මුදල් යොදවා ඇත.
කෙසේ වෙතත් ඔබගේ නිරීක්ෂණය අනුව භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමි.

(ආ)වෙන්කල වාහන හැර අනෙකුත් සියළුම වාහන වල ජනරජ ලාංඡන සහ ආයතන ලාංඡන සමඟආයතනයේ නාම භාෂා තුනෙන්ම ඇතුළත් කර ඇත.

**<u>2.4 ප්‍රමාණවත් අධිකාරී බලයෙන් තහවුරු නොවු ගණුදෙනු</u>**

අධ්‍යක්ෂකවරයන්ට නිළ වාහන අනුයුක්ත කිරීම සඳහා කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇති අතර එම අනුමැතිය ලැබෙන තෙක් අමාත්‍යාංශ ලේකම්වරයා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 22.99 ට අනුව නිල ප්‍රවාහන පහසුකම් ලබා දීම අනුමත කර ඇත.
2014/.3/07 පවත්වන ලද Cope කමිටුවේදී මේ සඳහා රාජ්‍ය පරිපාලන ලේකම්තුමාගේ අනුමැතිය ලබා ගැනීම ප්‍රමාණවත් බව දන්වා ඇති අතර ඒ අනුව එම අනුමැතිය ලබා ගැනීම සඳහා අමාත්‍යාංශයට ඉල්ලීම ඉදිරිපත් කර ඇත.

## 3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵලය

2012 වසර හා සසඳන කළ භාණ්ඩාගාරයෙන් ලද ප්‍රතිපාදන වැඩි වීම 4.6% ක් වන අතර, වියදම් වැඩිවීමේ ප්‍රතිශතය 12% ක් වීම මෙයට බලපෑ මූලික හේතුවයි.

## 4 මෙහෙයුම් සමාලෝචන

### 4.1 කාර්යය සාධනය

**(අ)** එනම් පාඨමාලා ප්‍රතීතනයට ලබා දීමට අපේක්ෂාකල උපකරණ ප්‍රමාණයට වඩා වැඩි උපකරණ ප්‍රමාණයක් එක් එක් පාඨමාලා සඳහා ලබා දීමට සිදුවීමෙන් පාඨමාලා 2ක් සඳහා මූල්‍යාධාර ලබා දිමට වෙන්කල මුදල ප්‍රමාණවත් නොවීම හේතුවෙන් එම පාඨමාලා 2ට මූල්‍යාධාර දීම 2013 වසරේ අත්හරින ලදී.

ඇස්තමේන්තු ආයතන 08 සඳහා මූල්‍යාධාර ලබාදීමට නොහැකි වූයේ පහත සඳහන් හේතූන් මත බව දන්වා සිටිමි.

පාඨමාලා 2ක් සඳහා අදාල ආයතනයට උපකරණ ආනයනය කර ලබා ගැනිම අපේක්ෂාවෙන් ගිවිසුම් අත්සන් කරන ලද නමුදු එම උපකරණ ආනයනය නිසිලෙස අදාල ආයතන සිදු නොකිරීම නිසා මේ වන විට ඔවුන් වෙත මූල්‍යාධාර ලබා දීම අත්හැර ඇත.

මූල්‍යාධාර ලබා දීම සඳහා කොමිෂන් සභාව හා ආයතන 4ක් අතර වූ එකඟතාව මත ප්‍රතීතනයට අවශ්‍ය මූලික නිර්ණායක ගිවිසුම් ගත විට පෙර සම්පූර්ණ කරන බව ආයතන ප්‍රකාශ කරන ලදී.ඒ අනුව මූල්‍යාධාර ලබා දීමට කොමිෂන් සභාව ක්‍රියා කලත් එම ආයතන විසින් එකඟතාවයන් අනුව අදාල ප්‍රතීතන නිර්ණායක සම්පූර්ණ නොකිරීම නිසා ඔවුන් සමග ගිවිසුම් අත්සන් නොකරන ලදී.මේ හේතුව නිසා නැවත පාඨමාලා 6ක් තෝරා ගැනීම සඳහා 2013 වසරේ ප්‍රමාණවත් කාලයක් නොවිය.එම නිසා තවත් පාඨමාලා 6ක් සඳහා මූල්‍යාධාර ලබා දිමට නොහැකි විය.

පාඨමාලා 7ට මූල්‍යාධාර ලබා දුන් නමුත් ඉතිරි වූ මුදල වන රු.65,000 තවත් එක් පාඨමාලාවක් වෙත උපකරණ ලබා දීමට ප්‍රමාණවත් නොවීම නිසා එක් පාඨමාලාවකට මූල්‍ය ආධාර ලබා දීම 2013 වසරේ අත්හරින ලදී.

එක් පර්යේෂණයක් සඳහා,එනම් "විද්‍යුත් මාධ්‍ය උපයෝගී කරගෙන වෘත්තීය පුහුණු ආයතනවල තත්ත්ව විගණනය සිදුකිරීමේ හැකියාව මැන බැලීම පිළිබඳ අධ්‍යයනය" සඳහා අනුමැතිය ලබාදුන්නේ අදියර 2ක් යටතේ ක්‍රියාත්මක කිරීමටයි.

එනම් දැනට පවතින කළමණාකරණ තොරතුරු පද්ධතිය (MISහි) ක්‍රියාකාරීත්වයේ කාර්යක්ෂමතාව පළමු අදියර යටතේ අධ්‍යයනය කර එය සාර්ථක නම් පමණක් විද්‍යුත් මාධ්‍ය උපයෝගී කරගෙන තත්ත්ව විගණනය කිරිමේ හැකියාව මැන බැලීමයි.එහි සාර්ථකතාවය මත මෙම පර්යේෂණ සිදු කිරීමේ අපේක්ෂාවෙන් මෙය අත්හිටුවන ලදී.

(ආ) කර්මාන්ත ක්ෂේත්‍ර සඳහා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම්(Vet Plan) සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ ප්‍රවාහන හා ප්‍රවර්ධන අංශය (Transport & Logistic Sector) සඳහා Vet Plan සෑදීම මොරටුව විශ්ව විද්‍යාලයට අනුබද්ධිත "යුනිකන්සල්ටන්සි සර්විසස්" ආයතනය මගින් සිදුකරයි.

අත්‍යාවශ්‍ය දත්ත ලබාගැනීමේදී ඇතිවූ අපහසුතා නිසා යුනිකන්සල්ටන්සි සර්විසස් ආයතනය කෙටුම්පත් වාර්තාව ඉදිරිපත් කිරීමට 2013.12.31 දක්වා කල් ලබාදෙන ලෙස ලිඛිතව ඉල්ලීමක් කරන ලදී.
ඒ සඳහා කාලය ලබා දීම මත මෙය 2013 වසර තුල අවසන් නොවීය. කෙසේ නමුදු මෙම වැඩසටහනේ ප්‍රගතිය සොයා බැලීම අප කොමිෂන් සභාව විසින් නොකඩවා සිදුකල අතර එහි පළමු කෙටුම්පත් වාර්තාව 2014 ජනවාරි මස 09 වන දින කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලදී.
එම කෙටුම්පත් වාර්තාව පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා රැස්වීම් තුනක් 2014.01.13, 2014.01.28 සහ 2014.02.10 පවත්වා ඇති අතර එම වාර්තාවේ වැඩිදුරටත් සංවර්ධනය විය යුතු කොටස් තිබූ බැවින් අවසන් ඇගයීමේ රැස්වීම 2014 ජූනි මස දෙවන සතියේ පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇත.

(ඇ) පළාත් වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම් සම්බන්ධීකරණ වැඩමුළු දැනට එම සැලසුම් සංවර්ධනය කර ඇති පළාත්වල ප්‍රධාන ලේකම්වරුන්ගේ ප්‍රධානත්වයෙන් පිහිටුවා ඇති මෙහෙයුම් කමිටු මගින් සිදුකරයි.
දකුණු පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම් හා මෙහෙයුම්) විසින් දකුණු පළාත් වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ සැලසුමක් අප වෙත 2013.04.04 දින එවන ලදී.එමෙන්ම 2014.02.20 දින අප ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් දකුණු පළාත් ප්‍රධාන ලේකම්තුමා සමඟ රැස්වීමක්පවත්වන ලදී.
තවත් වෘත්තීය අධ්‍යාපන හා පුහුණු සැලසුම් සම්බන්ධීකරණ රැස්වීමක් අධ්‍යක් ජනරාල් විසින් 2014 මාර්තු මස නැගෙනහිර පළාත් ප්‍රධාන ලේකම්තුමා සමඟ පවත්වන ලදී.

(ඈ) නව ඇගයීම්කරුවන් සඳහා බලපත්‍ර 150ක් නිකුත් කිරීම ද නිපුණතා පාදක ඇගයීම් වල සංගතතාවය තහවුරු කිරීමේ විගණනයන් 10 ද ඒ සඳහා වූ වැඩමුළු 3ක් පැවැත්වීමට නොහැකිවූයේ ඒ සඳහා වෙන්ව සිටි කාර්ය මණ්ඩලය සඳහා ක්‍රියාකාරි සැලැස්මට ඇතුලත්ව නොතිබූ කාර්යයන් ප්‍රමාණයක් ඉටු කිරීමට සිදුවීමෙනි. එනම් 2013/06/27 දින පැවති අන්තර් ආයතනික මෙහෙයුම් කමිටු රැස්වීමේ දි ගත් තීරණයක් වූයේ සියළු තාක්‍ෂණ විද්‍යාල,කාර්මික විද්‍යාල හා පුහුණු මධ්‍යස්ථාන වලදී සිදු කරන ඇගයීම් සඳහා සියළු ඇගයීම් කටයුතු සඳහා ඇගයීම්කරුවන් පත් කිරීම හා එම ඇගයීම් කටයුතු නියාමනය කිරීම අප කොමිෂම වෙත පවරන ලදී.ඒ අනුව පුද්ගලික අංශයේ පමණක් ඇගයීම් 408 නියාමනයට සැලසුම් කර තිබුණද රාජ්‍ය අංශයේ ආයතනද නියාමනය සිදු වීමෙන් ඉහත තීරණය මත ඇගයීම් නියාමන 1034 ක් ඉටුකර ඇත.ඒ අනුව ඉහතින් සඳහන් කල කාර්යය වල ක්‍රියාකාරී සැලැස්මේ සඳහන්ව තිබූ ඉලක්ක සපුරා ගැනීමට අපොහොසත්විය.

මෙම ව්‍යාපෘතිය බාහිර විශේෂඥ උපදේශකවරයෙකු යොදවා කල යුතු විශේෂ කාරණාවක් ලෙස අපගේ වාර්ෂික වැඩ සටහනට ඇතුලු කරන ලදී. එම ව්‍යාපෘතිය සඳහා විශේෂඥ උපදේශකවරයෙකු ලබා ගැනීම සඳහා අවස්ථා කිහිපයකදී උත්සහා කල නමුත් අප වෙන් කල තිබූ මුදල් ප්‍රමාණය අනුව මෙම ව්‍යාපෘතියෙහි ක්‍රියා කිරීමට යොදා ගන්නා ලද විශේෂඥ උපදේශකවරුන් එකග නොවූ බැවින් මෙම කාරණය ඉටු කර ගැනීමට නොහැකි විය.

පාඨමාලා ප්‍රතීතනය ඇගයීම් කිරීම සඳහා අදාළ ආයතන වලින් අයදුම්පත්ද සමඟ පාඨමාලා 127 ක් 2013 වසරේ ප්‍රතීතනය අළුත් කළ යුතු වුවත් මෙසේ අයදුම්පත් එවා නොතිබූ හා ඇගයීම් ගාස්තු ගෙවා නොතිබූ රාජ්‍ය අංශයේ පාඨමාලා 16ක් සහ පෞද්ගලික අංශයේ පාඨමාලා 14 ක් ඇගයීමට භාජනය කරන ලදී.

4.2 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

(අ) රාජ්‍ය අංශයේ පුහුණු ආයතන 2කට ලබා දුන් 528,702ක මුදල සඳහා මිලදී ගැනීම් සිදු කර 2013.12.26 වන දින බිල්පත් ඉදිරිපත් කර ඇත.

කාර්මික පුහුණු ආයතන 03කට ලබා දුන් මිලදී ගැනීම් 358,540ක් සඳහා 2013.12.31 වන දින මිලදී ගැනීම් සම්පූර්ණ කර 2014.02.24 වන දින බිල්පත් ඉදිරිපත් කර ඇත.එසේම වයඹ පළාත් සභාවෙන් ලබා දුන් මුදල සඳහා මිලදි ගැනීම් සිදු කර භාණ්ඩ මිලදී ගෙන 2012.12.18 වන දින බිල්පත් ඉදිරිපත් කර ඇත.

ඒ අනුව එම වියදම් වැය කර ඇති බව පැහැදිලි වේ.

(ආ) (i), (ii) පුවත් මඟින් සොයා බැලීම හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලියාපදිංචි නොවූ ආයතන සොයා බලා වාර්තා කරන ලෙස ලිඛිතව දන්වා ඇත.ඒ අනුව ලැබෙන විස්තර අනුව එම ආයතන දැනුවත් කර ලියාපදිංචිය සඳහා උපදෙස් දෙනු ලැබේ. ප්‍රමිතියෙන් තොරව පවත්වාගෙන යනු ලබන පුහුණු ආයතන වලට එරෙහිව නඩු පැවරිය යුත්තේ කුමන අධිකරණයේ ද යන්න පනතෙහි පැහැදිලිව සඳහන් කර නොමැති බැවින් අදාළ ආයතන වලට එරෙහි නීතිමය පියවර ගැනීමට හෝ තහනම් කිරීමට පනතෙහි බලතල නොමැත.
ඒ අනුව දැනට පනත සංශෝධනය කරමින් පවතී.ආයතන ලියාපදිංචිය අළුත් කිරීම පිළිබඳව ආයතන දැනුවත් කර ලිපි සහ සිහි කැවීම් ලිපි යවනු ලැබේ.එමෙන්ම යම් ආයතනයක් නිසි කාලයතුළ දී ලියාපදිංචිය අළුත් නොකළහොත් ඔවුන්ගේ ප්‍රමාදය සඳහා දඩ මුදල් අයකරනු ලැබේ.

(ii)

ලියාපදිංචි නොවී පවත්වාගෙන යන ආයතන හඳුනාගත් පසු එම ආයතන ලියාපදිංචි කරන ලෙස දන්වා ලිපි යවන ලද අතර ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ දැනුවත් කර ඇත.එසේ දැනුවත් කලද ලියාපදිංචි නොකළ ආයතන වලට එරෙහිව නීත්‍යානුකූලව ක්‍රියා කිරීමට පනතෙහි බලතල තිබුණද , එය කුමන අධිකරණය හරහා සිදුකළ යුතුද යන්න සඳහන් කර නොමැති නිසා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට අපහසුය. මේ පිළිබඳව නීතිපති දෙපාර්තමේන්තුව මඟින් එවා ඇති E/03/2012,2012.03.06 දිනැති ලිපියෙහි පැහැදිලිව දක්වා ඇත.පිටපත අමුණා ඇත.

(ඇ) 2013 මැයි 30දින වන විට තේ නිශ්පාදන තාක්ෂණය සහ විලේපන වේදය යන පාඨමාලා සඳහා ජාතික නිපුණතා සම්මත සැකසීමට සැලසුම් කළ ද ඊට අමතර එම පාඨමාලාවට අදාල විෂය මාලා දෙක ද ඇගයීම් ලේඛන දෙක ද සැකසිම නිසා 2013 අගෝස්තු 1සහ 2013 ඔක්තෝම්බර් 14 දක්වා ජාතික නිපුණතා සැකසීම ප්‍රමාද විය.

(ඈ) (i) පර්යේෂණ 10න් 09ක් නිසි ලෙස ක්‍රියාත්මක කරන ලදී.එක් පර්යේෂණයක් ක්‍රියාත්මක නොකළේ EMIS පද්ධතිය ක්‍රියාත්මක වනතුරු අදාල පර්යේෂණ අත්හිටුවීමට ගත් ක්‍රියාමාර්ග නිසාය.

(ii) ඉදිරි වර්ෂයේ ඔබගේ නිරීක්ෂණ අනුව කටයුතු කරමි.

(iii) පර්යේෂණ අන්තර්ගතය හා අපේක්ෂිත ඉලක්කයන්හි ප්‍රමාණවත් බව අනුව ඒ පිළිබඳ විශේෂඥ දැනුම හා කුසලතාවය ඇති අය වෙත අදාළ පර්යේෂණ සිදු කිරීමට ලබා දී ඇත.

(ඉ) (i),(ii)

මෙහිදී අදාල ආයතන මඟින් දෙන ලද අත්තිකාරම් පියවීම දින තුනකට වඩා ප්‍රමාද කලද එම අත්තිකාරම් උපයෝගී කරගෙන මිලදීගත් භාණ්ඩවල මුල්පිටපත් එම භාණ්ඩ ගබඩාවලට භාර ගැනීමේ නිවේදන පත්‍ර එසේම ඇනවුම් පත්‍ර යනාදීය පියවීම වවුචර් සමඟ ඉදිරිපත් කර ඇත.

ජාතික තරුණ සේවා සභාව 2014.05.06 දින මෙම අත්තිකාරම පියවා ඇත.

ලබාදුන් අත්තිකාරම් භාවිතා කර නිපුණතා තරඟය සඳහා ලබාගත් උපකරණ හා අමුද්‍රව්‍ය එම ආයතනවල තොග ලේඛනවල ඇතුලත් කර ඇත.

අත්තිකාරම් පියවීම සඳහා ඉදිරිපත් කල පියවීම් වවුචර් පතට එම ලේඛන වල පිටපත් අමුණා ඇත.මෙම ආයතන විසින් තරඟ පැවැත්වූ බැවින් තරග භාවිතයට ලබාගත් උපකරණ එම ආයතනවල උපකරණ බැවින් ඔවුන් භාරයේම තිබුණි. එබැවින් නැවත භාරදීමේ අවශ්‍යතාවයක් පැන නොනැගිනි.

ලබා දුන් සියළු අත්තිකාරම් මේ වන විට පියවා ඇත.

(iii) ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය මගින් 2014.03.19.දින ඉදිරිපත් කල වියදම් පියවීම් වාර්තාවලට අනුව මුළු වියදම රු.1170349.83 කී.ඒ අනුව එම ආයතනය විසින් වැඩිපුර දරා ඇති වියදම රු. 170349.83 ක් වන අතර එම මුදල කොමිෂන් සභාව මගින් 2014.04.29 දින ගෙවා ඇත.

මුළු වියදම ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය මගින් පියවා ඇත.

(iv) නිපුණතා තරගාවලිය සංවිධානය කිරීමේදී සෑම මධ්‍යස්ථානයකට තෘතියික වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව නියෝජනය කරමින් නිලධාරීන් සහභාගි වන ලදී.මේ අනුව තරගාවලියට අදාලව මිලදී ගනු ලැබූ සියලු උපකරණ එම නිලධාරීන්ගේ හා විනිශ්චය කමිටුවේ අධීක්ෂණයට භාජනයට ලක් කිරීමෙන් අනතුරුව තරගාවලියේ කටයුතු සඳහා උපයෝගී කරගත් බව සඳහන් කරමි.

මෙම තරග පැවත්වීම සඳහා ලබාගත යුතු සියලුම උපකරණ හෝ අමුද්‍රව්‍ය නොමැතිව තරග පැවත්වීමේ හැකියාවක් නොමැත.

ඒ අනුව එම සියලු අමුද්‍රව්‍ය හා පුහුණු උපකරණ විනිශ්චයකරුවන් සහ අධිකරණ නිලධාරීන් විසින් සහතික කිරීමෙන් පසු තරග පැවත්වීම සිදුකරන ලදී. ඒ අනුව නිසිපරිදි තරගය සඳහා එම භාණ්ඩ ලැබී ඇති බව සහතික වේ.

තරඟය පැවැත්වීම සඳහා අවශ්‍යය ද්‍රව්‍ය නිසි පරිදි තිබිය යුතු බැවින් එම ද්‍රව්‍ය භෞතිකව තිබෙන බව ඔහුගේ සහතිකයෙන් පසු තරඟ පැවැත්වීම සිදු කර ඇත.

4.3 **නිෂ්කාර්යය වත්කම්**

078-1001-12268324 ගිනුමෙහි දෙසැම්බර් 31 වන දිනට රු. 2,855,870 ක ශේෂයක් හා වර්ෂය පුරා මිලියන දෙකකට ආසන්න ශේෂයක් පැවතීමට හේතුව විදේශ ව්‍යාපෘතිමගින් ලද මුදල් සහ නිපුණතා සම්මත හා විෂයමාලා සකස් කිරීමට අදාල වැඩමුලු පැවත්වීමට ද ,Touch Your Future වැඩසටහනට අදාල වියදම් දැරීමට අමාත්‍යංශය මගින් ලබාදුන් මුදල් ගිණුමට බැර කර තිබීමයි.මෙහිදී මෙම මුදල් ආයෝජන කර නොතිබීමට හේතුව වූයේ Touch Your Future වැඩ සටහන සඳහා මසක් තුළ අවශ්‍ය වන මුදල් ප්‍රමානය රු.මිලියන 2 ක් පමණ වන නිසයි.

4.4. **කාර්යය මණ්ඩල පරිපාලනය**

(අ) මේ වන විට කාර්යය මණ්ඩලෙයෙන් 77 දෙනෙක් බඳවා ගෙන ඇති අතර පුස්තකාල සහකාර සහ භාෂා පරිවර්ථක තනතුරු සඳහා සම්මුඛ පරීක්ෂණ අවස්ථා 2 කදී පැවැත් වූවත් අදාල අයදුම්කරුවන්ට ප්‍රමාණවත් සුදුසුකම් නොමැති වීමෙන් බඳවා ගැනීමට නොහැකි විය.

(ආ) මෙහි අධ්‍යක්‍ෂකවරයා හැර අනිකුත් නිළධාරීන් 4 දෙනාම බඳවා ගෙන ඇති අතර ඇගයීම් අංශයට දැනට අනුයුක්ත කර ඇත.

**5 <u>ගිණුම් කටයුතුභාවය සහ යහ පාලනය</u>**

**5.1 සංයුක්ත සැලැස්ම**

ඉදිරියේදී විමසුමේ ඇති පරිදි කටයුතු කිරීමට සටහන් කර ගනිමි.

**5.2 අයවැය ලේඛන පාලනය**

ඉදිරියේදී හැකි පමණ විචලනයන් ඇති නොවන ආකාරයටඅයවැය පාලනයන් සිදු කිරීමට කටයුතු කරමි.

**<u>6. පද්ධති හා පාලන</u>**
(අ), (ආ), (ඇ),(ඈ)

සියළු පද්ධතියන් පරිපාලනය සඳහා ක්‍රමවේදයන් සකසා ඇති අතර ඒවා ක්‍රියාත්මක කිරීමට අධ්‍යක්‍ෂවරුන්ට උපදෙස් දී ඇත.
පද්ධතියේ දුර්වලතා හඳුනාගත් අවස්ථාවලදී එම පද්ධති පාලන සංවර්ධනය කිරීමට ක්‍රියා කරමි.



**ආචාර්ය එස්.ඩී.ආර්. පෙරේරා**
අධ්‍යක්‍ෂ ජනරාල්

පිටපත් : ලේකම්, යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය- දැ.ගැ